# දෙවැනි කොටස

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පටුන


| | | | |
|---|---|---|---|
| ස්වර්ණ ජයන්තිය සැමරීම | ... | ... | (I) |
| මහ බැංකුව නවීකරණය කිරීම | ... | ... | (II) |
| ගිණුම් සහ බැංකු ක්‍රියාකාරිත්වය | ... | ... | (IV) |
| ව්‍යවහාර මුදල් | ... | ... | (XIII) |
| බැංකු අධීක්ෂණ | ... | ... | (XIV) |
| බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | ... | ... | (XVII) |
| සංවර්ධන මුදල් | ... | ... | (XIX) |
| ග්‍රාමීය ණය | ... | ... | (XXIII) |
| මූල්‍ය වෙළෙඳපොල | ... | ... | (XXXIV) |
| පර්යේෂණ කටයුතු | ... | ... | (XXXVI) |
| සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ | ... | ... | (XXXVIII) |
| සේවක අර්ථසාධක අරමුදල | ... | ... | (XLI) |
| විනිමය පාලන | ... | ... | (XLII) |
| රාජ්‍ය ණය | ... | ... | (XLV) |
| බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය | ... | ... | (L) |
| ලේකම් දෙපාර්තමේන්තුව | ... | ... | (LIII) |
| නීති | ... | ... | (LIII) |
| පරිශ්‍ර | ... | ... | (LIII) |
| නව ගොඩනැගිලි | ... | ... | (LIII) |
| ආරක්ෂක සේවා | ... | ... | (LIV) |
| ප්‍රවෘත්ති | ... | ... | (LIV) |
| තොරතුරු තාක්ෂණ | ... | ... | (LV) |
| කළමනාකාරිත්ව විගණන | ... | ... | (LVI) |
| පුහුණු වැඩ කටයුතු | ... | ... | (LVII) |
| සුභසාධන | ... | ... | (LVIII) |
| කාර්ය මණ්ඩල පුවත් | ... | ... | (LVIII) |

# ස්වර්ණ ජයන්තිය සැමරීම

1950 අගෝස්තු මස 28 වෙනි දින පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව එහි ස්වර්ණ ජයන්තිය අගෝස්තු මස 27 දින සමරනු ලැබීය. පනස් වසරක සේවා කාලය ඉමහත් උත්සවශ්‍රීයෙන් සැමරිය යුතු වුවත්, රට තුළ දනට පවතින වාතාවරණය සැලකිල්ලට ගෙන එය ඉතා චාම් උත්සවයක් ලෙස පැවැත්විණ.

මෙම අවස්ථාව සිහිපත් කිරීම සඳහා වූ ආගමික උත්සව වලින් අනතුරුව, උත්සවයේ මුලික අංගය ලෙස සලකනු ලැබුවේ බැංකුවේ නව මුලස්ථාන ගොඩනැගිල්ල නිල වශයෙන් විවෘත කිරීමය. මෙය බැංකුව විසින් මුහුණ දුන් විශාලතම ව්‍යසනයෙන් පසුව යළි පුනර්ජීවනය වීමේ සංකේතයක් වූ අතර එම ව්‍යසනයෙන් විපතට පත් වූ සේවකයින් සඳහා උපහාරයක් ද විය. අතිගරු ජනාධිපතිතුමියට පෞද්ගලිකව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයට සහභාගිවීමට නොහැකි වුවත්, එතුමියගේ සමාරම්භක කථාව නවීන චන්ද්‍රිකා තාක්‍ෂණය භාවිතයෙන් සිදු කරන ලදී. මුදල් නියෝජ්‍ය ඇමති වශයෙන් ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා විසින් මෙම අවස්ථාව සැමරීම පිණිස ඉදිකරන ලද විවෘත කිරීමේ ඵලකය නිරාවරණය කරන ලදී. එංගලන්ත මහ බැංකුවේ අධිපති වූ ශ්‍රීමත් එඩ්වර්ඩ් ජෝර්ජ් මහතා සමාරම්භක උත්සවයේ විශේෂ අමුත්තා සහ කථිකයා වශයෙන් සහභාගි විය.

දේශීය මෙන්ම විදේශීය විශේෂ ආරාධිත අමුත්තන් රැසක සහභාගිත්වයෙන් විවෘත කිරීමේ උත්සවය පැවැත්විණ. විශේෂ ආරාධිත අමුත්තන් වූයේ අග්නිදිග ආසියා, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය යන රටවල මහ බැංකු සංවිධානයේ අධිපතිවරුන් හා ඔවුන්ගේ නියෝජිතයන්, විදේශීය තානාපතිවරුන්, මහ බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, මුදල් මණ්ඩල සාමාජිකයන් සහ බැංකුවේ සේවා නියුක්තිකයන්ය. උත්සවයේ ප්‍රධාන ලක්‍ෂණය වූයේ ප්‍රථම වරට මහ බැංකු ගීතය වාදනය කිරීමත්, ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් විශාරද ප්‍රදීප් රත්නායක විසින් ඉදිරිපත් කළ, විචාරක පැසසුමට ලක් වූ ඉන්ද්‍රබිලය නම් වූ විශේෂ සංගීතමය නිර්මාණයන්ය. එයට අමතරව, තැපැල් දෙපාර්තමේන්තුව විසින් විශේෂ මුද්දරයක් හා මුල්දින කවරයක් නිකුත් කළ අතර, බැංකුව විසින් සමරු කාසියක් සහ " ශ්‍රී ලංකාවේ කාසි හා නෝට්ටුවල ඉතිහාසය " යන මැයෙන් ප්‍රකාශනයක් ද නිකුත් කරන ලදී.

මෙදින උත්සව වැඩ කටයුතු නිම කරන ලද්දේ සියෙන්සා අධිපතිවරුන්, බැංකු ක්‍ෂේත්‍රයේ සාමාජිකයින් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සේවක නියෝජිතයින් වෙනුවෙනු පවත්වන ලද රාත්‍රී භෝජන සංග්‍රහයකිනි. එහිදී නැසීගිය මහචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කොට අධ්‍යක්‍ෂණය කරන ලද මනමේ ශෛලීගත නාටකයේ උපුටාගත් කොටස් වේදිකා ගත කරනු ලැබිණි.

විවෘත කිරීමේ උත්සවයේදී දේශකයන් කීප දෙනෙකු සඳහන් කළ පරිදි මහ බැංකුව, ශ්‍රී ලංකාවටත් එහි ජනතාවටත් වසර 50 ක් පුරා විශාල සේවාවක් ඉටුකර ඇත. මෙම ස්වර්ණ ජයන්ති සැමරුම එය පිළිබිඹු කරන අතර, ඉදිරි වසර ගණනාවක සේවයේ ආරම්භය සනිටුහන් කරයි.

# මහබැංකුව නවීකරණය කිරීම

වඩාත් කාර්යක්ෂම, වෘත්තීයමය සහ සංයුක්ත සංවිධානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් මහ බැංකුව නවීකරණය කිරීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. ගෝලීයකරණයේ ප්‍රවර්ධනය, ආර්ථික ප්‍රතිපත්තියේ නව චින්තනය මෙන්ම වෙනස්වන ලෝකයත් සමඟ මහ බැංකුවල කාර්යභාරය වෙනස්වීම යන සාධක හා පැන නැගුණු අභියෝගයන්ට මුහුණදීම පිණිස නවීකරණ වැඩසටහනක අවශ්‍යතාවය ඉස්මතු විය.

වර්තමාන ප්‍රතිපත්ති හා කාර්ය ක්‍රියාපටිපාටිය විමර්ශණය කිරීම සඳහා සංවිධානය කරන ලද "කතිකාවත" සමඟ මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ විය. " නව සහස්‍රයට මහ බැංකුව ප්‍රවිෂ්ට වීම " යන මැයෙන් 2000 වර්ෂයේ ජූලි මස 8 හා 9 යන දෙදින තුළ මෙම කතිකාවත මහ බැංකුවේදී පැවැත්විණ. මෙම කතිකාවත තුළදී පහත සඳහන් විෂයයන් යටතේ එයට සහභාගි වූ කණ්ඩායම් හය විසින් යෝජනා ඉදිරිපත් කරනු ලැබීය.

- මහ බැංකුව වෙනස්විය යුත්තේ මන්ද?
- මහ බැංකුවේ අරමුණු පිළිබඳව යළි සලකා බැලීම
- ප්‍රමුඛතාකරණය කළ අරමුණු ළඟාකර ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය
- නව අරමුණු ළඟාකර ගැනීමේදී අවශ්‍යවන නව කුසලතාවයන් හා දිරිගැන්වීම්
- මහ බැංකුව නවීකරණ කටයුතු ක්‍රියාකාරී ලෙස සිදුකළ යුත්තේ කෙසේද?
- නවීකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් කවරේද?

නියාමක කමිටුවක් විසින් " කතිකාවත " සංවිධානය කරන ලද අතර ඒ සඳහා හැට දෙනෙකුට වැඩි පිරිසක් සහභාගි වූහ. කාර්ය මණ්ඩලයේ පුළුල් පැතිකඩක් නියෝජනය කළ මෙම සේවානියුක්තිකයන්ට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ පුළුල් වශයෙන් අදහස් හුවමාරු කරගැනීමට හා සාකච්ඡා කරගැනීමට මෙම සාමූහික ක්‍රියාවලිය අවස්ථාවක් උදාකරදුනි.

" කතිකාවත " මගින් මහ බැංකුව තුළ සිදුවිය යුතු වෙනස්කම්වල වැදගත්කම අවධාරණය කළ අතර, එම වෙනස්කම් අත්‍යවශ්‍යවන මූලික ක්ෂේත්‍රයන් කිහිපයක් හඳුනාගනු ලැබිණ. ඒ යටතට මහ බැංකු අරමුණු ප්‍රමුඛතාකරණය සහ පැහැදිලි කිරීම, සංවිධාන ව්‍යුහය, කළමනාකරණ ක්‍රියාවලිය හා මානව සම්පත් කළමනාකරණය යනාදිය අඩංගු විය.

නවීකරණ වැඩසටහන හා අදාළ කාර්යයන් මහ බැංකු නවීකරණය පිළිබඳ ස්ථාවර නියාමක කමිටුවකට පවරන ලදී. නවීකරණ වැඩ සටහන් අරමුණු හා නියාමක කමිටුව විසින් විමර්ශනය කිරීමට නියමිත කෙරුණු කාර්යභාරය පහත දක්වෙන ලෙස සඳහන් කළ හැකිය.

1. මිල ස්ථායිතාව සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය යන හඳුනාගත් මූලික අරමුණු වෙත මහ බැංකුව යළි යොමු කිරීම. මෙහිදී මහ බැංකුවේ සෙසු අරමුණු විමර්ශනය කරනු ලබන අතර එම ක්ෂේත්‍රයන්හි මහ බැංකුවේ කාර්යභාරය ප්‍රති ඇගයීමකටද ලක් කරනු ඇත.
2. මහ බැංකුවේ මූලික කාර්යයන් ඉලක්ක කොටගත් කාර්යක්ෂම කාර්ය සංවිධාන ව්‍යුහයක් ගොඩ නැගීම. මහ බැංකුවට තම මූලික කාර්යයන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට ආධාරක සේවාවන් සැපයීම වැදගත් වේ.
3. වේගවත්ව හා ඉතා කෙටි කාලයකදී තොරතුරු වාර්තා කිරීම, සේවා නියුක්තිකයන්ගේ නිර්මාණශීලිත්වය ප්‍රවර්ධනය කිරීම, කාර්ය පටිපාටියේදී පුළුල් සහභාගිත්වය, පුළුල් මට්ටමේ වගකිවයුතු බව හා අයිතිය පිළිබඳ හැඟීම් ඇති කිරීම හා නායකත්ව කුසලතා ඇතිකිරීම වැනි කාර්යයන් වඩා පහසුකරවන පරිදි කළමනාකරණ සංස්කෘතියක් හා ක්‍රියා පිළිවෙත් ගොඩනැගීම.
4. මානව සම්පත් කුසලතාවන්හි වැදගත්කම පිළිගනු ලබන, මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම; බඳවා ගැනීම්, වැටුප් හා ප්‍රතිලාභ ගෙවීම්, කාර්ය සාධන ඇගයීම්, උසස්වීම් හා පුහුණු කිරීම් වැනි සියළු මානව සම්පත් කාර්යයන් ප්‍රතිනිර්මාණය කිරීම මෙයට ඇතුලත් වේ.

පහත දක්වෙන ක්ෂේත්‍රයන් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පිණිස බැංකුවේ සියළුම මට්ටම් නියෝජනය වන පරිදි කාර්ය මණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විත ඉලක්ක කණ්ඩායම් 5 ක් නියාමක කමිටුව විසින් පත් කරන ලදී.

(අ) නූතන යුගයේ මහ බැංකුවක ක්‍රියාකාරිත්වයට සරිලන පරිදි මහ බැංකුවේ අරමුණු ප්‍රතිනිර්ණය කිරීම.

(ආ) මහ බැංකුවට සිය කාර්යයන් වඩා කාර්යක්ෂම ලෙස සිදුකර ගෙන යාමට හැකිවන පරිදි යෝග්‍ය සංවිධානාත්මක ව්‍යුහයක් නිරණය කිරීම.

(ඈ) බැංකුවේ කළමනාකරණ ක්‍රියාවලිය පරීක්ෂාකිරීම හා කාර්යක්ෂමතාවය සහ පිරිවැය ප්‍රතිලාභිත්වය ළඟාකර ගත හැකි වන පරිදි එම ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීම.

(ඈ) කාර්යමණ්ඩල කුසලතාවයන් අඛණ්ඩව ඉහළ නංවන හා ඵලදායිතාවය ප්‍රවර්ධනය කරනු ලබන කුසලතා පදනම් කොටගත් නව මානව සම්පත් කළමනාකරණ ක්‍රමයක් සකස් කිරීම.

(ඉ) නවීකරණ ක්‍රියාවලිය තුළින් කාර්ය මණ්ඩලය අතර එකඟතාවයන් ගොඩනැගීම සඳහා යෝග්‍ය ක්‍රමෝපායන් දියුණු කිරීම.

ඉලක්ක කණ්ඩායම් ඔවුන්ගේ වාර්තාවන් නියමිත කාලය තුළදී සම්පූර්ණ කරන ලදී. ඒ අනුව නියාමක කමිටුව විසින් මූලික යෝජනාමාලාවක් සකස් කළ අතර, මහ බැංකුව නවීකරණය කිරීමේ" ක්‍රියාකාරී සැලැස්මක් " ද සම්පාදනය කරන ලදී. දැනට මෙහි ප්‍රථම අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. ක්‍රියාකාරී සැලැස්මේ විවිධ අදියරයන් වන කාර්ය මණ්ඩල අවශ්‍යතා, වාර්තා නිසිලෙස පවත්වා ගැනීම, විවිධ කමිටු, බලය බෙදහැරීම, රාජ්‍ය ණය කළමණාකරණය, තොරතුරු තාක්ෂණය, සහ දෙපාර්තමේන්තු ප්‍රතිසංවිධානය කිරීම වැනි කාර්යයන් විමර්ශණය කිරීම සඳහා කාර්ය සාධක බලකායයන් කිහිපයක්ද පත් කොට ඇත.

නවීකරණ ක්‍රියාවලියට ලෝක බැංකුව හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය පහසුකම් සපයනු ලබයි.

# ගිණුම් සහ බැංකු ක්‍රියාකාරිත්වය

## 1. ගිණුම් සහ ගණකාධිකරණ ප්‍රතිපත්ති

### (අ) ගිණුම්

#### (i) වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 8.3 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2000 වසර අගදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වත්කම්/බැරකම් රුපියල් දශ ලක්ෂ 217,191 ක් විය. වත්කම්හි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජයට සපයන ලද ණය සහ අත්තිකාරම්වල වැඩි වීම සහ බැංකුව විසින් දරන ලද රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් ප්‍රමාණයෙහි වැඩි වීමත්ය. මේ අතර මුළු වත්කම්හි ජාත්‍යන්තර සංචිතයෙහි දායකත්වය 1999 දී සියයට 54.0 සිට වසර 2000 දී සියයට 35.5 දක්වා අඩු විය. ජාත්‍යන්තර සංචිතයෙහි වූ මෙම අඩු වීමට විදේශීය රාජ්‍ය ණය ආපසු ගෙවීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කරන ලද ගෙවීම් සහ වාණිජ බැංකුවලට කරන ලද ශුද්ධ විදේශ විනිමය විකුණුම් ප්‍රධාන වශයෙන් හේතු විය.

බැංකුවේ දේශීය වත්කම් ප්‍රමාණය 1999 අගදී වූ රුපියල් දශ ලක්ෂ 62,598 සිට වසර 2000 අග වනවිට රුපියල් දශ ලක්ෂ 107,914 දක්වා සියයට 72.4 ක සැළකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන්ම වසර අගදී මූල්‍ය වෙළඳපොලෙහි වූ ඌන-ද්‍රවශීලතාවය මග හැරවීම පිණිස මහ බැංකු විවට වෙළඳපොළ කටයුතු යටතේ දරන ලද රජයේ සුරැකුම්පත් ප්‍රමාණයෙහි, එනම් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි විශාල වැඩි වීමයි. මේ අතර, 2000 වසර තුළදී වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතනවලට සපයන ලද මධ්‍යම හා දිගුකාලීන ණය ප්‍රමාණයෙහි සියයට 29 ක පහළ යාමක් පෙනෙන්නට තිබුණ අතර, ණය ආපසු ගෙවීම සහ අක්‍රිය ණය වෙනුවෙන් ප්‍රතිපාදනයන් කිරීම මීට අර්ධ වශයෙන් හේතු විය. 2000 වර්ෂය තුළදී වාණිජ බැංකු සඳහා කෙටිකාලීන අත්තිකාරම් ප්‍රදානය කර නොමැත.

#### (ii) බැරකම්

බැංකුවේ මුළු බැරකම් ප්‍රමාණයෙන් සියයට 36 කට වග කියමින් " වෙනත් වගකීම් සහ ගිණුම්" නැමැති බැරකම් අංශය විශාලතම කාණ්ඩය බවට පත් විය. මෙම අයිතමයෙහි විස්තරාත්මක බෙද වෙන් කිරීමක් II-2 සංඛ්‍යා සටහනෙහි දක්වේ. ඒ අතර ව්‍යවහාර මුදල් සංසරණය 1999 රුපියල් දශ ලක්ෂ 70,210 සිට වසර 2000 දී රුපියල් දශ ලක්ෂ 73,316 දක්වා සියයට 4.4 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. 'තැන්පතු' යටතේ දක්වෙන බැරකම් ප්‍රමාණය බැංකුවේ මුළු බැරකම් වලින් සියයට 27.2 ක් වූ අතර, මෙයින් රජයේ තැන්පතු ප්‍රමාණය සියයට 28 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. එසේම ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා වෙනුවෙන් වාණිජ බැංකු විසින් පවත්වාගනු ලැබූ තැන්පතු ප්‍රමාණය සියයට 5 කින් වැඩි වූ අතර ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය සහ විදේශීය බැංකු ආයතනවල මුළු තැන්පතු ප්‍රමාණය සියයට 17.0 කින් අඩු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා බැරකම්හි එන ප්‍රධාන සංරචකවල සංසන්දනයක් II-2 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

#### (iii) ආදායම

1999 වසරේ රුපියල් දශ ලක්ෂ 18,675 ක් වූ බැංකුවේ දළ ආදායම 2000 වසරේදී රුපියල් දශ ලක්ෂ 26,495 ක් විය. බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමණාකරණයෙන් ලද විදේශීය ආදායම, මුළු ශුද්ධ ආදායමෙන් සියයට 53 ක් වූ අතර, එම ප්‍රතිශතය 1999 දී සියයට 71 ක් විය. ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු ප්‍රමාණයේ ඉහළ යාම හේතුවෙන් ඉපැයුම් වැඩි වීම පිළිබිඹු කරමින් දේශීය මූලාශ්‍ර මගින් උපයන ලද පොලී ආදායම 1999 වර්ෂය සඳහා වූ සියයට 29.4 හා සසඳන කල 2000 වසර තුළදී සියයට 47.5 ක් විය. බැංකුවේ ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාවය විදහාපාන වත්කම් - පිරිවැටුම් අනුපාතිකය, එනම් මුළු ආදායම සාමාන්‍ය මුළු වත්කම්වලට දක්වන ප්‍රතිශතය, 1999 දී සියයට 9.6 සිට 2000 දී සියයට 12.7 දක්වා වැඩි විය.

#### (iv) වියදම

බැංකුවේ දළ වියදම 1999 දී රුපියල් දශ ලක්ෂ 15,475 සිට 2000 දී රුපියල් දශ ලක්ෂ 22,495 දක්වා වැඩි විය. මෙයින් සියයට 10.6 ක් පරිපාලන වියදම් වූ අතර, සියයට 68.3 ක් වර්ෂයට අදාළ පොලී ගෙවීම්ය. වියදම් හා සංචිත සඳහා වෙන් කිරීම් සහ ක්ෂය වීම් හා බොල් ණය සඳහා වූ ප්‍රතිපාදන වලින් පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශ ලක්ෂ 4,000 මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

## II-1 සංඛ්‍යා සටහන

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2000 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

(රුපියල්)

### බැ ර ක ම්

| 1999 දෙසැම්බර් මස 31 දින | | | 2000 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය | 1,50,00,000 | |
| 98,50,00,000 | 100,00,00,000 | අතිරික්තය | 98,50,00,000 | 100,00,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 6,764,20,19,005 | | නෝට්ටු | 7,042,79,16,466 | |
| 256,78,37,948 | 7,020,98,56,953 | කාසි | 288,79,74,377 | 7,331,58,90,843 |
| | | **තැන්පතු** | | |
| 246,28,75,895 | | රජය | 315,20,81,409 | |
| 1,46,93,408 | | රාජ්‍ය නියෝජ්‍යතන්ව හා ආයතන | 4,24,22,726 | |
| 3,021,96,90,513 | | වෙළෙඳ බැංකු | 3,180,45,32,340 | |
| 2,846,45,27,121 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන | 2,357,82,60,939 | |
| 12,45,562 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු.7,15,46,400/-හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 7,59,962 | |
| 50,26,43,702 | 6,166,56,76,201 | අනෙකුත් | 51,71,33,867 | 5,909,51,91,243 |
| | | මධ්‍යම හා දීර්ඝකාලීන | | |
| | 492,50,00,000 | ණය අරමුදල | | 492,50,00,000 |
| | 56,18,22,500 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම | | 57,61,08,601 |
| | 6,222,37,03,560 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 7,827,85,69,259 |
| | 20,058,60,59,214 | | | 21,719,07,59,946 |

### ව ත් ක ම්

| 1999 දෙසැම්බර් මස 31 දින | | | 2000 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 2,084,03,44,684 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ | 2,342,69,78,023 | |
| 8,731,59,52,047* | | විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් | 5,373,67,57,405* | |
| 6,62,59,739 | 10,822,25,56,470 | විශේෂ ආපසු ගැනීම් හිමිකම් | 2,99,15,472 | 7,719,36,50,900 |
| | | **දේශීය වත්කම්** | | |
| 3,566,58,59,959 | | ණය සහ අත්තිකාරම් රජයට | 3,986,59,69,959 | |
| 73,66,73,603 | | අනෙකුත් අයට-මධ්‍යම හා දීර්ඝකාලීන | 51,97,19,010** | |
| 1,13,18,501 | | කෙටිකාලීන | - | |
| 2,562,27,31,925 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් | 6,695,19,26,120 | |
| 56,18,22,500 | 6,259,84,16,488 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා | 57,61,08,601 | 10,791,37,23,690 |
| | 2,976,50,86,256 | අනෙකුත් වත්කම් හා ගිණුම් | | 3,208,33,85,356 |
| | 20,058,60,59,214 | | | 21,719,07,59,946 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රු.57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු.29,33,697 ක් සහ රු.34,340 ක් විය.

**පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අය කරගත නොහැකි ණය සඳහා රු.234,33,38,893 ක ප්‍රතිපාදන අඩුකර ඇත.

## 2000 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

(රුපියල්)

| 1999 | | 2000 | 1999 | | 2000 |
|---|---|---|---|---|---|
| 1,547,49,17,309 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාලීය උපකරණ සඳහ ක්ෂය කිරීම ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම් | 2,249,47,74,788 | 1,867,49,17,309 | පොලී ආදිය | 2,649,47,74,788 |
| | වර්ෂයේ ශුද්ධ ලාභය | | | | |
| 320,00,00,000 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 400,00,00,000 | | | |
| 1,867,49,17,309 | | 2,649,47,74,788 | 1,867,49,17,309 | | 2,649,47,74,788 |

ඒ.එස්.ජයවර්ධන
අධිපති

වයි.එම්.ඩබ්.බී.වීරසේකර
ප්‍රධාන ගණකාධිකාරී

විගණකාධිපති සටහන :

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2000 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 42(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පනතේ 42(2) වගන්තිය ප්‍රකාර මුදල් අමාත්‍යවරිය වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

2001 මාර්තු මස 23 දින.
කොළඹ 7.
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදී ය.

එස්.සී.මායාදුන්නේ
විගණකාධිපති.

II - 2 සංඛ්‍යා සටහන
**ශ්‍රී ලංකා මහ බැංකුවේ**
**වත්කම් හා බැරකම්වල වූ ප්‍රධාන අයිතම සැසඳීම**

බැරකම්

| අයිතමය | 1999 අවසානයේදී | | 2000 අවසානයේදී | |
|---|---|---|---|---|
| | රු.දශලක්ෂ | % | රු.දශලක්ෂ | % |
| ප්‍රාග්ධන සහ අතිරික්තය | 1,000 | 0.5 | 1,000 | 0.5 |
| සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් නෝට්ටු | 70,210 | 35.0 | 73,316 | 33.7 |
| තැන්පතු | 61,666 | 30.7 | 59,095 | 27.2 |
| මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල | 4,925 | 2.5 | 4,925 | 2.3 |
| ප්‍රාග්ධන දායක දීමනා ගිණුම | 562 | 0.3 | 576 | 0.3 |
| අනෙකුත් බැරකම් | 62,223 | 31.0 | 78,279 | 36.0 |
| නිකුත් කරන ලද ඇපකර | 8,790 | 4.4 | 13,622 | 6.3 |
| පාලන ගිණුම් සංචිත | 24,363 | 12.1 | 26,430 | 12.1 |
| විශේෂ හැර ගැණුම් හිමිකම් ලැබීම් | 6,693 | 3.3 | 6,870 | 3.1 |
| ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යාගණනය ගිණුම | 2,727 | 1.5 | 6,537 | 3.0 |
| ලාභාලාභ ගිණුම | 5,480 | 2.7 | 8,416 | 3.9 |
| ආසියානු නිශ්කාෂන සංගම් ගිණුම | 8,689 | 4.3 | 10,998 | 5.1 |
| අනෙකුත් | 5,481 | 2.7 | 5,406 | 2.5 |
| එකතුව | 200,586 | 100.0 | 217,191 | 100.0 |

වත්කම්

| අයිතමය | 1999 අවසානයේදී | | 2000 අවසානයේදී | |
|---|---|---|---|---|
| | රු.දශලක්ෂ | % | රු.දශලක්ෂ | % |
| ජාත්‍යන්තර සංචිතය | 108,223 | 54.0 | 77,194 | 35.5 |
| දේශීය වත්කම් | 62,598 | 31.2 | 107,914 | 49.7 |
| අනෙකුත් වත්කම් | 29,765 | 14.8 | 32,083 | 14.8 |
| නිකුත් කරන ලද ඇපකර වෙනුවෙන් තැන්පත්කරුවන්ගේ වගකීම | 8,790 | 4.4 | 13,622 | 6.3 |
| වෙළෙඳ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ගිණුම ගැලපීම් ගිණුම (ලැබිය යුතු මුදල්) | 3,843 | 1.9 | - | - |
| එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ | 2,701 | 1.3 | 3,333 | 1.5 |
| අනෙකුත් | 14,431 | 7.2 | 15,128 | 7.0 |
| එකතුව | 200,586 | 100.0 | 217,191 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## (ආ) ගණකාධිකරණ ප්‍රතිපත්ති

### (i) පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළි ගැණුනු ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල ධර්මයන්ට අනුකූලව මේ සමග ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

### (ii) විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා බැරකම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුණු, මධ්‍ය විනිමය අනුපාතික පදනම් කරගෙන පරිවර්තනය කර ඇත.

### (iii) ආයෝජන

සියළුම ආයෝජන පිරිවැය අනුව ගණනය කර ඇත.

### (iv) අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම් මූල්‍ය සමාගම් වලින් අය විය යුතුව ඇති අක්‍රීය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වේ.

| අක්‍රීය ණයවල කාලපරිච්ඡේද (මාස) | ප්‍රතිපාදන (%) |
|---|---|
| 6 - 12 | 20 |
| 12 - 18 | 50 |
| 18 ට වැඩි | 100 |

### (v) ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ එවායේ පිරිවැය වටිනාකමින් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දැක්වෙන අනුපාතිකවලට අනුකූලව හීන වන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම්ගත කර ඇත.

| අයිතමය | වාර්ෂික ප්‍රතිශතය |
|---|---|
| ගොඩනැගිලි | 2 |
| සවි කිරීම සහ උපකරණ | 10 |
| කාර්යාලයීය ළී බඩු සහ උපකරණ | 10 |
| මෝටර් රථ | 10 |
| ස්වයංක්‍රීය උපකරණ (සුළු) | 20 |
| A/S 400 ප්‍රධාන ජාල පරිඝණක | 20 |
| පරිඝණක සහ පරිඝණක උපකරණ | 25 |
| පුස්තකාල පොත් | 33 1/3 |

වසර තුළදී මිළදී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන කර ඇත. වර්ෂය තුළදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදනයන් සළසා නැත.

**(vi) තොග**

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුළදී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර, වර්ෂය අවසානයේ ඇති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදු කර නොමැත.

**(vii) අයභාර ගණනය**

මුදල් පදනම මත ගණනය කර ඇති අක්‍රීය ණය වෙනුවෙන් වූ පොලී හැරුණුවිට පොලී සහ අනෙකුත් ආදායම් උපචිත පදනම මත පොත්වල සටහන් කර ඇත.

**(viii) ශුද්ධ ලාභය**

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය සියළුම වියදම්හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වේ.

(අ) අක්‍රීය ණය සඳහා ප්‍රතිපාදන

(ආ) ස්ථාවර වත්කම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන

(ඇ) අනෙකුත් ප්‍රතිපාදන සහ මුදල් නීති පණතේ 38 වැනි වගන්තිය ප්‍රකාර සංචිත සඳහා වෙන් කිරීම්

## 2. බැංකු ක්‍රියාකාරිත්වය

### (අ) පොදු

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණුවලට අනුකූලව එනම් රුපියලේ දේශීය සහ විදේශීය අගය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා විදේශ ගණුදෙනු මෙහෙයවීම, රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය, රජයේ සහ වාණිජ බැංකුවල බැංකුව වශයෙන් ක්‍රියා කිරීම, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීම සහ මෙහි සාකච්ඡාවට බඳුන් කෙරෙන වෙනත් විශේෂ සේවා සැපයීම ආදී කටයුතුවල බැංකු කටයුතු දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය.

### (ආ) විදේශ විනිමය මෙහෙයුම් සහ විදේශ සංචිත කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන අරමුණුවලට අනුකූලව වෙළඳපොළ උපනතීන් මත රුපියලේ බාහිර අගය පවත්වාගෙන යාමට දායක විය. ඒ අනුව මහ බැංකුව විසින් දෛනිකව ඇ.එ.ජ. ඩොලරයේ ගැණුම් හා විකුණුම් මිල ප්‍රකාශයට පත් කිරීම මගින් වෙනත් විදේශීය මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය මහ බැංකුවේ මග පෙන්වීම යටතේ වෙළඳපොළ ක්‍රියාකාරිත්වය මත තීරණය වීමට ඉඩ හරිනු ලැබීය. වාණිජ බැංකුවලට විදේශ විනිමය වෙළඳපොළ තුළ වඩා ක්‍රියාශීලී අයුරින් නිදහස්ව කටයුතු කිරීමට ඉඩ සලසමින් එතෙක් සියයට 2 ක්ව පැවති ඇ.එ.ජ.ඩොලරයේ ගැණුම් හා විකුණුම් මිල අතර තිබූ පරතරය 2000 වර්ෂයේ ජූනි මස 20 වැනි දින සිට සියයට 5 ක් දක්වා පුළුල් කරනු ලැබීය. දේශීය වෙළඳපොළ තුළ ඇ.එ.ජ.ඩොලරයේ සැපයුම් හා ඉල්ලුම් තත්ත්වයන් පදනම් කරගෙන මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොළ තුළ ඩොලරයේ මිල තීරණය වීමට ඉඩ හැරීම මෙම පරතරය වැඩි කිරීම මගින් බලාපොරොත්තු විය. මෙම පරතරය තවදුරටත් 2000 නොවැම්බර් මස 03 වැනි දින සියයට 6 ක් හා දෙසැම්බර් මස 11 වැනි දින සියයට 8 ක් වශයෙන් පුළුල් කරනු ලැබීය.

**II - 3 සංඛ්‍යා සටහන**
**විනිමය අනුපාතිකයෙහි ප්‍රධාන වෙනස්වීම් - 2000**

| දිනය | ප්‍රධාන වෙනස්වීම් | එ.ජ ඩොලරයක ශ්‍රී ලං.ම.බැ. ගැණුම් මිල රුපියල් | එ.ජ ඩොලරයක ශ්‍රී ලං.ම.බැ. විකුණුම් මිල රුපියල් |
|---|---|---|---|
| 2000 ජූනි 20 | පරාසය මධ්‍ය විනිමය අනුපාතිකයෙන් 5% දක්වා පුළුල් කරන ලදී. මධ්‍ය විනිමය අනුපාතිකය 4% කින් අවප්‍රමාණ කරන ලදී. ස්ථාවර පරාසයක පවත්වා ගෙන යන ලදී. | 75.60 | 79.47 |
| 2000 නොවැම්බර් 03 | මිලදී ගැනීමේ විනිමය අනුපාතිකයෙන් 6% දක්වා පරාසය පුළුල් කරන ලදී. විචල්‍ය පරාසයක පවත්වාගෙන යන ලදී. | 75.60 | 80.14 |
| 2000 දෙසැම්බර් 11 | මිලදී ගැනීමේ විනිමය අනුපාතිකයෙන් 8% දක්වා පරාසය පුළුල් කරන ලදී. විචල්‍ය පරාසයක පවත්වාගෙන යන ලදී. | 76.87 | 83.02 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂ වශයෙන් එතරම් පුළුල් නොවූ දේශීය අභ්‍යන්තර විනිමය වෙළඳපොළෙහි විධිමත් වර්ධනය දිරිමත් කිරීමේ සහ එහි ඇති වන තාවකාලික ඉල්ලුම් හා සැපයුම් අසමතුලිතතාවයන් සමනය කිරීමේ අරමුණින්, අත්‍යවශ්‍ය යයි හැඟෙන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා රුපියලට ප්‍රතිමුඛව ඇ.එ.ජ.ඩොලරයේ එතැන් මිලදී ගැනීම් හා විකුණුම් මගින් මහ බැංකුව තවදුරටත් බලපත්‍රලාභී වාණිජ බැංකු සමග විදේශ විනිමය මෙහෙයුම්වල නිරත විය. විදේශ විනිමය වෙළඳපොළ වර්ධනය හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව සැළකිල්ලට ගනිමින් දෛනිකව විනිමය අනුපාතිකය කළමනාකරණය කරන ලදී. විශේෂයෙන්ම ඉහළ නැග තිබූ බලශක්ති හා ආරක්ෂණ කටයුතුවලට සම්බන්ධ ආනයන හමුවේ සමපේක්ෂණ ගණුදෙනු අඩු කිරීම සහ විනිමය අනුපාතිකය සුදුසු මට්ටමක පවත්වා ගැනීම ප්‍රධාන වශයෙන් අරමුණු කරගෙන මහ බැංකුව වෙළඳපොළ ගණුදෙනුවලට මැදිහත් විය. වසර

2000 තුළදී මහ බැංකුවේ ශුද්ධ විදේශ විනිමය වෙළඳපොළ ගණුදෙනු ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 301.6 ක් විය. 2000 වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ එ.ජ.ඩොලර් මිලදී ගැණුම් හා විකුණුම් අනුපාතිකය පිළිවෙලින් රු. 71.3642 හා රු. 72.8059 ක් වූ අතර එය වර්ෂය අවසානයේ පිළිවෙලින් රු. 76.9850 ක් හා රු. 83.1346 ක් විය.

**II -4 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු සමග කරන ලද විදේශ විනිමය ගණුදෙනු - 2000**

(දහස් ගණනින්)

| මාසය | එතැන් විනිමය ගැනුම් | | එතැන් විනිමය විකුණුම් | |
|---|---|---|---|---|
| | ඇ.එ.ජ.ඩො. | රුපියල් | ඇ.එ.ජ.ඩො. | රුපියල් |
| ජනවාරි | - | - | - | - |
| පෙබරවාරි | - | - | - | - |
| මාර්තු | - | - | - | - |
| අප්‍රේල් | - | - | - | - |
| මැයි | - | - | 68,710 | 5,072,702 |
| ජූනි | - | - | 39,785 | 2,951,988 |
| ජූලි | - | - | - | - |
| අගෝස්තු | - | - | - | - |
| සැප්තැම්බර් | - | - | 26,475 | 2,052,871 |
| ඔක්තෝබර් | - | - | 60,942 | 4,725,443 |
| නොවැම්බර් | - | - | 86,189 | 6,748,338 |
| දෙසැම්බර් | 2,000 | 158,280 | 21,521 | 1,700,925 |
| මුළු එකතුව | 2,000 | 158,280 | 303,622 | 23,252,267 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොළ කාර්යක්ෂම කිරීමේ අරමුණ ඇතිව, මහ බැංකුව ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සමග සමීපව කටයුතු කරනු ලැබීය. විදේශ විනිමය සඳහා මිල ප්‍රකාශ කිරීමේදී ගැණුම් සහ විකුණුම් යන මිල දෙකම සඳහන් කළයුතු බව වාණිජ බැංකුවලට විශේෂයෙන් අවධාරණය කෙරිණ. ගැණුම් හා විකුණුම් මිල දෙකම සඳහන් කිරීමේදී යාවත්කාලීන වීම සඳහා "රොයිටර් ප්‍රවෘත්ති තිරය" ලබා ගැනීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් වාණිජ බැංකු දිරිමත් කිරීමට මහ බැංකුව මූලිකව කටයුතු කළේය. මෙම ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් වසර ආරම්භයේ මෙම පහසුකම සහිත වාණිජ බැංකු සංඛ්‍යාව 03 සිට වර්ෂ අවසානය වනවිට 15 දක්වා වැඩි විය. රොයිටර් ප්‍රවෘත්ති තිර පහසුකම් ලබා ගැනීමට අපහසු වූ අනෙකුත් බැංකු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, "පුළුල් පරිගණක ජාලය" මගින් බැංකු කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වීමට හා යාවත්කාලීන කිරීමේ විකල්ප පහසුකම් තාවකාලිකව ලබා දීමට බැංකු කටයුතු දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී.

ඊට අමතරව සෑම පැය භාගයකට වරක්ම වෙළඳපොළෙහි පොලී අනුපාතික හා විනිමය අනුපාතික යාවත් කාලීනව අභ්‍යන්තර පරිගණක ජාලය තුලින් ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට ලබා දීම සඳහා පහසුකම් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේද සහය ඇතිව බැංකු කටයුතු දෙපාර්තමේන්තුව මගින් වැඩි දියුණු කර ක්‍රියාත්මක කරන ලදී.

විදේශීය මූල්‍ය සංචිතවල උපරිම ද්‍රවශීලතාවය පවත්වාගෙන යමින් අවම අවදානමක් සහිතව උපරිම ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් විදේශීය මූල්‍ය වත්කම්වල ආයෝජනය කිරීමෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වසර තුලදීද විදේශ විනිමය සංචිත කළමනාකරණයෙහි යෙදුණි. ඒ අනුව, බහුතර ආයෝජනයන් කර ඇත්තේ ඇ.එ.ජ.ඩොලර්, ස්ටර්ලින් පවුම් හා යූරෝ වැනි මුදල් ඒකක වලින් නිකුත් වූ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වලය. 1999 වසරේදී රුපියල් දශ ලක්ෂ 6,500 ක් වූ විදේශ විනිමය සංචිත මුදල් කළමනාකරණය මගින් උපයා ගන්නා ලද ශුද්ධ විදේශ විනිමය ආදායම 2000 වසරේදී රුපියල් දශ ලක්ෂ 6,600 ක් විය.

## (ඇ) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

### (i) විවට වෙළඳ කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් විවට වෙළඳ කටයුතු තුලින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම සහ මිලදී ගැනීම, ප්‍රතිමිලදී ගැනීම සහ ප්‍රතිවිකුණුම් කටයුතු විවට වෙළඳ කටයුතු යටතට ඇතුළත් විය. ප්‍රතිමිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් පමණක් භාවිතා කරනු ලැබූ අතර, ප්‍රතිවිකුණුම් සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දෙවර්ගයම භාවිතා කෙරිනි.

### 1. ද්විතීයික වෙළඳපොළ කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2000 වසරේදී සිය ද්විතීයික වෙළඳපොළ තුළින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් (සහභාගිත්ව ආයතන) වෙත අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම 1999 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 6,982 හා සසඳන කළ දෙගුණයකටත් වඩා වර්ධනයක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 15,675 ක් විය. මෙයට මූලිකව බලපෑ සාධකය වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික කවුළුවෙන් මිලදී ගන්නා භාණ්ඩාගාර බිල්පත්, මුදල් වෙළඳපොළෙහි තවදුරටත් ගණුදෙනු කිරීමට පහසුකම් සලසමින්, මෙතෙක් මහ බැංකු ද්විතීයික වෙළඳපොළේ අලෙවි කරන ලද

බිල්පත් වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සිය වෙනුවට නියමිත බිල්පත් නිකුත් කිරීමට තීරණය කිරීමය. 2000 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්විතීයික වෙළඳපොළේ අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 50 කටත් වඩා එම වර්ෂයේ ප්‍රථම කාර්තුව තුළදී අලෙවි කරන ලදී. වෙළඳපොළේ ද්‍රවශීලතාවයේ සිදු වූ සැළකිය යුතු අඩුවීම නිසා වර්ෂයේ ඉතිරි කාලපරිච්ඡේදය තුළදී ද්විතීයික වෙළෙඳපලෙහි භාණ්ඩාගාර බිල්පත් විකිණීම්හි අඩපන වීමක් සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළඳපොළෙහි කරන ලද අලෙවි කිරීම් හා මිලදී ගැනීම් පහත දක්වෙන රූප සටහන I න් දක්වේ.

I රූපසටහන

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ මිලදී ගැනීම් සහ විකුණුම් - 2000**




රජයේ සුරැකුම්පත්වලට අදළ ඵලදා අනුපාතිකයෙහි ක්‍රමානුකූල වර්ධනයක් වර්ෂය පුරාම දක්නට ලැබිණි. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික වෙළෙඳපොලෙහි මාස 3, මාස 6 සහ මාස 12 යන කාල සඳහා භාණ්ඩාගාර බිල්පත්වලට අදළ විකුණුම් ඵලදා අනුපාතික වසර මුලදී පිළිවෙලින් වාර්ෂිකව සියයට 11.57, සියයට 12.09 හා සියයට 12.39 වූ අතර එය වසර අගදී සියයට 17.86, සියයට 17.88 සහ සියයට 18.96 දක්වා ඉහළ ගියේය.

වසරේ අවසාන භාගයේදී වෙළඳපොළ තුළ අඛණ්ඩව දක්නට ලැබුණු දැඩි ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික වෙළඳපොළ තුළින් මිලදී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් වටිනාකම, 1999 වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 1,443 සිට 2000 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 2,105 දක්වා සියයට 46 කින් වර්ධනය විය. සමහර සහභාගිත්ව ආයතන තමන් මුහුණපා සිටි දිගුකාලීන ද්‍රවශීල ඌනතාවය පියවා ගැනීම සඳහා ප්‍රතිවිකුණුම් යටතේ කෙටිකාලීනව අරමුදල් සපයා ගැනීම වෙනුවට එකී භාණ්ඩාගාර බිල්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික වෙළඳපොළෙහි අලෙවි කිරීමට වැඩි කැමැත්තක් දක්වූහ.

ප්‍රාථමික වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත්හි ඵලදා අනුපාතික ආශ්‍රිතව ගණනය කෙරෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීයික වෙළඳපොළ මිලදී ගැනීම් ඵලදා අනුපාතිකයන්ද, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ ඵලදා අනුපාතිකයන්හි උපනතීන් හා යමින්, 2000 වසරේදී ඉතා තියුණු ලෙස ඉහළ යනු දක්නට ලැබිණි. ඒ අනුව මාස 3, මාස 6 සහ මාස 12 කාල සඳහා භාණ්ඩාගාර බිල්පත්වලට අදළ මිළදී ගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් වර්ෂය මුල වූ වාර්ෂිකව සියයට 14.29, සියයට 14.79 හා සියයට 15.27 සිට 2000 වසර අවසානය වනවිට පිළිවෙලින් සියයට 21.27, සියයට 21.40 සහ සියයට 21.72 දක්වා වර්ධනය වී තිබිණි.

## 2. ප්‍රතිමිලදී ගැනීම් කටයුතු

ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විකුණනු ලැබූ භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම 1999 වූ රුපියල් දශ ලක්ෂ 307,795 හා සසඳන කළ 2000 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 110,476 ක් විය. ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ වසර 2000 දී කළ භාණ්ඩාගාර බිල්පත් අලෙවියේ පිරිහීමට හේතු වූයේ එම වර්ෂය පුරාම, විශේෂයෙන්ම වසරේ අවසන් භාගයේදී, වෙළඳපොළ තුළ දක්නට ලැබුණු දැඩි ද්‍රවශීලතා හිඟයයි.

II රූපසටහන

**මාසික ප්‍රතිමිලදී ගැනීම් ප්‍රමාණයන් සහ අනුපාතිකයන් 1999 සහ 2000**



වසර මුලදී වාර්ෂිකව සියයට 9.25 ක් වූ එක් දින ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය වර්ෂයේ මුල් භාගයේදී ක්‍රමානුකූලව අඩු වී 2000 වසරේ අප්‍රේල් මස 06 දින වනවිට සියයට 9.00 දක්වා අඩු විය. එනමුත්, වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය වැඩිවීමත් සමගම ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතිකය, 2000 වසරේ මැයි මස 09 දින සියයට 9.25 දක්වාත්, ජූනි මස 08 දින සියයට 9.50 දක්වාත්, ජූලි මස 26 දින සියයට 11.00 දක්වාත්, අගෝස්තු මස 31 දින සියයට 11.75 දක්වාත්, සැප්තැම්බර් මස 26 වන දින සියයට 12.50 දක්වාත්, සැප්තැම්බර් මස 29 දින සියයට 13.00 දක්වාත්, නොවැම්බර් මස 08 දින සියයට 15.00 දක්වාත් සහ නොවැම්බර් මස 21 දින සියයට 17.00 දක්වාත් ක්‍රමයෙන් වර්ධනය විය. ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකයෙහි සිදු වූ වැඩි වීම ප්‍රතිවිකුණුම් අනුපාතිකයන්ට සාපේක්ෂව සිදු වූ අතර එය රුපියලෙහි විනිමය අනුපාතිකයට එල්ල වූ බලපෑම සමනය කිරීමට උපකාර වූවා පමණක් නොව වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි දක්නට ලැබුණු ඉහළ යාමේ උපනතීන් හා අනුකූල ද විය.

## 3. ප්‍රතිවිකුණුම් කටයුතු

අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළෙහි පොලී අනුපාතිකය ස්ථායීකරණය කිරීමට අමතරව වෙළඳපොළට අවශ්‍ය ද්‍රවශීලතාව සැපයීම සඳහා 2000 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් කටයුතු මගින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලැබීය. වෙළඳපොළ තුළ දක්නට ලැබුන විශාලවූත්, අඛණ්ඩ වූත් ද්‍රවශීලතා හිඟය පිළිබිඹු කරමින් 2000 වසරේදී වෙළඳපොළට සැපයූ ශ්‍රී ලංකා මහ බැංකුවේ එක් දින ප්‍රතිවිකුණුම්වල වටිනාකම 1999 වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 213,349 ට සාපේක්ෂව නව ගුණයකින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,075,098 ක් දක්වා වර්ධනය විය. එයින් භාණ්ඩාගාර බිල්පත් යටතේ සිදු කළ ප්‍රතිවිකුණුම් ප්‍රමාණය 1999 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 137,829 ට සාපේක්ෂව 2000 වසරේදී සියයට 83 කින් පමණ වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 252,581 දක්වා වර්ධනය විය. එමෙන්ම භාණ්ඩාගාර බැඳුම්කර යටතේ සැපයුනු ප්‍රතිවිකුණුම් පහසුකම්වල වටිනාකම 1999 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 75,520 ට සාපේක්ෂව 2000 වසරේදී තියුණු ලෙස වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 1,826,518 දක්වා වර්ධනය විය. 1999 හා 2000 වර්ෂයන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදු කළ මාසික ප්‍රතිවිකුණුම් ප්‍රමාණයන් හා අනුපාතිකයන් පහත රූප සටහන අංක III යටතේ දක්වේ.

III රූපසටහන
**මාසික ප්‍රතිවිකුණුම් වටිනාකම සහ අනුපාතිකයන්**
**1999 සහ 2000**




IV රූපසටහන
**දෛනික සාමාන්‍ය ප්‍රතිවිකුණුම් වටිනාකම**
**1999 සහ 2000**




2000 වර්ෂය මුලදී වාර්ෂිකව සියයට 13.48 ක් වූ එක් දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය 2000 මැයි මස 09 දින සියයට 13.00 ක් දක්වා අඩු වූ නමුත් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ හිඟ වීමත් සමගම, 2000 මැයි මස 11 දින සියයට 13.04 සිට ක්‍රමානුකූලව වැඩිවී වසර අග වනවිට සියයට 20 ක් දක්වා වැඩි වී තිබිණි. වසර මුලදී එක් දිනකට සීමා කොට තිබූ ප්‍රතිවිකුණුම් පහසුකම් කාලසීමාව, වසර මැද වනවිට වැඩිවෙමින් තිබූ වෙළඳපොළ ද්‍රවශීලතා හිඟයට පිළියමක් ලෙස දින 30 ක් දක්වා වැඩි කෙරුනද පසුව නැවතත් එක් දිනය දක්වා අඩු කරන ලදී.

(ii) **මහ බැංකු පොලී අනුපාතිකය**

මුදල් නීති පනතේ 87 වැනි වගන්තිය ප්‍රකාර බලපත්ලාභී වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු පොලී අනුපාතිකය 2000 ඔක්තෝබර් මස 02 දින සියයට 16 සිට සියයට 18 දක්වාද, 2000 නොවැම්බර් මස 08 දින සියයට 18 සිට සියයට 20 දක්වාද, 2000 නොවැම්බර් මස 21 දින සියයට 20 සිට සියයට 25 දක්වාද තුන් වතාවකදී වැඩි කරන ලදී.

(iii) **ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා**

රුපියල් තැන්පතු වගකීම්වලට එරෙහිව පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා 2000 වසර තුළදී සියයට 11 ක්ව නොවෙනස්ව පැවැති අතර, විදේශීය මුදල් තැන්පතු වගකීම්වලට එරෙහිව පැවැති ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2000 අගෝස්තු මස 04 දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී.

(iv) **කෙටිකාලීන ණය**

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (න.ස.ග්‍රා.ණ.ක්‍ර.) අත්හිටුවීමට පෙර බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ගොවීන්ට සපයන ලද වක්‍රිය ණය ප්‍රමාණයට අදාලව පමණක් 1994 අප්‍රේල් මස සිට බලපවත්වන පරිදි ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී. මෙම පහසුකම යටතේ අය විමට තිබූ මුළු මුදලම (රුපියල් දශ ලක්ෂ 12) 2000 වසර තුළදී අය කර ගන්නා ලදී.

(v) **මැදි හා දිගුකාලීන ණය**

මැදි හා දිගුකාලීන ණය අරමුදල, වසර 2000 තුළදී රුපියල් දශ ලක්ෂ 4,925 මට්ටමක නොවෙනස්ව පැවතුණි. වසර තුළ ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 104.3 ක් වූ අතර, 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ ලංකා බැංකුවට මුදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 50 ක් විය. මේ අනුව වසර 2000 අග වනවිට බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්වලට පෙරාතුව මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ මුදා හරින ලද ණය මුදලින් අය විය යුතු මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,654 ක් විය.

## (ඇ) රජයේ සහ වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ ක්‍රියාකාරිත්වය

(i) **මූල්‍ය ආයතන ගිණුම්**

වාණිජ බැංකු සහ තෝරා ගත් වෙනත් බැංකු නොවන මූල්‍ය ආයතනවල ගෙවීම් සහ පියවීම් කටයුතු කාර්යක්ෂමව සිදු වීම තහවුරු කිරීම පිණිස බැංකු කටයුතු දෙපාර්තමේන්තුව විසින් එම ආයතන වෙත ජංගම ගිණුම් පහසුකම් තවදුරටත් සපයන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ රජයේ ණය සුරැකුම්පත් ප්‍රාථමික නිකුත් කිරීම් ස්වයංකෘතව සිදු කිරීම සහ ඒ සඳහා "මධ්‍යම තැන්පතු ක්‍රමය" ඇති කිරීම සඳහා ආරම්භක පියවර ගැනීමත් සමග, රජයේ සුරැකුම්පත් ප්‍රාථමික නිකුතුවට සහභාගී වන්නන් අතර සහ වාණිජ බැංකු අතර ගණුදෙනු පියවීම පහසු කරවනු වස් "විද්‍යුත් මුදල් පැවරුම් ක්‍රමය" (EFTS) ක්‍රියාත්මක කිරීමට බැංකු කටයුතු දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මූලික පියවර ගනු ලැබීය. ඒ අනුව ආරම්භක පියවරක් ලෙස ජංගම ගිණුම් අංශයෙහි වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම "ස්වයංකෘත" කරන ලද අතර සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ විද්‍යුත් මුදල් පැවරුම් ක්‍රමය අත්හද බැලීම ආරම්භ කරන ලදී. තවද බැංකු කටයුතු දෙපාර්තමේන්තුව තත්කාලීන දළ පියවුම් පද්ධතියක්" (RTGS) ඇති කිරීම සම්බන්ධව අවශ්‍ය සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමේ මූලික වැඩ කටයුතුවලද නිරත විය. විශේෂ සටහන (11) බලන්න.

(ii) **රාජ්‍ය ගිණුම්**

ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ බැංකුකරු වශයෙන් රාජ්‍ය දෙපාර්තමේන්තු, රජයේ නියෝජ්‍යායතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා බැංකු ගිණුම් පවත්වාගෙන ගිය අතර, 2000 වර්ෂය අවසානය වනවිට එවැනි ගිණුම් 140 ක් විය.

(iii) **අපනයනකරුවන් සඳහා වූ ආනයන තීරු බදු ප්‍රතිදාන**

1999 දී ගෙවන ලද රුපියල් දශ ලක්ෂ 349 හා සසඳ බලන කල රජය වෙනුවෙන් අපනයනකරුවන්ට ගෙවන ලද තීරු බදු ප්‍රතිදාන සඳහා 2000 වසරේදී මහ බැංකුව බලපත්ලාභී වාණිජ බැංකුවලට ප්‍රතිපූරණය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 241 කි.

(iv) **මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණා සහගත ගෙවීම්**

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීමේදී රජය වෙනුවෙන් ඔවුන් වෙත ගෙවන ලද මුළු සහන ගෙවීම් 1999 දී රුපියල් 73,750 හා සසඳන කල 2000 වසරේදී එය රුපියල් 1,87,259 ක් විය. 1999 දී රුපියල් 3,300 ක් වූ කරුණා සහගත දීමනාව වසර 2000 දී රුපියල් 18,975 ක් විය.

## (ඉ) වෙනත් විශේෂ සේවා

### (i) විදේශීය මූල්‍ය

ලෝක බැංකුව (ලෝ.බැං.), ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැං.), අන්තර් ජාතික සහයෝගිතාවය සඳහා වන ජපාන බැංකුව (අ.ජා.ස.ජ.බැං.) සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (කෘ.සං.ජා.අ.) වැනි විවිධ ආයතනවල අරමුදල් යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් මුදා හැරීම සහ විදේශ ණය ආපසු ගෙවීම් බැංකු කටයුතු දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළදී අන්තර් ජාතික සංවිධාන සහ විදේශ රජයන් මගින් නව ව්‍යාපෘති දහයක් සඳහා පිරිනමන ලද අරමුදල් මුදා හැරීමද ආරම්භ කරන ලදී. රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදාන යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස් කිරීම තවදුරටත් කෙරුණු අතර, ණය දෙන ආයතනවල ඉල්ලීම අනුව එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කෙරිණි. තවද, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ ආයතන සඳහා ඇපකර නිකුත් කිරීමද බැංකු කටයුතු දෙපාර්තමේන්තුව මගින් කරගෙන යන ලදී.

### (ii) විදේශ අරමුදල් මගින් මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘතීන් සඳහා වූ ප්‍රතිමූල්‍ය පහසුකම්

වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (වැ.ක.ප්‍ර.ව්‍යා.) සඳහා සහ 1999 වසරේ අවසාන භාගයේදී හඳුන්වා දෙන ලද නාගරික සංවර්ධනය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නව නිවාස ණය ව්‍යාපෘතිය (නා.සං.අ.ආ.නි.ණ.ව්‍යා.) සඳහා බැංකු කටයුතු දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම සිදු කෙරිණි. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (ද.ප.ග්‍රා.සං.ව්‍යා.) සඳහා සහ වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ව.ජ.ස.සං.ව්‍යා.) සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම 2000 වසර තුළදී සම්පූර්ණ කරන ලදී.

### (iii) අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල් භාරකාරත්වය දැරීම හා රජය වෙනුවෙන් අරමුදල් පාලනය කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. 2000 වසරේ දෙසැම්බර් මස 31 වැනි දින වනවිට, මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ අරමුදලේ ශේෂය රුපියල් දශ ලක්ෂ 72 ක් විය.

### (iv) ආසියානු නිෂ්කාශණ සංගමය

#### 1. ආසියානු නිශ්කාෂණ සංගමයේ සාමාජික රටවල් සමග 2000 වර්ෂයේදී පැවැති වෙළඳ ගණුදෙනු

ආසියානු නිශ්කාෂණ සංගමය හරහා කරන ලද ගණුදෙනුවල මුළු වටිනාකම, 1999 වර්ෂයේදී පැවැති රුපියල් දශ ලක්ෂ 42,724 සිට 2000 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 66,111 දක්වා වර්ධනය විය. මෙය ආනයන සඳහා වන ගෙවීම් සහ අපනයන වෙනුවෙන් ලද ලැබීම් අතර, පරතරය 1999 වසරේදී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 36,685 ක සිට වසර 2000 දී රුපියල් දශ ලක්ෂ 53,732 ක් දක්වා පුළුල් වීමට හේතු විය. ඉන්දියාවෙන් හා ඉරානයෙන් කරන ලද ආනයනයන්හි සැලකිය යුතු වැඩි වීමක් 2000 වර්ෂයේදී පෙන්නුම් කෙරිණි.

#### 2. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම සහ ගන්නා ලද තීරණ

ආසියානු නිෂ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂ-වරුන්ගේ 29 වෙනි රැස්වීම 2000 වසරේ මැයි මස බංග්ලාදේශයේ ඩකා නුවරදී පවත්වන ලදී. මෙම රැස්වීමේදී භූතානයේ රාජකීය මූල්‍ය අධිකාරිය ආසියානු නිශ්කාෂණ සංගමයේ අළුත්ම සාමාජිකයා ලෙස සාමාජිකත්වය ලැබීය. ඒ අනුව සංගමය දැනට සාමාජිකයින් අටදෙනෙකුගෙන් සමන්විත වේ. තවද භූතානය සමග කරනු ලබන සියළුම වෙළඳ ගණුදෙනුවල පියවීම් කටයුතු 2000 ඔක්තෝබර් මස සිට ආසියානු නිෂ්කාශණ සංගමය හරහා සිදු කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් උපදෙස් දේශීය වාණිජ බැංකු වෙත 2000 වසරේ ඔක්තෝබර් මස නිකුත් කරන ලදී.

සංගමයේ සාමාජිකත්වය පුළුල් කර ගැනීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථා සොයා බැලීම පිණිස පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ වෙත, ආසියානු නිශ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේදී අවධානය යොමු කරන ලදී. කමිටුව විසින් කරන ලද යෝජනා බොහොමයක්ම ඒකමතිකව පිළි ගන්නා ලද අතර විශේෂයෙන්ම සංගමයේ සාමාජිකත්වය පුළුල් කිරීම සඳහා අරමුණු කර ගත් රටවල් කිහිපයක් සහභාගී කර ගැනීම පිණිස කරන ලද

යෝජනාවලටද ඒකමතික එකඟත්වය පල කරනු ලැබිණි. නව සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ අරමුණ සඳහා වැඩ කටයුතු කිරීමේදී ආසියානු නිශ්කාෂන සංගමයේ ලේකම් කාර්යාලය විසින් දැරිය යුතු වියදම් සඳහා මුදල් සපයා ගැනීමට සාමාජිකයන්ගේ දායකත්වයෙන් අරමුදලක් පිහිටුවීමටද තීරණය කරනු ලැබීය. රැස්වීමේදී එකඟත්වය පල කරන ලද අනිකුත් යෝජනා අතර දැනට ක්‍රියාත්මක වන " එතැන් " පදනම යටතේ කරනු ලබන ගණුදෙනු පියවීම්වලට අමතරව " පසුදින " පදනම යටතේ ගණුදෙනු පියවීමට පහසුකම් ලබා දීම සහ ගණුදෙනු පියවීමේදී ඇති වන ප්‍රමාද වීම් අවම කිරීම සඳහා මූල්‍ය හුවමාරු තාක්‍ෂණය වැඩි දියුණු කිරීමට පියවර ගැනීමද ඇතුළත් වේ.

# ව්‍යවහාර මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලධාරියා වශයෙන් ශ්‍රී ලංකාව තුළ ගණුදෙනු කිරීම සඳහා වලංගු මුදල් නිකුත් කිරීමේ කාර්ය භාරය 2000 වර්ෂය තුළදී තවදුරටත් ඉටු කරන ලදී. 1999 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්‍ෂ 70,210 ක් ලෙස සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය සමග සසඳනවිට 2000 වර්ෂය අවසානයට මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 73,316 ක් විය. සංසරණය වන සම්පූර්ණ ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙන් මුදල් නෝට්ටු ප්‍රතිශතය 96.1% කි.

2000 අගෝස්තු මස ශ්‍රී ලංකා මහ බැංකුවේ 50 වන සංවත්සරය සැමරීම සඳහා රුපියල් 1,000 ක වටිනාකමින් යුත් විශේෂ රිදී කාසියක් බැංකුව විසින් නිකුත් කරන ලදී. කාසියේ මුහුණත ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිල්ල දිස් වන අතර එහි පසුපස මැද සූර්යයා සංකේතවත් කරන රූප සටහනක්ද, පරිධිය ඔස්සේ අෂ්ට මංගල නමින් හැඳින්වෙන සුබ සංකේත අටක් ද දක්වේ.

2000 වර්ෂයේ දෙසැම්බර් මස යෙදුනු ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වර්ණ ජයන්තිය සැමරීම සඳහා රුපියලක වටිනාකමින් යුත් විශේෂ කාසියක් නිකුත් කරන ලදී. මෙම විශේෂ කාසි තඹ නිකල් ලෝහයෙන් සහ නිකල් ආලේපිත වානේ ලෝහයෙන් නිමවා ඇත.

2001 වර්ෂයේ මාර්තු මාසයේ යෙදෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පනස්වන සංවත්සරය සඳහාද රුපියලක වටිනාකමින් යුත් විශේෂ කාසියක් නිකුත් කිරීමට බැංකුව කටයුතු සලසා ඇත.

මහ බැංකුව විසින් මෙතෙක් නිකුත් කරන ලද මහජනයාට අලෙවිය සඳහා ඉතිරිව ඇති සමරු කාසි පිළිබඳ විස්තර, විකුණුම් මිලද සහිතව II-5 සටහනෙහි දක්වේ.

ශතයේ සිට රුපියල් දහය දක්වා වටිනාකමින් යුත් සංසරණයට නිකුත් කරන ලද කාසි අඩංගු නව අසුරණයක් බැංකුව විසින් නිකුත් කරන ලදී. පිරමීඩාකාර හැඩයෙන් යුත් මෙම අසුරණය මේස රඳවනයක් ලෙස නිමවා ඇති අතර, එය විශේෂයෙන් කාසි එකතු කරන්නන් සඳහා අලෙවි කෙරේ.

මහ බැංකුවේ පනස්වන සංවත්සරය නිමිත්තෙන් ජී.පී.එස්.එච්.ද සිල්වා මහතා විසින් රචිත" History of Coins and Currrency in Sri L anka " යන ග්‍රන්ථයේ සීමිත පිටපත් සංඛ්‍යාවක් බැංකුව විසින් ප්‍රකාශයට පත්

**II - 5 සංඛ්‍යා සටහන**

**විකිණීම පිණිස ඇති සමරු කාසි හා නෝට්ටු**

| අයිතම අංක | විස්තරය | නිකුත් කළ වර්ෂය | ලෝහය | විශ්කම්භය (මි.මී.) | බර (ග්‍රෑම්) | මුහුණත වටිනාකම (රු.) | විකුණුම් මිල (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලං.ම.බැ.40 සංවත්සරය (ප්ලාස්ටික් ඇසුරුම) | 1990 | රිදී | 38.61 | 28.28 | 500 | 500 |
| 2. | 5 වෙනි දකුණු ආසියානු ක්‍රීඩා තරගාවලිය (පෙට්ටිය සහිත) | 1991 | රිදී | 22.00 | 10.20 | 100 | 200 |
| 3. | ජනාධිපති ආර්.ප්‍රේමදාස (ප්ලාස්ටික් ඇසුරුම) | 1992 | තඹ-නිකල් | 25.40 | 7.13 | 1 | 250 |
| 4. | 2300 අනුබුදු මිහිඳු ජයන්තිය (පෙට්ටිය සහිත) | 1993 | රිදී | 38.61 | 28.28 | 500 | 700 |
| 5. | -එම- (ප්ලාස්ටික් ඇසුරුම) | 1993 | රිදී | 38.61 | 28.28 | 500 | 500 |
| 6. | එක්සත් ජාතීන්ගේ 50 වන සංවත්සරය (ප්ලාස්ටික් ඇසුරුම) | 1995 | නිකල්-පිත්තල | 23.50 | 9.50 | 5 | 200 |
| 7. | ශ්‍රී ලංකාවේ 50 වෙනි නිදහස් සංවත්සරය (පෙට්ටිය සහිත) | 1998 | කැරට් 22 රත්රන් | 22.05 | 7.98 | 5,000 | 8,000 |
| 8. | -එම- (පෙට්ටිය සහිත) | 1998 | රිදී | 38.61 | 28.28 | 1,000 | 1,200 |
| 9. | -එම- (නෝට්ටු ෆෝල්ඩරය) | 1998 | පොලිමර් | | | 200 | 400 |
| 10. | ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය 1996 (පෙට්ටිය සහිත) | 1999 | රිදී | 38.61 | 28.28 | 1,000 | 1,200 |
| 11. | ශ්‍රී ලං.යු.හ. 50 සංවත්සරය විශේෂ කාසිය (පෙට්ටිය සහිත) | 1999 | නිකල් ආලේපිත වානේ | 25.40 | 7.13 | 1 | 400 |
| 12. | -එම- විශේෂ කාසිය (පෙට්ටිය සහිත) | 1999 | | 25.40 | 7.13 | 1 | 150 |
| 13. | ශ්‍රී ලංකා මහ බැංකුවේ 50 වන සංවත්සරය (පෙට්ටිය සහිත) | 2000 | රිදී | 38.61 | 28.28 | 1,000 | 1,200 |
| 14. | ශ්‍රී ලං.නා.හ. 50 වන සංවත්සරය (පෙට්ටිය සහිත) | 2000 | තඹ-නිකල් | 25.40 | 7.13 | 1 | 500 |
| 15. | -එම- විශේෂ කාසිය (පෙට්ටිය සහිත) | 2000 | නිකල් ආලේපිත වානේ | 25.40 | 7.13 | 1 | 200 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කරන ලදී. ක්‍රි.පූ. තුන්වන සියවසේ සිට ක්‍රි.ව. 21 වන සියවස ආරම්භය දක්වා, කාසි හා නෝට්ටු රූපසටහන්ද සහිතව ශ්‍රී ලංකා මුදලේ ඉතිහාසය සඳහන් එකම ග්‍රන්ථය මෙය වේ. මෙය නානක විද්‍යාව හදරන ශිෂ්‍යයන්ට, මුදල් එකතු කරන්නන්ට හා මහජනතාවට ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් වන අතර, 2001 වසරේ මුල් භාගයේදී එහි සංශෝධිත මුද්‍රණයක් මහජන අලෙවිය සඳහා නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

1992 වර්ෂයේදී ස්ථාපිත කරන ලද මුදල් තේරීමේ හා ගණන් කිරීමේ ස්වයංක්‍රීය යන්ත්‍රණ පද්ධති දෙක වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු යොදන ලදී. වැඩි දියුණු කල පසු එහි ධාරිතාව නව CSI ස්වයංක්‍රීය යන්ත්‍ර පද්ධතියක ධාරිතාවට සමාන වනු ඇති අතර එමගින් දෙපාර්තමේන්තුවේ මුදල් තේරීමේ වැඩ කටයුතු පහසු කෙරෙනු ඇත.

පාසල් සිසුන්, රජයේ සේවකයින් හා මහජනතාව ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සම්මන්ත්‍රණ පවත්වන ලදී.

2000 වර්ෂය අග භාගයේදී දිවයිනේ පූජනීය ස්ථානයන්හි එකතු වී තිබූ කාසි එකතු කිරීමේ ව්‍යාපෘතියක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ කාසි දශ ලක්ෂ 6.4 ක් එකතු කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මෙම කාසි ප්‍රමාණය ටංකනය කලේ නම් ඒ සඳහා දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 15.5 ක් පමණ වියදම් වේ. ව්‍යාපෘතිය සඳහා වියදම් වූ පිරිවැය අඩු කල විට මෙමගින් බැංකුවට දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 15.3 ක මුදලක් ඉතිරි කිරීමට හැකි විය.

මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යන ලද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශ 2000 මාර්තු මස ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ගොඩනැගිල්ලේ ස්ථානගත කරන ලදී. මුදල් හුවමාරු කවුන්ටර අංශය සිය කටයුතු යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. අනුරාධපුර සහ මාතර ප්‍රාදේශීය කාර්යාලයන්හි මුදල් මෙහෙයුම් අංශ අදළ ප්‍රාදේශිකයන්හි සිය කටයුතු පවත්වා ගැණිනි.

## බැංකු අධීක්ෂණ

බැංකු ආයතනයන්ට අදළව මහ බැංකුව විසින් සිදු කෙරෙන මෙහෙයුම් හා අධීක්ෂණ කාර්යය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉටු කෙරේ. බැංකු පනත හා මුදල් නීති පනත යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම කටයුතු සිදු කෙරේ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් හා අධීක්ෂණය යටතට ගැනෙන බැංකු ආයතනය වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුය. මෙහෙයුම් හා අධීක්ෂණයේ පරමාර්ථය වනුයේ බැංකු ක්‍රමයේ සුරක්ෂිතතාවය හා යහපත් පැවැත්ම සහතික කිරීම සහ තැන්පතු කරුවන්ගේ අයිතීන් සුරැකීම සඳහා ක්‍රමවත් අයුරින් බැංකු කටයුතු සිදු කිරීම සහතික කර දීමය. පසුගිය වසරවලදී මෙන්ම, මෙම වසරේදීද බැංකු දුරස්ථව පරීක්ෂා කිරීම හා කාලීනව සිදු කෙරෙන එතැන් පරීක්ෂණ මගින් මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදු කෙරිණි. මීට අමතරව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් බැංකු කටයුතුවලට අදළව නිසි විධානයන් හා මාර්ගෝපදේශ නිකුත් කළ අතර ස්වෙච්ඡාමය තැන්පතු රක්ෂණ ක්‍රමයද පරිපාලනය කෙරිණි. බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත 2000 ජූලි මාසයේදී බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවරා දීමෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු තවදුරටත් පුළුල් විය. ඒ අනුව, බැංකු සඳහා බලපත් ලබා දීම හා ඒවා වසා දැමීමත්, බැංකු ශාඛා කාර්යාල හා වෙනත් ගණුදෙනු සේවා කාර්යාල විවෘත කිරීම, වසා දැමීම හා ප්‍රතිස්ථානගත කිරීම පිළිබඳවත් නිර්දේශ කිරීම 2000 වසරේ සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යයක් බවට පත් විය.

## නව බැංකු හා බැංකු ශාඛා සඳහා අනුමැතිය

දේශීයව සංස්ථාපිත බැංකු ආයතනයක් වූ සීමාසහිත සෙලින්කෝ සේවිංස් බැංකුවට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස කටයුතු කිරීම සඳහා බැංකු පනතේ 76 ඇ වගන්තිය යටතේ 2000 වසරේදී බලපත්‍රයක් නිකුත් කරන ලදී. තවද, දේශීයව සංස්ථාපිත විශේෂිත බැංකුවක් වූ සීමාසහිත එන්.ඩී.බී. නිවාස බැංකුවට, නිවාස මූල්‍ය කටයුතුවල නිරත වීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. 1881 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පැවැති විදේශීය බැංකු ශාඛාවක් වූ සීමාසහිත ANZ ග්‍රින්ඩ්ලේස් බැංකුව, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත පවරා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් " සීමාසහිත ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් ග්‍රින්ඩ්ලේස්" බැංකුව වශයෙන් සිය නම වෙනස් කරන ලදී. පසුගිය වසරේදී බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සීමාසහිත නැෂනල් මර්කන්ටයිල් බැංකුව 2000 මැයි මාසයේදී ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලදී. වසර අවසාන වනවිට බලපත්‍රලාභී වාණිජ බැංකු 26 ක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 12 ක් ක්‍රියාත්මකව පැවති අතර එම බැංකු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ පැවතිණ.

වර්ෂය තුළදී ශාඛා කාර්යාල 24 ක්, ව්‍යාප්ති කාර්යාල 22 ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 49 ක් හා එක් විදේශීය නියෝජිත කාර්යාලයක් විවෘත කිරීම සඳහා අදළ වාණිජ බැංකුවලට අනුමැතිය දෙන ලදී. එසේම ශාඛා කාර්යාල 53 ක ස්ථාන වෙනස් කිරීම සඳහාද බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකුවලට අවසර දෙන ලදී.

පරිපාලිත සමාගම්වල ආයෝජනය කිරීම, නව මූල්‍ය නිපැයුම් වෙළඳපොළට නිකුත් කිරීම හා සංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම යනාදිය සඳහා අනුමැතිය ඉල්ලමින් වාණිජ බැංකු විසින් කරන ලද ඉල්ලීම් ගණනාවක් සම්බන්ධයෙන්ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

## විධිමත් රෙගුලාසි හා නියෝග

1995 අංක 33 දරණ බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධානයන් යටතේ වරින්වර හඳුන්වා දෙන ලද මෙහෙයුම් අවශ්‍යතාවන්ට අනුකූලව බැංකු ආයතන කටයුතු කරන්නේද යන්න බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිති පරීක්ෂාවට ලක් විය.

**මෙම අවශ්‍යතාවයනට අදළ අංගයන් වූයේ -**

(i) අවම ප්‍රාග්ධන අනුපාතයන් පවත්වා ගැනීම

(ii) අවම ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වා ගැනීම

(iii) තනි පුද්ගලයකු සඳහා වූ උපරිම ණය සීමාව අනුගමනය කිරීම

(iv) බැංකුවල කොටස් අයිතිය සඳහා වූ සීමාවන්

(v) ලැයිස්තුගත පොදු සමාගම් හා පෞද්ගලික සමාගම්හි සාමාන්‍ය කොටස්වල බැංකු විසින් ආයෝජන කිරීම පිළිබඳ සීමාවන්

(vi) අක්‍රිය අත්තිකාරම් වර්ගීකරණය, අක්‍රිය අත්තිකාරම් සඳහා වූ පොලී අත්හිටුවීම සහ බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම්

(vii) බැංකුවල අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥාතීන්ට හා ඔවුන්ට සම්බන්ධතාවයක් ඇති පාර්ශවයනට දෙනු ලබන ණය පහසුකම් පිළිබඳ සීමාවන්

(viii) බැංකු විසින් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම හා මිලදී ගැනීම

(ix) විගණනය නොකළ අර්ධ වාර්ෂික ගිණුම් හා විගණනය කළ වාර්ෂික ගිණුම් ප්‍රවෘත්ති පත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීම හා

(x) විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් නියමිත වේලාවට මහ බැංකුවට ඉදිරිපත් කිරීම යනාදියයි.

## 2000 වසර තුළදී බැංකු පනත යටතේ නිකුත් කළ විධානයන්

විමසුමට ලක් වන වසර තුළදී පහත සඳහන් මුදල් මණ්ඩල නියෝග හා විධිවිධානයන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.

(i) බලපත්‍රලාභී බැංකුවක කොටස් ප්‍රාග්ධනයෙහි විදේශීය දයකත්වයේ උපරිම සීමාව පිළිබඳව 1988 අංක 30 දරණ බැංකු පනතේ 19 (4) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය :

ඒ අනුව 2000 පෙබරවාරි 14 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ බලපත්‍රලාභී බැංකුවක කොටස් ප්‍රාග්ධනයෙහි තිබිය හැකි සමස්ත විදේශීය දයකත්වය සියයට 49 සිට සියයට 60 දක්වා වැඩි කරනු ලැබීය.

(ii) ප්‍රාග්ධන අනුපාතයන් පවත්වාගෙන යාම සංශෝධනය කිරීමට අදළ විධානයන් 2000 නොවැම්බර් 29 දිනදී බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කරන ලදී. ඒ අනුව, 2001 ජනවාරි මස 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවදනම් මත බර තැබූ වත්කම් වලින් සියයට 4.5 කට නොඅඩු මූලික ප්‍රාග්ධනයක් සහිත අවම වශයෙන් අවදනම් මත බර තැබූ වත්කම් වලින් මෙන් සියයට 9 කට නො අඩු ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අනුපාතයක් පවත්වා ගැනීමට බැංකුවලට නියම කෙරින. 2002.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පවත්වා ගත යුතු අවම මුළු ප්‍රාග්ධන අනුපාතය සියයට 10 ක් වන අතර, අවම මූලික ප්‍රාග්ධන අනුපාතය සියයට 5 ක් වේ.

(iii) බැංකු පනතේ 23, 25 හා 26 වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව වාණිජ බැංකු විසින් පවත්වාගෙන යන එතෙර බැංකු කටයුතු පිළිබඳව මුදල් මණ්ඩලය විසින් ගරු මුදල් අමාත්‍යතුමියගේ අනුමැතිය සහිතව 2000.04.07 දිනදී නියෝගයක් පනවන ලදී. මෙම නියෝගය මගින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලට (FCBUs) ඒවායේ අනුමත ව්‍යාපාරික කටයුතු, (නේවාසිකයන් සමග කිරීමට අනුමත ව්‍යාපාරික කටයුතුද ඇතුළත්ව) එම බැංකු මගින් පවත්වාගෙන යනු ලබන ගිණුමක මුදල් තැන්පත් කිරීම සහ ආපසු ගැනීම, ගිණුම් පොත් සහ වාර්තා පවත්වාගෙන යාම, එම බැංකු ඒකකවල විධායක නිලධාරීන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද යන කරුණු ආශ්‍රිතව උපදෙස් නිකුත් කරන ලදී.

## දුරස්ථ පරීක්ෂණ ක්‍රමය

දුරස්ථ පරීක්ෂණ ක්‍රමය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකු මගින් කාලීනව ඉදිරිපත් කරන තොරතුරු පදනම් කර ගනිමින් එම බැංකුවල මූල්‍ය තත්ත්වයන් පිළිබඳ පරීක්ෂාකාරී වීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. බැංකු විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතු ප්‍රධාන වාර්තා නම්, වත්කම් හා වගකීම් සහ ද්‍රවශීල වත්කම් පිළිබඳ මාසික ප්‍රකාශනය; ප්‍රාග්ධන අවශ්‍යතාවයන්,

ආදායම් හා වියදම්, අක්‍රීය අත්තිකාරම්, අධ්‍යක්ෂවරුන්ට දෙන ලද ණය හා ආයෝජන පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශන හා විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ගිණුම්ය.

මෙසේ රැස් කර ගන්නා තොරතුරු බැංකු කටයුතුවල උපනතීන් හා විචලනයන් හඳුනා ගැනීම සඳහා විග්‍රහයකට ලක් කරන අතර, එක් එක් බැංකුවක මූල්‍ය තත්ත්වය අදාළ බැංකු කාණ්ඩය හා බැංකු ක්ෂේත්‍රය සමග සසඳනු ලැබේ. මෙම තොරතුරු සියුම් ලෙස පරීක්ෂාවට ලක් කිරීම මගින් වැදගත් මෙන්ම අසාමාන්‍ය වෙනස්වීම් හඳුනා ගැනීමට හැකි වන අතර, යම් බැංකුවක ඇති දුර්වලතාවයක් පිළිබඳව හෝ තවදුරටත් විමර්ශණයක් හෝ පරීක්ෂණයක් අවශ්‍ය අංශයන් පිළිබඳ පූර්ව දැනුම් දීමේ ක්‍රමයක් වශයෙන් යොදා ගැනීමටද හැකියාව ලැබේ. එවැනි නිරීක්ෂණයන් පදනම් කර ගනිමින්, ඉහත අඩුපාඩු නිසා ඇති වන අහිතකර බලපෑම් වළකනු පිණිස බැංකු විසින් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගත යුතුව ඇත.

විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල කටයුතු මෙහෙයවීම සිදු කෙරෙනුයේ එම ඒකකවල වත්කම් හා වගකීම්, ඒවායේ කල් පිරීමේ රටාව සහ ආදායම් හා වියදම් පිළිබඳ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන තොරතුරු පදනම් කර ගනිමිනි.

මීට අමතරව රජය හා රාජ්‍ය වාණිජ බැංකු දෙක අතර අත්සන් කැරුණු සාමූහික කතිකාවත් (MOU) යටතේ ළඟා කර ගත යුතු ඉලක්කයන් සපුරා ගැනීම සනාථ කරනු පිණිස ඒවායේ ප්‍රගතිය ත්‍රෛමාසිකව විමසුමට ලක් කිරීමද නොකඩවා සිදු විය.

2000 වර්ෂයේදී විවිධ අංශයන් තුළින් දුරස්ථ පරීක්ෂණ කිරීමේ ක්‍රමය දියුණු කිරීමේ ක්‍රියාවලියෙහි බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව නිරත විය. මෙයට, සේවක මණ්ඩලය වැඩි කිරීම, පරීක්ෂණ හැකියාවන් උසස් මට්ටමකට ගෙන ඒම සඳහා පුහුණුව ලබා දීම සහ දුරස්ථව සිදු කෙරෙන විග්‍රහයන්ගේ ගුණාත්මක භාවය දියුණු කිරීම, රැ ස් කර ගන්නා තොරතුරු සැකසීම හා ඉදිරිපත් කිරීම වේගවත් කිරීමද ඇතුළත් වේ. ස්වීඩන් රජයේ මූල්‍යාධාර සහිතව ක්‍රියාත්මක කළ තාක්ෂණික සහයෝගතා ව්‍යාපෘතියේ (සීඩා ව්‍යාපෘතිය) දෙවන අදියරෙහි පුහුණු කිරීමේ කොටස 2000 වසරේ මැද භාගයේදී අවසන් කෙරිණි. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් යොමු කෙරුනේ දැනට භාවිතා කෙරෙන කැමල් (CAMEL) ප්‍රමිතීන්වලට (ප්‍රාග්ධනය, වත්කම්වල ගුණාත්මක භාවය, කළමනාකාරිත්වය, ඉපැයීම් හා ද්‍රවශීලතාවය) ව්‍යතිරේකයක් ලෙස, අවදානම් පදනම් කර ගත් අධීක්ෂණ ක්‍රමයක් යොදා ගනිමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ ශිල්ප හා හැකියාවන් දියුණු කිරීම සඳහාය.

කිසියම් බැංකුවක කටයුතු සම්බන්ධ වන අවදානම් සහ එම අවදානම් දැරීමට බැංකුව සතු සම්පත් නිර්ණය කිරීම සඳහා මෙම අධීක්ෂණ ක්‍රමය ප්‍රයෝජනවත් වේ. සීඩා ව්‍යාපෘතිය යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ දුරස්ථ අධීක්ෂණ ක්‍රියාවලියෙහි මෙන්ම එතැන් පරීක්ෂණ ක්‍රියාවලියෙහි නියැලෙන කාර්යය මණ්ඩලයෙහි අධීක්ෂණ හැකියාවන් දියුණු කිරීම සඳහා විවිධ ශිල්පීය ක්‍රම යෝජනා කෙරිණි. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2000 වසර තුළදී පියවර ගන්නා ලදී.

විමසුමට ලක් වන වසර තුළදී මහ බැංකු අධිපති සහ මහ බැංකු කාර්ය මණ්ඩලය බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් හා මාසිකව සාකච්ඡා පැවැත්වූහ. මෙම රැස්වීම්, බැංකු කටයුතු පිළිබඳ විවිධ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අදහස් හුවමාරු කර ගැනීමට වේදිකාවක් වශයෙන් යොදා ගැණුනු අතර, බැංකු හා මහ බැංකුව අතර සමීප සම්බන්ධතාවක් ගොඩ නැංවීමටද උපකාරී විය.

## එතැන් පරීක්ෂණ

මුදල් නීති පනතේ විධිවිධානයන් යටතේ සියළුම බැංකු ආයතන කාලීන පරීක්ෂණයන්ට එනම්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන එතැන් පරීක්ෂාවන්ට යටත් වේ. දැනට සෑම බැංකුවක්ම දෙවසරකට වරක් පරීක්ෂාවට ලක් කෙරේ. ඒ අනුව, මෙම පරීක්ෂණය මගින් එකිනෙක බැංකුවෙහි ප්‍රාදේශීය ව්‍යාප්තිය හා ව්‍යාපාරික කටයුතු පරිමාව අනුව ප්‍රධාන කාර්යාලය හා තෝරා ගත් ශාඛා කිහිපයක්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන් විසින් විසිත්ත කොට පරීක්ෂාවට ලක් කෙරේ.

එතැන් පරීක්ෂාවන්ගේ ස්වභාවය හා රාමුව මූලික වශයෙන් බැංකුවල ගිණුම්, පොත් හා වාර්තා වලින් ලබා ගන්නා තොරතුරු මගින් බැංකුවල වත්කම්වල ගුණාත්මක භාවය තක්සේරු කිරීමකට හා ඒවායේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සමස්ත අගැයීමකට සීමා වේ. ණය පැහැර හැරීමේ අවදානම (ණය අවදානම), වෙළඳපළ අවදානම, ද්‍රවශීලමය අවදානම, මෙහෙයුම් අවදානම වැනි විවිධ අවදානම්වලට බැංකු විසින් මුහුණ දීමේ ප්‍රමාණය හා එවැනි අවදානම් දැරීම හා අවම මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවකට ඇති හැකියාවද බැංකුවක සමස්ත ඇගැයීමේදී තක්සේරු කරනු ලැබේ.එතැන් පරීක්ෂාවන්ගේ විෂය පථයෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, කළමනාකරණ ශක්තිය. ඉපැයීම් හා ද්‍රවශීලතාවය වැනි වෙනත් මූලික අංශයන්ද මෙහිලා ඇගයීමට ලක් කෙරේ. මීට අමතරව, ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සහ අදාළ නීති හා රෙගුලාසි අනුගමනය කළ ආකාරය හා බැංකු විසින් යොදා ගන්නා අභ්‍යන්තර පාලන විධි, ක්‍රම හා පිළිවෙත්ද පරීක්ෂාවට ලක් කෙරේ.

විමසුමට ලක් වන වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එතැන් පරීක්ෂණයන් 14 ක් ආරම්භ කළ අතර, එයට බලපත්‍රලාභී වාණිජ බැංකු 10 ක් හා විශේෂිත බැංකු 4 ක් ඇතුළත් විය. මීට අමතරව බලපත්‍රලාභී වාණිජ බැංකු 7 ක් හා විශේෂිත බැංකු 2 ක් සම්බන්ධයෙන් පසුගිය වසරේදී ආරම්භ කළ එතැන් පරීක්ෂාවන් 2000 වසර තුළදී නිම කරන ලදී.

## තැන්පතු රක්‍ෂණ ක්‍රමය පරිපාලනය කිරීම

1987 දී ආරම්භ කළ තැන්පතු රක්‍ෂණ ක්‍රමය බැංකු අධීක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කෙරේ. තැන්පතු භාර ගන්නා ඕනෑම ආයතනයකට විවෘත වූ මෙම තැන්පතු රක්‍ෂණ ක්‍රමය ස්වේච්ඡාමය පදනමකින් ක්‍රියාත්මක වේ. විවිධ සේවා සමුපකාර සමිති 4 ක් පමණක් ඔවුන්ගේ ග්‍රාමීය බැංකු වෙත වූ තැන්පතු සඳහා රක්‍ෂණ ආවරණ ලබා තිබේ. රක්‍ෂණ වාරිකය කාර්තුවකට රුපියල් 100 ට ශත 3.75 ක් වූ අතර, 2000 වසරේදී රක්‍ෂණ වාරික වශයෙන් තැන්පතු රක්‍ෂණ අරමුදලට එකතු වූ මුදල රුපියල් 11 ලක්‍ෂයක් විය. ඒ අනුව, 1997 දී මහ බැංකුව විසින් මෙම අරමුදලට වෙන් කළ රුපියල් දශ ලක්‍ෂ 50 ද ඇතුළුව 2000.12.31 දිනට පැවැති අරමුදල් ශේෂය රුපියල් දශ ලක්‍ෂ 102.9 ක් විය. මෙම අරමුදල් රුපියල් දශ ලක්‍ෂ 120.5 ක මුහුණත අගයක් සහිත භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත.

දනට ක්‍රියාත්මක වන ස්වෙච්ඡාමය තැන්පතු රක්‍ෂණ ක්‍රමය වෙනුවට අනිවාර්ය තැන්පතු රක්‍ෂණ ක්‍රමයක් පිහිටුවීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කාර්යසාධක බලකායක් පත් කර ඇත. මෙම කාර්ය සාධක බලකාය සිය නිර්දේශ 2001 වසරේ මුල් කාලයේදී ඉදිරිපත් කරනු ඇත.

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්‍ෂණ දෙපාර්තමේන්තුව, ලියාපදිංචි මූල්‍ය සමාගම් මහ බැංකුව විසින් නියම කර ඇති අවම විචක්ෂන නියමයන්ට අනුකූලත්වයක් දක්වන බව සහතික කිරීමේ අරමුණින් තවදුරටත් අධීක්ෂණ ක්‍රියාවලියෙහි නිරත විය. ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා, දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් මූල්‍ය සමාගම්වල එතැන් පරීක්ෂණ හා එකී සමාගම් විසින් සපයනු ලබන දත්ත විශ්ලේෂණය ඇසුරෙන් කරන ලද දුරස්ථ පරීක්ෂණ ක්‍රමය මගින් නිරන්තර අවධානයක් යොමු කරන ලදී.

1999 මාර්තු 31 දිනට හා 2000 මාර්තු 31 දිනට ලියාපදිංචි මූල්‍ය සමාගම් 25 හි ඒකාබද්ධ ශේෂ පත්‍රය සංඛ්‍යා II-6 සටහනෙහි දක්වේ. වර්ෂය තුළදී ලියාපදිංචි මූල්‍ය සමාගම්වල මුළු වත්කම් රුපියල් මිලියන 3,633 කින් වැඩි විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අත්තිකාරම් රුපියල් මිලියන 3,221 කින්ද, ද්‍රවශීල වත්කම් රුපියල් මිලියන 444 කින්ද වර්ධනය වීමයි. ප්‍රධාන වත්කම්වල සංයුතියේ කැපී පෙනෙන වෙනසක් සිදු නොවූවද, පසුගිය තුන් වසර අනුව යමින්, මෙම වසරේදීද කල් බදු මූල්‍යකරණය තවදුරටත් වර්ධනය විය. තැන්පතු හා ප්‍රාග්ධන අරමුදල් පිළිවෙලින් රුපියල් මිලියන 3,065 කින් හා රුපියල් මිලියන 391 කින් වැඩි විය.

## දුරස්ථ පරීක්ෂණ

මෙම කාලච්ඡේදය තුළදී, ලියාපදිංචි මූල්‍ය සමාගම් 25, මුදල් සමාගම් පනත යටතේ පනවා ඇති නියෝග හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට සහතික වනු වස්, එකී සමාගම් විසින් නිතිපතා සපයනු ලබන කාලීන වාර්තා විශ්ලේෂණය ඇසුරෙන් කෙරෙන නිරන්තර අවධානයෙන් සිටීම, දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මෙම වාර්තාවලට ද්‍රවශීල වත්කම් සතිපතා ප්‍රකාශන, දෙන ලද ඉහළ පරිමාණයේ අත්තිකාරම් පිළිබඳ මාසික වාර්තා, මාසික වත්කම් බැරකම් ප්‍රකාශන, ආපසු නොගෙවන ණය මුදල් පිළිබඳ ත්‍රෛමාසික වාර්තා සහ විගණනය කරන ලද වාර්ෂික ශේෂ පත්‍ර හා ගිණුම් ප්‍රකාශන ඇතුළත් විය. මූල්‍ය සමාගම්වල මූල්‍යමය තත්ත්වය වටහා ගැනීමේත්, එකී සමාගම්, මූල්‍ය සමාගම් පනතේ විධිවිධාන සහ පනත යටතේ පනවන ලද නියෝග සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර තිබේදැයි නිරීක්ෂණය කිරීමේත් අරමුණින්, මෙම වාර්තාවල සඳහන් තොරතුරු විශ්ලේෂණය කෙරිණ. අවම ප්‍රාග්ධනය, ද්‍රවශීල අනුපාතය, තනි පුද්ගල ණය සීමාව, බොල් හා අඩමාන ණය වෙන් කිරීම ආදී කරුණු නියෝගවලට ඇතුළත් විය. මෙම කාලය තුළ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ලාභදායිත්වය හා වර්ධනය, සමීපව නිරීක්ෂණය කිරීම මගින් අයහපත් වර්ධනයක් ඇත්දැයි හඳුනා ගැනීමට හා ඒවා වළක්වාලීමට කටයුතු යොදන ලදී.

## එතැන් පරීක්ෂණ

වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සමාගම් තුනක එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. එකී සමාගම්වල ප්‍රාග්ධනයෙහි ප්‍රමාණවත් බව, වත්කම්වල ගුණාත්මක භාවය, කළමණාකාරිත්වයේ කාර්යක්‍ෂමතාවය, ඉපැයීම් සහ ද්‍රවශීලතාවය අගැයීමට හැකි වනු පිණිස මූල්‍ය සමාගම්වල ගිණුම් පොත් හා වෙනත් වාර්තා පරීක්ෂා කොට, සමාගම්වල නිලධාරීන් සමග සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම අභ්‍යන්තර පාලන ක්‍රමවල සාර්ථකත්වය සහ මූල්‍ය සමාගම් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයනට අනුකූලව කටයුතු කර තිබේදැයි පරීක්ෂා කෙරිණ.

මීට අමතරව 2001 වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමට පෙර මූල්‍ය සමාගම්වල එතැන් පරීක්‍ෂණ සිදු කරනු ලැබීය. දුරස්ථ පරීක්‍ෂණ තුළින් හඳුනා ගත් දැඩි අවධානයට ලක් විය යුතු ඇතැම් අංශ මෙම එතැන් පරීක්‍ෂණවලදී විමර්ශනය කරනු ලැබිණ.

## දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්

2000 වසර අවසාන වනවිට, මූල්‍ය සමාගම් පණත යටතේ පරිපාලනය හා කළමණාකරණය මුදල් මණ්ඩලය වෙත පවරා ගනු ලැබූ මූල්‍ය සමාගම් 9 න්, සමාගම් 4 ක් ඇවර කිරීමේ කටයුතු කරගෙන යන ලදී. ඉතිරි සමාගම් පහේ පරිපාලනය සහ කළමණාකරණය කටයුතු තවදුරටත්

## II - 6 සංඛ්‍යා සටහන
## ක්‍රියාත්මක වන මුල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍රය

| | 1999.03.31 දිනට | | 2000.03.31 දිනට | |
|---|---|---|---|---|
| | රු. '000 | ප්‍රතිශතය % | රු. '000 | ප්‍රතිශතය % |
| වගකීම් | | | | |
| ප්‍රාග්ධන අරමුදල් | | | | |
| නිකුත් කළ ප්‍රාග්ධනය | 658,587 | | 660,920 | |
| කොටස් අධි මිල | 190,546 | | 212,546 | |
| ප්‍රාග්ධන සංචිතය | 892,553 | | 882,450 | |
| පොදු සංචිතය | 1,317,166 | | 1,552,157 | |
| සංචිත අරමුදල | 543,740 | | 623,108 | |
| වෙනත් සංචිත | 47,469 | | 74,147 | |
| ලාභාලාභ ගිණුමේ ශේෂය | 67,736 | | 101,643 | |
| දළ ප්‍රාග්ධන අරමුදල | 3,717,797 | | 4,106,971 | |
| අඩු කළා : විලම්බිත ගෙවුම් | 6,775 | | 5,038 | |
| ශුද්ධ ප්‍රාග්ධන අරමුදල | 3,711,022 | 13.47 | 4,101,933 | 13.15 |
| බොල් හා අඩමාන ණය වෙන් කිරීම | 1,072,820 | 3.89 | 1,211,151 | 3.88 |
| මහජන තැන්පතු | 16,970,850 | 61.58 | 20,035,593 | 64.23 |
| ණය | | | | |
| බැංකු අයිරා | 882,742 | | 529,243 | |
| වෙනත් | 1,485,925 | | 1,610,897 | |
| මුළු ණය | 2,368,667 | 8.59 | 2,140,140 | 6.86 |
| වෙනත් වගකීම් | 3,437,024 | 12.47 | 3,704,556 | 11.88 |
| මුළු එකතුව | 27,560,383 | 100.00 | 31,193,373 | 100.00 |
| වත්කම් | | | | |
| ද්‍රවශීල වත්කම් | | | | |
| අතැති මුදල් හා බැංකු ශේෂය | 408,663 | | 392,538 | |
| ස්ථාවර තැන්පතු | 575,544 | | 617,718 | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,095,626 | | 2,513.731 | |
| මුළු ද්‍රවශීල වත්කම් | 3,079,833 | 11.17 | 3,523,987 | 11.30 |
| ආයෝජන | | | | |
| ආශ්‍රිත සමාගම් හා පාලිත සමාගම් වල කොටස් | 724,817 | | 709,474 | |
| අනුබද්ධ සමාගම්වල කොටස් | 281,291 | | 273,846 | |
| වෙනත් සමාගම්වල කොටස් | 627,878 | | 611,975 | |
| වෙළෙඳ ආයෝජන | 251,362 | | 241,612 | |
| මුළු ආයෝජන | 1,885,348 | 6.84 | 1,836,907 | 5.89 |
| අත්තිකාරම් | | | | |
| ණය | 1,240,181 | | 1,900,054 | |
| කුලී සින්නක්කර ණය | 2,232,039 | | 2,489,631 | |
| කල් බදු ණය | 11,117,742 | | 13,201,154 | |
| නිශ්චල දේපල ණය | 1,648,635 | | 1,907,683 | |
| වෙනත් අත්තිකාරම් | 1,730,795 | | 1,691,997 | |
| මුළු අත්තිකාරම් | 17,969,392 | 65.20 | 21,190,519 | 67.93 |
| ස්ථාවර වත්කම් | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,725,353 | | 1,732,633 | |
| ගෘහ භාණ්ඩ සවි කිරීම හා කාර්යාලයීය උපකරණ | 242,163 | | 294,325 | |
| මෝටර් රථ | 188,677 | | 184,015 | |
| යන්ත්‍රසූත්‍ර | 1,998 | | 1,320 | |
| බදු සින්නක්කර | 57,811 | | 55,150 | |
| වෙනත් | 60,014 | | 59,106 | |
| මුළු ස්ථාවර වත්කම් | 2,276,016 | 8.26 | 2,326,549 | 7.46 |
| වෙනත් වත්කම් | 2,349,794 | 8.53 | 2,315,411 | 7.42 |
| මුළු එකතුව | 27,560,383 | 100.00 | 31,193,373 | 100.00 |
| වාර්තා කළ සමාගම් ගණන | 25 | | 25 | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් මණ්ඩලය යටතේ පැවතිණ. වර්ෂය තුළදී, එක් සමාගමක් ඈවර කිරීම සඳහා අයදුම්පතක් උසාවිය වෙත ඉදිරිපත් කරන ලද අතර, අසාර්ථක වූ එහෙත් මුදල් මණ්ඩලය වෙත පවරා නොගෙන, මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලද තවත් එක් සමාගමක් සඳහා ඈවරකරුවෙකු පත් කරන ලදී.

මුදල් මණ්ඩලය වෙත පවරා ගන්නා ලද සමාගම් පහෙන් තුනක තැන්පතුකරුවන් සඳහා සහන ක්‍රමය යටතේ තැන්පතු මුදල් ආපසු ගෙවීම වසර තුළදී සිදු විය. එවැනි එක් සමාගමක් තැන්පතුකරුවන්ට සහන සැළසීමේ ක්‍රමය යටතේ මුල් තැන්පතුවෙන් සියයට 15 ක් ගෙවූ අතර, තවත් සමාගමක් විසින් මුළු මුල් මුදලම ගෙවන ලදී. තෙවන සමාගම විසින් සම්පූර්ණ මුල් මුදලම ප්‍රතිශෝධිත පොලියද සමග ගෙවාගෙන යන ලදී. ඉකුත් වසරවලදී ප්‍රතිමූල්‍ය ණය වශයෙන් ලබා දුන් මුදල් සහ සමාගම්වල වත්කම් විකිණීමෙන් හා ණය ආපසු අය කර ගැනීමෙන් ලබා ගත් මුදල් මෙම සහන ගෙවීම් සඳහා යොද ගැනිණ. වසර තුළදී අනෙක් සමාගම් දෙකෙහි තැන්පතුකරුවන් සඳහා ගෙවීම් සිදු නොකෙරිණ. එක් මූල්‍ය සමාගමක මුදල් ඉතිරිව නොතිබීමත්, අනෙක් සමාගම ඈවර කිරීමේ කටයුතු අරඹා තිබීමත් නිසා තැන්පතුකරුවන් වෙත තවදුරටත් මුදල් ආපසු ගෙවීමට නොහැකි විය.

මූල්‍ය සමාගම් හතරක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අය විය යුතුව ඇති මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය හා සමුච්චිත පොලියද, දැරීමට සිදු වූ පරිපාලන වියදම් වෙනුවෙන් මහ බැංකුවට අය විය යුතු මුදල්ද ඉල්ලා, වසර තුළදී පත් කරන ලද ඈවරකරුවන් වෙත හිමිකම්පෑම් ඉදිරිපත් කරන ලදී. වසර තුළදී ප්‍රතිමූල්‍ය පහසුකම් සලසන ලද අනෙකුත් මූල්‍ය සමාගම් අතුරින් එක් සමාගමක් රුපියල් මිලියන 0.3 ක් මහ බැංකුවට ආපසු ගෙවා ඇත. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව සමග කලින් ඇති කර ගත් ගිවිසුමක් පරිදි, එක් රාජ්‍ය බැංකුවක් විසින් දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගමක් වෙත දෙනු ලැබූ ණය පහසුකමක් වෙනුවෙන් රුපියල් මිලියන 50 ක ප්‍රතිමූල්‍ය ලබා ගන්නා ලදී.

## ප්‍රතිපත්ති හඳුන්වා දීම

මූල්‍ය සමාගම්වල ණය දීම්, ද්‍රවශීල වත්කම්, තැන්පතු සහ කොටස් ආයෝජනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති නියෝග සංශෝධනය පිළිබඳව වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මූල්‍ය ආයතන සංගමය සමග සාකච්ඡා වට කිහිපයක්ම පවත්වන ලදී. තවද, 2000 අගෝස්තු මස සම්මත වූ 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කල්බදු සංගමයේ සහ මූල්‍ය ආයතන සංගමයේ සාමාජිකයන්ගේ අදහස්ද විමසන ලදී.

## සංවර්ධන මුදල්

සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

i. විදේශීය ණය මූලයන්ගෙන් ලැබෙන ණය මුදල් සහභාගිත්ව ණය දෙන ආයතන මගින් ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නැවත ප්‍රදානය කිරීම.

ii. මෙම ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා මුද හරිනු ලබන ණය මුදල් වෙනුවෙන් සහභාගිත්ව ණය දෙන ආයතනවලට ඇප ආවරණ සහතික නිකුත් කිරීම, ඇප ආවරණ වාරික මුදල් එකතු කිරීම සහ එම ඇප ආවරණ අරමුදල් පරිපාලනය කිරීම.

iii. ණය පැහැර හැරීම වැළැක්වීම සහ ණය අරමුදල් මනා ලෙස උපයෝගී කර ගැනීම තහවුරු කිරීම සඳහා එම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහ ව්‍යාපෘති පරීක්ෂණ සිදු කිරීම.

නාගරික සංවර්ධනය හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නිවාස ණය ව්‍යාපෘතිය සහ වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ණය මුද හැරීම් කටයුතු නිසා සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු 2000 වර්ෂය තුළදීද තවදුරටත් පුළුල් විය.

1999 වර්ෂයේ මුල් භාගයේදී ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය යටතේ ලැබුණු ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 20 ක ණය මුදල ආශ්‍රයෙන් නාගරික සංවර්ධනය හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නිවාස ණය ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි කටයුතු 1999 වර්ෂය තුළදී මන්දගාමී වූ අතර ඊට බලපෑ ප්‍රධාන හේතුව වූයේ ප්‍රමාණවත් මූල්‍ය ආයතන සංඛ්‍යාවක් එම ව්‍යාපෘතිය යටතේ සහභාගී වීමට සුදුසුකම් ලබා නොතිබීමය. කෙසේ වුවද, 2000 වර්ෂයේ ජූලි මාසයේදී තවත් මූල්‍ය ආයතන තුනක් සහභාගිත්ව ණය දෙන ආයතන වශයෙන් ඇතුළත් කර ගැනීමත් සමගම 2000 වර්ෂය තුළදී විශාල ණය මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කරන ලදී. 2000 වර්ෂය තුළදීද වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ණය අරමුදල් මුද හැරීම තවදුරටත් ක්‍රියාත්මක විය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ (සුමදි) ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන විසින් අනුමත කරනු ලැබූ සියළුම ණය ශේෂයන් උපයෝගී කර ගැනීම නිසා එම දෙපාර්තමේන්තුව මගින් ඇප ආවරණ සහතික නිකුත් කිරීම 2000 වර්ෂය තුළදී නිමාවට පත් කරන ලදී. කෙසේ වුවද වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ මුද හරින ලද ණය මුදල් වෙනුවෙන් ඇප ආවරණ සහතික තවදුරටත් නිකුත් කෙරමින් පවතී.

මෙම දෙපාර්තමේන්තුව විසින් ඇප ආවරණ සහතික සපයනු ලැබූ, නිමාවට පත් වී ඇති ණය යෝජනා ක්‍රම සහ දනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ව්‍යාපෘති පරීක්ෂා කිරීම් සහ පසු විපරම් කිරීමේ කටයුතුද මෙම වර්ෂය තුළදී තවදුරටත් සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්ය භාරය සවිස්තරාත්මකව පහත දක්වේ.

## වර්තමාන ණය ව්‍යාපෘති

### වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (වැ.ප්‍ර.ව්‍යා.)

1999 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ අනුමත වූ මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,513 ක් වූ අතර 2000 වර්ෂය අවසානය වනවිට එය රුපියල් දශ ලක්ෂ 1,211 ක් විය. ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ජපාන බැංකුව මගින් ලබා දෙනු ලැබූ ණය මුදල් පෙර වර්ෂවලදී උපරිම ලෙස උපයෝගී කර ගත් බැවින් (සියයට 90 ක් පමණ) 2000 වසර තුළදී ණය අනුමත කිරීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, 2000 වර්ෂය අවසානයට ප්‍රතිමූල්‍ය මුද හැරීම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,300 ක් වූ අතර, ඒ සඳහා පෙර වර්ෂයේදී අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ණයද ඇතුළත් විය. 1996 සිට 2000 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ මුද හරින ලද අරමුදල්වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,677 ක් විය. ණය අනුමත කිරීම් හා මුද හැරීම් පිළිබඳ විස්තර පහත දක්වෙන II-7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

පසුගිය වර්ෂවලදී මෙන්ම වැඩි වටිනාකමකින් යුත් ණය මුදල වූ රුපියල් දශ ලක්ෂ 885 ක් අනුමත කර ඇත්තේ වැවිලි බෝග සංවර්ධන අංශයට වන අතර, 2000 දී එම අංශය සඳහා මුදා හැර ඇති ණය මුදල් ප්‍රමාණය පසුගිය වර්ෂයේ අනුමත කළ ණය ප්‍රමාණයෙන් කොටසක්ද ඇතුළුව රුපියල් දශ ලක්ෂ 947 ක් විය. සැකසීම් වැඩි දියුණු කිරීම හා පරිසර දූෂණය පාලනය කිරීම සඳහා මෙම ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 270 ක් අනුමත කළ අතර, රුපියල් දශ ලක්ෂ 271 ක් මුදා හැර ඇත. එසේම සේවා වාහන හා උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් දශ ලක්ෂ 56 ක ප්‍රතිමූල්‍ය ණය අනුමත කර ඇති අතර, මුදා හරිනු ලැබූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 82 ක් විය.

මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටින සහභාගිත්වය ණය දෙන ආයතන අතරින් සීමාසහිත සෙලාන් බැංකුව විසින් 2000 වර්ෂය තුළදී ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත රුපියල් දශ ලක්ෂ 368 ක් හෙවත් මුළු මුදා හැරීම් වලින් සියයට 28.3 ක් වූ වැඩිම ණය මුදල් ප්‍රමාණයක් මුදා හැර ඇත. ඩී.එෆ්.සී.සී. බැංකුව, ලංකා බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 362 (සියයට 27.9), රුපියල් දශ ලක්ෂ 208 ක් (සියයට 16), රුපියල් දශ ලක්ෂ 146 ක් (සියයට 11.2), රුපියල් දශ ලක්ෂ 94 ක් (සියයට 7.2), රුපියල් දශ ලක්ෂ 73 ක් (සියයට 5.6) සහ රුපියල් දශ ලක්ෂ 50 (සියයට 3.8) ක් 2000 වර්ෂය තුළදී මුදා හරින ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ණය අනුමත කිරීම්, මුද හැරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම් II - 8 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

2000 වර්ෂය තුළදී වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම රුපියල් දශ ලක්ෂ 903 ක් විය. 1996 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා මෙම ණය සහතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ණය සහතික වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,894 කි. මෙම ව්‍යාපෘතිය යටතේ මුදා හරින ලද ණය මුදල් හා නිකුත් කරන ලද ණය සහතික වෙනුවෙන් 2000 වර්ෂය තුළදී ලැබී ඇති ඇප ආවරණ වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 60 ක් වන අතර, 1996 - 2000 අතර කාලය තුළදී ලැබී ඇති මුළු ඇප ආවරණ වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 116 කි.

**II - 7 වැනි සංඛ්‍යා සටහන**
**වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**
**අරමුණ අනුව ණය අනුමත කිරීම් සහ මුද හැරීම්**

රු.ද.ලක්ෂ

| අරමුණ | 1999 | | 2000 | | 1996 - 2000 | |
|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුද හැරීම් | අනුමත කිරීම් | මුද හැරීම් | අනුමත කිරීම් | මුද හැරීම් |
| වැවිලි බෝග සංවර්ධනය | 841 | 985 | 885 | 947 | 3,178 | 2,729 |
| සැකසුම් වැඩි දියුණු කිරීම් සහ පරිසර දූෂණය පාලනය | 425 | 575 | 270 | 271 | 2,166 | 1,303 |
| සේවා වාහන සහ උපකරණ | 247 | 249 | 56 | 82 | 1,043 | 646 |
| එකතුව | 1,513 | 1,810 | 1,211 | 1,300 | 6,386 | 4,677 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය (සුමදි)

1997 වර්ෂයේ සිට සුමදි ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික සංවර්ධන බැංකුව මගින් ප්‍රතිමූල්‍ය ණය මුදා හැරීම සිදු කළ අතර, 2000 වර්ෂය තුළදී ප්‍රතිමූල්‍ය මුදා හැරීම සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදී. කෙසේ වුවද, මුදා හරින ලද ණය මුදල් වෙනුවෙන් ඇප ආවරණ සහතික නිකුත් කිරීම් තවදුරටත් සිදු කරගෙන යනු ලැබීය. 1999 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 1,187 ක් සඳහා නිකුත් කර තිබූ ඇප ආවරණ සහතික 817 ට සාපේක්ෂව 2000 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 685 ක ඇප ආවරණ සහතික 369 ක් නිකුත් කරන ලදී. 2000 වර්ෂය තුළදී ඇප ආවරණ 16 ක් අවලංගු කළ අතර, රුපියල් දශ ලක්ෂ 49 ක වටිනාකමකින් යුක්ත ඇප ආවරණ 37 ක් සම්පූර්ණයෙන් ගෙවා අවසන්

**II - 8 වැනි සංඛ්‍යා සටහන**
**වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**
**ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්, මුදා හැරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම**

(රුපියල් දශ ලක්ෂ)

| සහභාගිත්ව මූල්‍ය ආයතන | 1999 | | | | 2000 | | | | 1996 - 2000 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල | අනුමත කිරීම් | මුදා හැරීම් | ණය සහතික වගකීම | රැස් කර ගන්නා ලද වාර මුදල |
| ජාතික සංවර්ධන බැංකුව | 428 | 837 | 504 | 19 | 208 | 146 | 91 | 26 | 2,329 | 1,746 | 1,055 | 55 |
| ඩී.එෆ්.සී.සී.බැංකුව | 460 | 538 | 283 | 11 | 346 | 362 | 267 | 18 | 2,068 | 1,413 | 863 | 33 |
| ලංකා බැංකුව | 109 | 237 | 157 | 3 | 211 | 208 | 145 | 8 | 727 | 606 | 390 | 14 |
| සීමාසහිත කොමර්ෂල් බැංකුව | 255 | 173 | 92 | 4 | 35 | 73 | 68 | 5 | 491 | 377 | 241 | 11 |
| සීමාසහිත සම්පත් බැංකුව | 0 | 25 | 13 | 0 | 66 | 94 | 33 | 3 | 238 | 119 | 69 | 1 |
| සීමාසහිත සෙලාන් බැංකුව | 260 | - | - | - | 297 | 368 | 265 | 1 | 482 | 368 | 242 | 3 |
| හැටන් නැෂනල් බැංකුව | - | - | - | - | 50 | 50 | 35 | - | 50 | 50 | 35 | - |
| එකතුව | 1,512 | 1,810 | 1,048 | 37 | 1,211 | 1,300 | 903 | 60 | 6,386 | 3,377 | 2,894 | 116 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කරන ලදී. 2000 වර්ෂය අවසානයට මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇප ආවරණ වගකීම රුපියල් දශ ලක්ෂ 1,459 ක් වූ අතර, එකතු කරන ලද මුළු ඇප ආවරණ වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 27.8 කි.

පසුගිය වසර කිහිපය තුළදී තිබූ උපනතිවලට අනුව යමින්, 2000 වර්ෂයේදී සුළු මදි ණය ක්‍රමය යටතේ සියයට 51.5 ක් පමණ වන වැඩි ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත්තේ අනෙකුත් අංශය වෙත වන අතර, එහි අන්තර්ගත උප අංශ වන්නේ සේවා කර්මාන්ත එනම්, මගී ප්‍රවාහන හා වාණිජ ප්‍රවාහනය, වාහන සේවාවන්, අවන්හල්, සේවා මධ්‍යස්ථාන, ඉලෙක්ට්‍රොනික සම්බන්ධිත කර්මාන්ත හා සේවාවන් සඳහා වන අතර, සියයට 19 ක් පමණ වූ ණය ආහාර හා බීම වර්ග සැකසීම, දුම්කොළ වැනි සියයට 19 ක් පමණ වූ ණය ආහාර හා බීම වර්ග සැකසීම, දුම්කොළ වැනි කර්මාන්ත සඳහා ප්‍රදානය කර ඇත. කෘෂිකර්මාන්තය මත පදනම් වූ කර්මාන්ත සඳහා සහ රසායනික, පෙට්‍රෝලියම්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්ත යන අංශ සඳහා පිළිවෙලින් සියයට 9.3 ක් හා සියයට 9.8 ක් 2000 වර්ෂය තුළදී මුදා හැර ඇත. මෙතෙක් ප්‍රදානය කර ඇති ණය මුදල් පිළිබඳව කර්මාන්ත පදනම් කොටගෙන කරන ලද වර්ගීකරණයක් II-9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## නාගරික සංවර්ධනය සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වූ නව නිවාස ණය ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 20 ක ණය ආධාර යටතේ මෙම ව්‍යාපෘතිය 1999 වර්ෂයේ ප්‍රථම භාගයේදී ආරම්භ කරන ලදී. 1999 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය මුදා හැරීම් ඉතා අඩු මට්ටමක පැවති අතර, එයට සාපේක්ෂව 2000 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් හා මුදා හැරීම් සීඝ්‍රයෙන් වර්ධනය විය. මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී එයට සහභාගී වීමට සූදානමින් සිටි මූල්‍ය ආයතන හතෙන් සුදුසුකම් ලැබුවේ දෙකක් පමණක් නිසා ණය මුදා හැරීම් තරමක්දුරට මන්දගාමී විය. කෙසේ වෙතත් අතිරේක මූල්‍ය ආයතන 3 ක් වන කඳුරට හා රජරට සංවර්ධන බැංකු ද, නිවාස ණය සඳහා විශේෂිත ආයතනයක් වන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවද සහභාගිත්ව ණය දෙන ආයතන ලෙස මෙම ණය යෝජනා ක්‍රමයට ඇතුළත් වීම නිසා ණය මුදා හැරීම සීඝ්‍රයෙන් වර්ධනය විය. මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍ය ණය අනුමත කිරීම් හා මුදා හැරීම් II-10 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මුළු ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් රුපියල් දශ ලක්ෂ 117 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 35 ක් මෙම වර්ෂයේදී මුදා හරින ලදී. අනුමත කිරීම් හා මුදා හැරීම් අතර වෙනසට හේතු වූයේ සහභාගිත්ව ණය දෙන ආයතන වලින් ප්‍රතිමූල්‍ය ණය ලබා ගැනීමේ අයදුම්පත්‍ර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවීමේදී සිදු වූ ප්‍රමාදයන්ය. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව රුපියල් දශ ලක්ෂ 86 ක ප්‍රතිමූල්‍ය ණය අනුමත කළ අතර, 2000 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්ෂ 23 ක ණය මුදල් මුදා හැර ඇත.

**II - 9 වැනි සංඛ්‍යා සටහන**
**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය**
**කර්මාන්ත අනුව ණය වර්ගීකරණය - (අ) 2000.12.31 දිනට**

(රුපියල් දශ ලක්ෂ)

| කර්මාන්ත | ප්‍රදානය කළ ණය | | | ප්‍රදානය කළ ණය ප්‍රමාණය | | | ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 1997-2000 | 1999 | 2000 | 1997-2000 | 1997-2000 |
| 1. ආහාර පාන වර්ග සහ දුම්කොළ | 97 | 58 | 267 | 165 | 130 | 481 | 230 |
| 2. රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 21 | 10 | 94 | 52 | 35 | 174 | 80 |
| 3. දව සහ දව නිෂ්පාදන | 29 | 7 | 59 | 45 | 6 | 69 | 38 |
| 4. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 21 | 8 | 42 | 67 | 21 | 114 | 45 |
| 5. රසායනික ද්‍රව්‍ය ඛනිජ තෙල් ප්ලාස්ටික් නිෂ්පාදන | 33 | 14 | 63 | 65 | 67 | 156 | 83 |
| 6. මූලික ලෝහ නිෂ්පාදන | 28 | 16 | 52 | 36 | 9 | 57 | 25 |
| 7. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 29 | - | 76 | 39 | - | 91 | 54 |
| 8. සකස් කල ලෝහ නිෂ්පාදන, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | 28 | - | - | 22 | 17 |
| 9. කෘෂි නිෂ්පාදන | 102 | 28 | 200 | 164 | 63 | 307 | 178 |
| 10. අනෙකුත් (අ) | 457 | 228 | 1,008 | 555 | 353 | 1,265 | 710 |
| එකතුව | 817 | 369 | 1,889 | 1,187 | 685 | 2,735 | 1,459 |

(අ) මඟී සහ වාණිජ ප්‍රවාහනය, සේවා මධ්‍යස්ථාන, අවන්හල්, ඉලෙක්ට්‍රොනික් සහ අනෙකුත් සේවාවන් ඇතුළුව.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

උප ණයගැතියන්ට ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 64 ක් පමණ නව නිවාස ඉදි කිරීමටත්, නිවාස වැඩි දියුණු කිරීම සඳහාත් යොදගෙන ඇත. අරමුණු අනුව ණය මුදා හැරීම් II-11 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## ණය ආවරණ අරමුදල් ආයෝජන කිරීම

2000 වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,982 කි. එම වසර තුළදී ආයෝජන වලින් ලැබූ මුළු පොලී ආදයම රුපියල් දශ ලක්ෂ 165 කි. මෙම ආයෝජන සඳහා අරමුදල් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය, බස් රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය සහ වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වලින් එකතු කර ගන්නා ලද ඇප ආවරණ වාර මුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අත්තිකාරම් වශයෙන් දෙන ලද අරමුදල් වලින් සපයා ගන්නා ලදී.

## නිමාවට පත් වූ ණය සහතික ක්‍රම

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය (සුමක I - IV) (1979 - 1997), බස් රථ මිලදී

**II - 10 වැනි සංඛ්‍යා සටහන**
**නාගරික සංවර්ධන සහ අඩුආදයම් ලාභී නිවාස ණය යෝජනා ක්‍රමය**
**ප්‍රතිමූල්‍ය ණය අනුමත කිරීම් සහ මුද හැරීම්-2000.12.31 දිනට**

රුපියල්

| සහභාගිත්ව ණය දෙන ආයතන | අනුමත කිරීම් | | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | | මුද හැරීම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | 1999 | 2000 | 1999 | 2000 | 1999 | 2000 |
| සීමාසහිත කොමර්ෂල් බැංකුව | 18 | 63 | 1,061,250 | 5,088,250 | 86,250 | 4,403,550 |
| සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | 33 | 78 | 1,155,000 | 4,923,750 | 615,000 | 2,372,250 |
| රජරට සංවර්ධන බැංකුව | - | 190 | - | 5,149,140 | - | - |
| කඳුරට සංවර්ධන බැංකුව | - | 369 | - | 16,533,200 | - | 5,968,400 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | - | 871 | - | 85,526,868 | - | 22,588,955 |
| එකතුව | 51 | 1,571 | 2,216,250 | 117,221,208 | 701,250 | 35,332,955 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**II - 11 වැනි සංඛ්‍යා සටහන**
**අරමුණ අනුව ණය (2000.12.31 දින දක්වා)**

(රුපියල්)

| අරමුණ | ණය සංඛ්‍යාව | ණය ප්‍රමාණය* |
|---|---|---|
| ඉඩම් මිලදී ගැනීම් | 246 | 27,788,000 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 21 | 2,147,000 |
| නිවාස ඉදිකිරීම් සහ නිවාසවලට අළුතෙන් කොටස් එකතු කිරීම් | 829 | 93,759,561 |
| පවතින නිවාස වැඩිදියුණු කිරීම් | 475 | 23,059,950 |
| එකතුව | 1,571 | 146,754,511 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* මෙම ප්‍රතිමූල්‍ය ණය මුදල්වල සහභාගිත්ව ණය දෙන ආයතනවල දායකත්වයද ඇතුලත්ව ඇත .

ගැනීමේ ණය සහතික ක්‍රමය (1990 - 1992), එක්සත් ජනපද රජයෙන් සහතික කළ අඩු ආදායම් පවුල් සඳහා වන නිවාස වැඩසටහනෙහි IV අදියර (අ.ආ.නි.වැ.) (1992 - 1998) සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය (1997 - 2000) යන ණය යෝජනා ක්‍රම දැනට නිමාවට පත් වී ඇති අතර, ඒවායෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර II-12 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය සහ බස් රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම නිමාවට පත් වී නොමැති බැවින්, එම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහ ව්‍යාපෘති පරීක්ෂණ තවදුරටත් සිදු කෙරෙමින් පවතී. වලංගුව පවතින ඇප ආවරණ සහතික වෙනුවෙන් වාර මුදල් එකතු කිරීම අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ.

## ග්‍රාමීය ණය

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් විදේශ ණය දෙන ආයතන, ශ්‍රී ලංකා රජය සහ ණය දෙන බැංකු ආයතන මගින් අරමුදල් සපයනු ලබන විවිධ ණය යෝජනා ක්‍රමවල ණය සංරචකයන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යන ණය යෝජනා ක්‍රම දෙක සාර්ථකව ක්‍රියාත්මක කර නිම කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවෙන් (ආ.සං.බැං.) ණය ආධාර සැළසෙන නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය හා දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන

**II - 12 වැනි සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමයන්හි සාරාංශය - (2000.12.31 වැනි දිනට)**

(රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | සුමක I (අ) | | සුමක II (ආ) | | සුමක III (ඇ) | | සුමක IV (ඇ) | | සුමදි (ඉ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 ප්‍රදානය කරන ලද ණය | 1,670 | 286.1 | 2,531 | 1,392.5 | 3,130 | 1,955.6 | 9,072 | 7,666.4 | 1,889 | 2,735.1 |
| 1.2 සහතික කරන ලද ණය | 1,670 | 157.5 | 2,531 | 713.6 | 3,130 | 1,312.6 | 9,072 | 4,772.1 | 1,889 | 1,459 |
| 2.1 සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය* | 1,235 | 210.0 | 1,744 | 1,120.4 | 1,930 | 1,656.3 | 6,450 | 4,515.5 | 37 | 49.0 |
| 2.2 ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික* | 113 | 65.0 | 496 | 241.7 | 872 | 580.5 | 271 | 241.5 | 16 | 21.2 |
| 3.1 ලැබූ හිමිකම් පෑම් | 338 | 76.0 | 228 | 119.0 | 171 | 98.0 | 273 | 226.0 | 29 | 50.0 |
| 3.2 ලැබූ හිමිකම්පෑම් වෙනුවෙන් ශ්‍රී ලකා මහ බැංකුවේ වගකීම | - | 34.0 | - | 66.0 | - | 67.0 | - | 150.0 | - | 25.0 |
| 3.3 හිමිකම්පෑම් සමථයකට පත් කිරීම සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම්පෑම් | 232 | 19.0 | 126 | 32.0 | 92 | 24.0 | 87 | 35.5 | 7 | 6.0 |
| අර්ධ ගෙවීම් කළ හිමිකම්පෑම් | 27 | 2.0 | 5 | 1.0 | - | - | - | - | - | - |
| ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් | 32 | 7.0 | 46 | 13.0 | 44 | 16.0 | 56 | 22.0 | 1 | 0.3 |
| ආපසු හරවා යවන ලද හිමිකම්පෑම් | - | - | 1 | 0.2 | - | - | 11 | 7.0 | 2 | 0.8 |
| හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද ණය | 36 | 2.0 | 7 | 2.0 | 10 | 4.0 | 25 | 13.0 | - | - |
| සලකා බැලීම කල් තබන ලද හිමිකම්පෑම් | 8 | 2.0 | 21 | 8.0 | 6 | 5.0 | 11 | 7.0 | - | - |
| තීරණ ගෙන නොමැති හිමිකම්පෑම් | - | - | 10 | 3.0 | 12 | 8.0 | 76 | 45.5 | 19 | 17.0 |
| ඉවත් කර ගන්නා ලද හිමිකම්පෑම් | 3 | 1.0 | 12 | 4.0 | 7 | 4.0 | 7 | 7.0 | - | - |
| 4.1 නොපියවන ලද ණය මුදල් (ඊ)* | 05 | - | 63 | 26.7 | 157 | 53.9 | 2,078 | 1,221.7 | 1,807 | 1,860.0 |
| 4.2 ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම | - | - | 63 | 16.0 | 157 | 36.8 | 2,078 | 797.1 | 1,807 | 1,244.1 |
| 5. රැස් කර ගන්නා ලද වාර මුදල් | - | 12.2 | - | 29.9 | - | 46.2 | - | 170 | - | 27.8 |
| 6. පශ්චාත් හිමිකම් අය කර ගැනීම් | - | 10.0 | - | 19.0 | - | 18.0 | - | 10.0 | - | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සුමක I - 1979-1981 දක්වා ක්‍රියාත්මක විය.
(ආ) සුමක II - 1982-1989 දක්වා ක්‍රියාත්මක විය.
(ඇ) සුමක III - 1988-1991 දක්වා ක්‍රියාත්මක විය.
(ඇ) සුමක IV - 1992-1997 දක්වා ක්‍රියාත්මක විය.
(ඉ) සුමදි 1997 දී ආරම්භ විය.
(ඊ) තාවකාලිකයි.
* සංශෝධිත දත්ත

යෝජනා ක්‍රමයේ අනුගාමී ණය යෝජනා ක්‍රමයක් වශයෙන් එහි චක්‍රීය අරමුදල භාවිතා කරමින් දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය වශයෙන් නව ණය යෝජනා ක්‍රම දෙකක් ආරම්භ කිරීමට මෙම වර්ෂය තුළදී මුදල් මණ්ඩලය විසින් සිය අනුමැතිය ලබා දෙන ලදී. විවිධ ව්‍යාපෘතීන්හි මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වර්ෂය තුළ නව ණය දෙන ආයතන හඳුනා ගැනීම, විවිධ ව්‍යාපෘතීන් යටතේ යෝග්‍යතාව ලබන ණය මුදා හැරීම් සඳහා අදාළ ණය දෙන ආයතන වෙත ප්‍රතිමූල්‍ය පහසුකම් මුදා හැරීම, පසු විපරම් කටයුතු කිරීම හා අදාළ ව්‍යාපෘති කාර්යාල හා වෙනත් දේශීය නියෝජිතායතනයන්හි සහයෝගය ඇතිව එකී ණය යොජනා ක්‍රමයන් මනා ලෙස සම්බන්ධීකරණය කිරීම ආදී කටයුතු ඉටු කරන ලදී.

කෘෂිකාර්මික නිපැයුම් පිළිබඳ වෙළඳපොළ ගැටළු සඳහා පිළියමක් වශයෙන් ගොවීන් සහ ගොවි ද්‍රව්‍ය මිලදී ගන්නන් දිරි ගැන්වෙන ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමෝපායක් තුළින් කෘෂිකාර්මික නිපැයුම් සඳහා ගොවීන්ට මෙන්ම ගැණුම් කරුවන්ටද සාධාරණ මිලක් ලබා දීමේ වැඩපිළිවෙල ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මෙම වර්ෂයේදීද සාර්ථකව පවත්වාගෙන යන ලදී.

වසර 2000 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල පරිපාලන කටයුතුද ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට පත් කරන ලද අතර එමගින් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ණය යෝජනා ක්‍රමයන් වඩාත් ඵලදායී ධාරිතාවකින් යුතුව පවත්වාගෙන යාමට හැකි වෙනු ඇත.

වර්ෂ 2000 තුළදී මහ බැංකුව විසින් ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මාර්ගයෙන් මතු දක්වෙන ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කරන ලදී.

**(අ) ආ.සං.බැං.[1] අරමුදල් සැපයුමෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති:-**

(i) තේ සංවර්ධන ව්‍යාපෘතිය;

(ii) දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය;

(iii) දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය;

(iv) වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය;

(v) උතුරු මැද පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය;

(vi) නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය;

**(ආ) කෘ.සං.ආ.අ.[2]/කැ.ජා.සං.ආ.[3]/ස්.ජා.සං.ආ.[4]/ජපන් රජය[5]/ලෝ.ආ.වැ.[6]/ජා.සං.එ.ජ.ආ.[7]/ජා.ස.ජ.බැ.[8] අරමුදල් සැපයුමෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති :-**

(vii) උතුරු මැද පළාතේ සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (කෘ.සං.ජා.අ., ස්.ජා.සං.ආ. සහ ලෝ.ආ.වැ.)

(viii) ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය (ජපන් රජය)

(ix) දිළිඳු බව තුරන් කිරීමේ සුළු ණය ව්‍යාපෘතිය (ජා.සං.ජ.බැ.)

(x) මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (කෘ.සං.ආ.අ.)

(xi) නාගරික පරිසර යටිතල පහසුකම් සංවර්ධන ණය ව්‍යාපෘතිය (ජා.සං.එ.ජ.ආ.)

**(ඇ) රජයේ අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති :-**

(xii) සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන (ඉසුරු) ණය ව්‍යාපෘතිය

(xiii) කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය

(xiv) පුරතුර වැඩසටහන

(xv) දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය

## තේ සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය නොකඩවා පවත්වාගෙන යාම සඳහා 1999 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම ඇරඹූ තේ සංවර්ධන ව්‍යාපෘතිය, 2000 වසර අවසන් වනවිට එහි පළමු වසර වැඩ කටයුතු නිම කරන ලදී. මෙම වසර තුළදී ණය ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සඳහා කුඩා තේ ඉඩම් හිමියන්ගෙන් සහ තේ කර්මාන්තශාලා හිමියන්ගෙන් සතුටුදායක ප්‍රතිචාර ලැබිණි. ලෝක වෙළඳපොළෙහි තේ මිල ඉහළ යාමත්, තේ නැවත වගාව සඳහා සුදුසු කාලගුණික තත්ත්වයක් පැවතීමත් මෙයට හේතු විණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සහභාගී වන ණය දෙන ආයතනවලට වසර සඳහා සැලසුම් කළ ණය ඉලක්ක ඉක්මවා යන ණය ප්‍රමාණයක් මුදා හැරීමට හැකි විය. මුදා හැරීම සඳහා ඉලක්ක කළ ණය වටිනාකමෙන් සියයට 117 ක් ඉක්මවන ලෙස රුපියල් දශ ලක්ෂ 337 ක මුදලක් 2000 වර්ෂයේදී සහභාගී වන ණය දෙන ආයතන විසින් මුදා හැර තිබුණි.

තේ නැවත වගාව, තේ තවාන් පිහිටුවීම, තේ කර්මාන්තශාලා නවීකරණය හා පුනරුත්ථාපනය, තේ දළු ප්‍රවාහනය සඳහා සුදුසු වාහන මිලදී ගැනීම සහ අමු දළු එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම ව්‍යාපෘතිය යටතේ මූල්‍යකරණය කිරීම සඳහා සුදුසුකම් ලබන කටයුතු වේ.

[1] ආසියානු සංවර්ධන බැංකුව.
[2] කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල.
[3] කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය.
[4] ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය.
[5] ජපන් රජයේ ආහාර නිෂ්පාදන ප්‍රදානය.
[6] ලෝක ආහාර වැඩසටහන.
[7] ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතන.
[8] ජාත්‍යන්තර සහයෝගීතාවය පිණිස වූ ජපන් බැංකුව.

## II - 13 වැනි සංඛ්‍යා සටහන
## 2000 වර්ෂය තුළදී ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද ණය යෝජනා ක්‍රම

| ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ආයතන | පුළුල් අරමුණ | මූලික ප්‍රතිපාදන | ණයලාභීන් සඳහා පොලී අනුපාතිකය (%) | 2000.12.31 දින දක්වා ණය මුදහැරීම් (රු.ද.ල.) | ණය ආපසු අයවීමේ අනුපාතය (%) |
|---|---|---|---|---|---|---|
| 1. තේ සංවර්ධන ව්‍යාපෘතිය (1999-2005) | ආ.සං.බැ. | කුඩා තේ වතු හිමිකරුවන්ගේ ආදායම් තත්ත්වය තිරසාර මට්ටමකට ගෙනඒම සහ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ස්වාභාවික පරිසරය පරිසරය වර්ධනය කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 20.952 | සාමාන්‍ය බර තබන ලද තැන්පතු අනුපාතිකය + 2 (නැවත වගාව සඳහා) සාමාන්‍ය බරතබන ලද තැන්පතු අනුපාතිකය + 6(අනිකුත් අවශ්‍යතා සඳහා) | 372.3 | 95 |
| 2. දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (1998-2004) | -එම- | බහුවාර්ෂික බෝග නිෂ්පාදනය සහ වාණිජකරණය, තවත්, පසු අස්වනු මෙහෙයුම් සහ සැකසුම් කටයුතු සහ වෙළෙඳපොළ වර්ධනය කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 15.685 | සාමාන්‍ය බරතබන ලද තැන්පතු අනුපාතිකය + 2 | 294.7 | සහන කාලය තුළ පවතී |
| 3. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1992-1999) | -එම- | දකුණු පළාතේ ජනතාවගේ ජීවන මට්ටම නගා සිටුවීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8.1 | 14 | 417.6 | 85 |
| 4. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය 2000 සිට | ශ්‍රී ලංකා රජය | -එම- | | 12 | 37.8 | 85 |
| 5. වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (1993-2000) | ආ.සං.බැ. | ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ සමාජ, ආර්ථික සහ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2.7 | 14 | 116.7 | 95 |
| 6. උතුරුමැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1996-2002) | ආ.සං.බැ.,කෘ.සං.ජා.අ., ස්.ජා.සං.ආ. සහ ලෝ.ආ.වැ. | දිළිඳුබව පිටුදැකීම, ආහාර ආරක්ෂණය සහ පෝෂණය වර්ධනය, අඩු ආදායම්ලාභී පවුල් වලට රැකියා අවස්ථාවන් වැඩිකිරීම | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 153 | උපරිම 17 | 3.3 | ලැ.නො. |
| උතුරුමැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1997-2003) | | | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 43 | | | |
| 7. නාගරික පරිසර යටිතල පහසුකම් සංවර්ධන ණය ව්‍යාපෘතිය (1999-2001) | ජා.සං.එ.ජ.අ. වෙසෙන ජනතාවගේ | නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂාව, සෞඛ්‍යය සහ පරිසර පහසුකම් වැඩිදියුණු කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4 | 16 | 32 | 95 |
| 8. සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය (1990-2000) | කෘ.සං.ජ.අ.,කෘ.ජා.සං.ආ. සහ ශ්‍රී ලංකා රජය | රැකියා අවස්ථාවන් බිහිකර ගැනීම සහ ඉතිරි කිරීමේ චර්යාවන් වර්ධනය කළ හැකිවන පරිදි පිරිවැය ඵලදායී තිරසාර සුළු ණය සැපයුම් ක්‍රමයක් ස්ථාපනය කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශලක්ෂ 4.85 | 16 (කෘෂිකාර්මික) 20 (අනිකුත් අවශ්‍යතා සඳහා) | 569 | 96.7 |
| 9. ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය (ආරම්භක වර්ෂය 1997) | ජපන් රජය | රටෙහි ආහාර නිෂ්පාදනය වැඩිකිරීම සහ ආහාර සැකසීමේ ක්‍රමෝපායන් වර්ධනය කිරීම | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 284 | 10 | 115 | ලැ.නො. |
| 10. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය | රජයේ පොලී සහනාධාර සහිතව ස.ණ.ආ. | කෙටිකාලීන ආහාර බෝග වගා කරන ගැමි ගොවි ජනතාවට අතදීම | - | 12 | 594 | 85[අ] |
| 11. කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (1997-2007) | ශ්‍රී ලංකා රජය | ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම මගින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 100 | 10 | 143.4[ආ] | 91 |
| 12. සුරතුර වැඩසටහන - අදියර II (1998 සිට ඉදිරියට) | රජයේ පොලී සහනාධාර සහිතව ස.ණ.ආ. | ස්වයං රැකියා සඳහා දිරිගැන්වීමේ ක්‍රමයක් මගින් මනා අධ්‍යාපනයක් ලත් රැකියා විරහිත යොවුන් කොටස් අතර ජීවන මට්ටම වැඩිදියුණු කිරීම සහ ආදායම් තත්ත්වය වැඩිකිරීම | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 1,300 | 10 | 914.3 | 53 |
| 13. ජපන් යු-කෝ් සුළු ණය ව්‍යාපෘතිය (දිළිඳුබව තුරන් කිරීමේ සුළු ණය ව්‍යාපෘතිය)(ආරම්භක වර්ෂය 2000) | ජා.ස.ජ.බැ. | රැකියා අවස්ථාවන් බිහිකර ගැනීම සහ ඉතිරි කිරීමේ චර්යාවන් වර්ධනය කළ හැකිවන පරිදි පිරිවැය ඵලදායී තිරසාර සුළු ණය සැපයුම් ක්‍රමයක් ස්ථාපනය කිරීම | යෙන් දශ ලක්ෂ 1,368 | වෙළඳපොළ අනුපාත | ලැ.නො. | ලැ.නො. |
| 14. මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය | කෘ.සං.ජා.අ. | ව්‍යාපෘති ප්‍රදේශය තුළ ගැමි ගොවි පවුල් සහ කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිර කිරීමෙන් නියත නගා සිටුවීමක් ලබාදීම | වි.ගැ.හි. දශ ලක්ෂ 2 | 14 | ලැ.නො. | ලැ.නො. |
| 15. නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (ආරම්භක වර්ෂය 2000) | ආ.සං.බැ. | උසස් ගුණාත්මක ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා නිපුණතා පුහුණු කිරීමේ වැඩසටහන්වල අදාළත්වය සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සමග නිපුණතා නොගැලපීම් සමග ග්‍රාමීය හා නාගරික තරුණයන් අතර පවතින විරැකියාව සම්බන්ධව අවධානය යොමු කිරීම | ඇ.එ.ජ.ඩොලර් දශ ලක්ෂ 0.657 | සාමාන්‍ය බර තබන ලද තැන්පතු අනුපාතිකය + 2 | ලැ.නො. | ලැ.නො. |

(අ) දළ වශයෙන් සමස්ත තත්ත්වය
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙන ලද මූළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මුල් ණය යෝජනා ක්‍රමය කුඩා තේ වතු සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතියක් බැවින් මෙම ව්‍යාපෘතියේදී වැඩි ණය ප්‍රමාණයක් කර්මාන්තශාලා පුනරුත්ථාපනය සඳහා ප්‍රදානය කර ඇති අතර එය ඒ සඳහා ඉලක්ක කළ මුදලින් සියයට 50 ට වඩා ඉක්මවයි. තේ පැල තවාන් සංවර්ධනයේ නියැලී සිටින කුඩා තේ ඉඩම් හිමියන් විසින් සහභාගී වන ණය දෙන ආයතනවලට දේපොල උකස් කිරීම වැනි පිළිගත හැකි ඇප ඉදිරිපත් කිරීමේ කටයුතුවලදී ඇති අපහසුතා නිසා තේ තවාන් පිහිටුවීම සඳහා පහත් මට්ටමක ණය ප්‍රමාණයක් මුදා හැර තිබුණි.

සහභාගී වන ණය දෙන ආයතනවල ප්‍රගතිය සලකා බැලීමේදී 2000 වර්ෂය තුළදී මුදා හල මුළු ණය ප්‍රමාණයෙන් සියයට 41.7 ක් ඩීඑෆ්සීසී බැංකුව මගින් මුදා හරින ලදී. ඉතිරි මුදා හැරීම් වලින් සියයට 16.4 ක් හැටන් නැෂනල් බැංකුවද, සියයට 16 ක් ලංකා වාණිජ බැංකුවද, සියයට 10.7 ක් ජාතික සංවර්ධන බැංකුවද, සියයට 8.9 ක් සම්පත් බැංකුවද සහ සියයට 6.3 ලංකා බැංකුවද මුදා හරින ලදී. සහභාගී වන ණය දෙන ආයතන ලෙස ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය යෝග්‍යතා නිර්ණායක සපුරා තිබූ බැවින් ලංකා බැංකුව හා කඳුරට සංවර්ධන බැංකුව අළුත් ණය දෙන ආයතන දෙකක් ලෙස ණය යෝජනා ක්‍රමයට වර්ෂය තුළදී ඇතුළත් කරන ලදී.

2000 වර්ෂය අවසන් වනවිට සහභාගී වන ණය දෙන ආයතන විසින් ණය 568 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 506 ක මුදල් ප්‍රමාණයක් අනුමත කරන ලද අතර, ණය 499 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 372 ක් වූ ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී. මෙයින් ණය 236 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 217 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය වශයෙන් මුදා හරින ලදී.

## දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

පළමුවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව පවත්වා ගනිමින් ක්‍රියාත්මක වූ දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 2000 වසරේදී සිය දෙවන වර්ෂය සම්පූර්ණ කරන ලදී. මෙම ව්‍යාපෘතිය උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි හැර දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මක වන අතර, 2004 වර්ෂයේදී අවසන් වීමට නියමිතය. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ බහුවාර්ෂික ක්ෂේත්‍රය දියුණු කිරීම හා වාණිජකරණය කිරීම උදෙසා අවශ්‍ය ණය පහසුකම් හා සහායක සේවාවන් සැළසීමය. මෙම ව්‍යාපෘතිය (අ) ණය අරමුදල්, (ආ) ගොවිපොල උපදේශක සේවා, අලෙවි හා තාක්ෂණික සේවා, (ඇ) පර්යේෂණ කටයුතු, (ඈ) බීජ හා රෝපණ ද්‍රව්‍යය (ඉ) ආයතනික කටයුතු නගා සිටුවීම යන ප්‍රධාන සංරචක පහකින් සමන්විතය. මෙම සංරචක අතුරින් ණය සංරචකයේ මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන අතර සෙසු සංරචකයන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබයි.

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යමය නිර්ණායකයන් සම්පූර්ණ කිරීම මත 2000 වර්ෂය තුළදී නව සහභාගිත්ව මූල්‍ය ආයතන වශයෙන් ලංකා බැංකුව සහ කඳුරට සංවර්ධන බැංකුව ව්‍යාපෘතියට ඇතුළත් විය. ඒ අනුව මෙම ණය ව්‍යාපෘතියේ ණය කටයුතු මෙහෙයවන සහභාගිත්ව මූල්‍ය ආයතන සංඛ්‍යාව 7 ක් දක්වා වර්ධනය විය. ණය සංරචකය සඳහා වෙන් කර ඇති මුදල වූ වි.ගැ.හි. දශ ලක්ෂ 11.562 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,155) න් රුපියල් දශ ලක්ෂ 294.6 ක ප්‍රමාණයක් සුදුසුකම් ලැබූ ණය ව්‍යාපෘතීන් 698 ක් වෙත අදළ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් 2000 වර්ෂය අවසානය වනවිට මුදා හැර තිබිණ. 2000 වර්ෂය තුළදී පමණක් එසේ මුදා හරින ලද ණය මුදල රුපියල් දශ ලක්ෂ 184.3 ක් වූ අතර ඉන් රුපියල් දශ ලක්ෂ 128.8 ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දී තිබුණි.

ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීමකට අනුව උප ණයකරුවන් වෙනුවෙන් සහභාගිත්ව මූල්‍ය ආයතයකට අනුමත කළහැකි උපරිම ණය සීමාව ඇමෙරිකානු ඩොලර් 50,000 සිට 100,000 දක්වා හෝ ඒ සමාන ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව එම සීමාව ඉක්මවන සහ ඇමෙරිකානු ඩොලර් 150,000 දක්වා වූ ණය මුදල් සඳහා අදළ අයදුම්පත් ආසියානු සංවර්ධන බැංකුවේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වේ.

තවද, දෙවන බහුවාර්ෂික බෝග ව්‍යාපෘතියේ ණයලාභීන් සඳහා වන ගොවිපොල උපදේශක සේවාවන් සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය සැලසීම සඳහා නියමු ව්‍යාපෘතියක්ද ආසියානු සංවර්ධන බැංකුව විසින් ක්‍රියාත්මක කෙරිණි. දනට මෙම අංශයට අදළ ගොවිපොල උපදේශක සේවාවන් අලෙවි සහ තාක්ෂණික සේවා සපයනු ලබන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසිනි. මේ වනවිට තෝරා ගත් පුද්ගලික අංශයේ සේවා ආයතන කිහිපයක් සමග කෘෂිකර්ම ආත්‍යාංශය විසින් අදළ ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සදනම් කර ඇත. මෙ අනුව ශ්‍රී ලංකාවේ බහුවාර්ෂික බෝග ව්‍යාප්ති ක්ෂේත්‍රය සඳහා " සේවාව ලබන්නා විසින් ගෙවීම් කිරීමේ ක්‍රමය "(user-pays) පළමු වරට ක්‍රියාත්මක වනු ඇති අතර එමගින් සේවා ලබන්නා හට තමා ලබා ගන්නා සේවාවේ වෙළඳපොළ මිල කෙලින්ම තම සේවා දයකයාට ගෙවීමට හැකි වනු ඇත. ව්‍යාපෘතිය යටතේ ණය මෙහෙයුම් කටයුතු තවදුරටත් වේගවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව හා ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල එක්ව ව්‍යාපෘති බලප්‍රදේශයේ දිස්ත්‍රික්ක 11 ක බැංකු කළමනාකරුවන් සඳහා පුහුණු පාඨමාලා 6 ක් සාර්ථකව පවත්වන ලදී.

## දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත, දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘතිය 1992 වර්ෂයේ ආරම්භ කරන ලදුව, 2000 ජූනි 30 වන දින සම්පූර්ණ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 1999 වසර අවසානයේදී නිම කිරීමට

මුලදී සැලසුම් කර තිබූ නමුත්, 1999 වසරෙහි දෙවන භාගයේදී නිකුත් කරන ලද ණය වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා එය තවත් මාස හයකින් දීර්ඝ කරන ලදී.

දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වූයේ ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි රැකියා අවස්ථා සහ ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමෙන් සහ ආර්ථික සහ සමාජයීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් මගින් දකුණු පළාත් වැසියන්ගේ ආදායම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. මෙම ව්‍යාපාතියේ ඉලක්ක කණ්ඩායම ලෙස සැලකෙනුයේ සුළු ගොවීන්, ඉඩම් නොමැති ශ්‍රමිකයන්, පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, කාන්තාවන් සහ රැකියා නොමැති තරුණයින් ද වේ.

ව්‍යාපාතියේ ණය සංරචකය සඳහා මුළු වෙන් කිරීම් රුපියල් දශ ලක්ෂ 466 ක් (වි.ගැ.හි. 6.4 ක්) විය. ඉන් රුපියල් දශ ලක්ෂ 369 ක් නැතහොත් සියයට 79 ක් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ග්‍රාමීය අංශයේ සුළු ණය සහ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් සඳහා නිකුත් කරන ලද ණය වෙනුවෙන් ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සපයා ඇත. ඉතිරි ප්‍රමාණය සුළු පරිමාණ ස්වයං රැකියා අංශයට ණය මුදල් සැපයීම සඳහා සකසුරුවම් හා සමූපකාර ණය දෙන සමිතිවලට (සණස) වෙන් කරන ලදී.

ව්‍යාපෘති කාලසීමාව තුළ අමාත්‍යාංශය විසින් බැංකුවට වෙන් කරන ලද ප්‍රතිපාදන සියල්ලම සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2000 වසර ඇතුලත සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට රුපියල් දශ ලක්ෂ 16.3 ක් ප්‍රතිමූල්‍ය ණය වශයෙන් මුදාහරින ලදී. ඒ අනුව මුදාහරින ලද මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 369 ක් විය. 2000 වසරේදී සහභාගිත්ව ණය දෙන ආයතන විසින් මුදාහරින ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18.4 කි. ව්‍යාපෘති කාලසීමාව තුළ නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 417.6 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 50 ක් එනම්; සියයට 12 ක් පමණ ප්‍රමාණයක් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් සිය අරමුදලින් මූල්‍යකරණය කිරීමට දායක වී ඇත. ණය මුදාහැරීම දිස්ත්‍රික්ක අනුව සැලකුවහොත් සියයට 51 ක පමණ ඉහළ ණය ප්‍රමාණයක් මාතර දිස්ත්‍රික්කයට මුදාහැර ඇති අතර, ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට ණය නිකුත් කිරීම් පිළිවෙලින් සියයට 29 ක් සහ සියයට 20 ක් විය. ව්‍යාපෘති කාලසීමාව තුළ රුහුණ සංවර්ධන බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව විසින් ව්‍යාපෘති 7,709 ක් සඳහා ණය අරමුදල් සපයා ඇත. මුළු ණය නිකුතුවෙන් සියයට 85 ක් පමණ රුහුණ සංවර්ධන බැංකුව විසින් නිකුත් කර ඇත. මුදාහල ණය සංඛ්‍යාව අනුව සලකනකල රුහුණ සංවර්ධන බැංකුව විසින් මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 98.5 ක් සපයා ඇති අතර, එම ප්‍රමාණය මුළුමනින්ම සුළු පරිමාණ ණය වේ.

ව්‍යාපෘතියේ ප්‍රතිඵල ඇගයීමේ අධ්‍යයනයට අනුව මෙම ණය වැඩසටහන ව්‍යාපෘතියේ සංරචක අතුරින් ඉතාමත් සාර්ථක සංරචකයක් ලෙස වර්ග කර ඇත. තවද, රුහුණ සංවර්ධන බැංකුව විසින් දකුණු පළාතේ ස්වයං රැකියා ආශ්‍රිත ආදායම් උත්පාදන කටයුතු විශාල සංඛ්‍යාවකට සහාය දීම තුළින් උග්‍ර රැකියා වියුක්ති ප්‍රශ්නය විසඳීමට ධනාත්මක උත්සාහයක් දරා ඇති බව එම අධ්‍යයනය මගින් හෙළිදරව් කර ඇත. රුහුණ සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද ණය මුදලක ප්‍රමාණය රුපියල් 28,000 - රුපියල් 45,000 ත් අතර විය. එමෙන්ම, එම බැංකුව මගින් සියයට 44 ක පමණ ණය ප්‍රමාණයක් ස්වයං රැකියා ව්‍යාපෘතීන් සඳහා නිකුත් කරන ලදී. ණය අරමුණු අනුව සලකන කල වෙළඳාම සහ ස්වයං රැකියා වැනි ආදායම් උත්පාදන කටයුතු සඳහා ඉතා ඉහළ ණය ප්‍රමාණයක්ද, ධීවර අංශය සඳහා ඉතා අඩු ණය ප්‍රමාණයක්ද නිකුත් කර ඇත. මෙසේ ණය පහසුකම් සපයන ලද ව්‍යාපෘති අතුරින් සියයට 94 ක් පමණ සාර්ථක ව්‍යාපෘතීන් වශයෙන් සැලකිය හැකි අතර, අසාර්ථක වූ ව්‍යාපෘතීන් ද සියයට 6 ක් පමණ වේ.

### දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය

2000 ජූනි මාසයේදී නිම කරන ලද දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත කරන ලදුව, සම්පූර්ණයෙන් මුදාහළ නොහැකි වූ ණය වල ශේෂයන් මුදාහැරීම සඳහා සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට ප්‍රතිමූල්‍ය සැපයීමේ අරමුණින් සහ නැවත ණය ක්‍රමයක් ක්‍රියාත්මක වීම ඇරඹීම දක්වා වන අතුරු කාලසීමාව තුළ ණය නිකුත් කිරීම සඳහා දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම 2000 ජූලි මාසයේදී ආරම්භ විය. මෙම ණය ක්‍රමය සඳහා අරමුදල් සපයා ගන්නා ලද්දේ දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ ණය ආපසු අයවීම් සහ පොලී ආදායම වශයෙන් තිබූ රුපියල් දශ ලක්ෂ 194 ක මුදලක් චක්‍රීය අරමුදලකට මාරු කිරීමෙනි.

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රජය සමග ගිවිසුමකට එළඹී අතර, සහභාගිත්ව ණය දෙන ආයතනයන් සමඟ අතුරු ණය ගිවිසුම් ඇති කර ගන්නා ලදී. මෙම ණය ක්‍රමය දකුණු පළාත සඳහා දෙවැනි ණය ක්‍රමයක් ඇරඹෙන තුරු ක්‍රියාත්මක වේ. මෙම ණය ක්‍රමයේ කොන්දේසි සහ රෙගුලාසි දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ කොන්දේසි හා රෙගුලාසිවලට සමාන වන අතර, අළුත් ණය සඳහා පමණක් පොලී අනුපාතයන් පහත දමා ඇත. ඒ අනුව ව්‍යාපෘති ණය සඳහා පොලී අනුපාතය සහ ප්‍රතිමූල්‍ය ණය සඳහා පොලී අනුපාතය සියයට 2 කින් අඩු කරන ලද අතර, අළුත් ණය සඳහා එම අනුපාතයන් පිළිවෙලින් වසරකට සියයට 12 ක් සහ සියයට 4 ක් වේ.

මෙම ණය ක්‍රමය යටතේ 2000 වසර අවසානය දක්වා රුපියල් දශ ලක්ෂ 37.8 ක මුදලක් සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් මුදාහැර ඇත.

## කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සම්පාදිත උතුරුමැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාතිය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය පිළිවෙලින් 1996 දී හා 1997 දී ආරම්භ කරන ලද අතර, 2000 වර්ෂයේදී එම ව්‍යාපෘතීන් සිය හතරවන සහ තුන්වන වර්ෂයන් සම්පූර්ණ කරන ලදී. අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගොවි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම මගින් දිළිඳුකම තුරන් කිරීම මෙම ව්‍යාපෘතීන් දෙකෙහිම අරමුණ වේ.

මහ බැංකුව ව්‍යාපෘති දෙකෙහිම ණය සංරචකයන් මෙහෙයවීමේ ප්‍රධානතම සම්බන්ධීකරණ ආයතනය ලෙස කටයුතු කරන අතර, අනුරාධපුර මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලය මගින් එම ණය ව්‍යාපෘතීන් මෙහෙයවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ සිය අරමුදලින් ණය සපයනු ලබන සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට එම ණයවල පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා ණය මුදලින් සියයට 2 ක ගෙවීමක් සහ වෙනත් සහාය සේවාවන් සැපයුවද ආරම්භක සැලැස්මෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා බෙහෙවින් පහත වට්ටමක පැවතින. ණය නිකුත් කිරීම මෙම ක්‍රමය යටතේ සිදු නොවීය. එබැවින් ආරම්භයේ සිටම මේ දක්වා නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.3 ක් විය. ණය මුදහැරීම්වල මෙම මන්දගාමී තත්ත්වය නියෝජිත මූල්‍ය ආයතනයන්හි නිලධාරීන්ගේ සැළකිල්ලට ලක් වූ අතර, ඒ අනුව ජාතික සංවර්ධන භාරකාර අරමුදලින් ව්‍යාපෘතිය යටතේ වූ උප ණය සඳහා ප්‍රතිමූල්‍ය අරමුදල් වෙන් කරවා ගැනීමට ඇති හැකියාව රජය විසින් සොයාබලන ලදී. කෙසේ වුවද, එම අරමුදලින් මුදල් ලබාගැනීමේ අසීරුතාව නිසා 2000 වර්ෂයේ ශ්‍රී ලංකාවට පැමිණි ආසියානු සංවර්ධන බැංකුවේ සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවන ජාත්‍යන්තර අරමුදලේ මධ්‍යකාලීන ප්‍රගති සමාලෝචන කණ්ඩායම්, මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රයෝජනයට නොගත් අරමුදල්වලින් කොටසක් සහභාගිත්ව ණය දෙන ආයතනයන්ට ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා වෙන් කිරීමට එකඟ වූහ.

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 5 ක් (ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 40 ක්) ද, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 2.5 ක් (රුපියල් දශ ලක්ෂ 20 ක්) ද ප්‍රතිමූල්‍ය සඳහා වෙන් කරන ලදී. මෙම යෝජිත ණය ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම, ණය ගිවිසුම් සංශෝධනය කිරීමෙන් අනතුරුව නව සැලසුමක් යටතේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

## වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

1992 වර්ෂයේදී ආරම්භ කරන ලද වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමයේ කටයුතු 2000 ජූනි මාසයේදී නිම කරන ලදී. ව්‍යාපෘතිය යටතේ වයඹ පළාතේ ග්‍රාමීය ජනතාවගේ සමාජ, ආර්ථික සහ ආයතනික සහජීවනය වර්ධනය කිරීම අරමුණු කරන ලදී. ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1.8 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 112 ක්) අරමුදල් වෙන්කර තිබුණු මෙම ව්‍යාපෘතියේ ණය සංරචකය අධීක්ෂණය කිරීමෙහිලා ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක වූ අතර, එමගින් ගොවීන් සහ ගොවිපොළමය වාරි පද්ධති සංවර්ධනය කිරීම සමඟ කෘෂිකාර්මික වගා ළිං ඉදිකිරීම, ජල පොම්ප සැපයීම සහ ග්‍රාමීය කාන්තාවන් උදෙසා ආදායම් උත්පාදන අවස්ථාවන් බිහිකරලීම මෙම ණය යෝජනා ක්‍රමය තුළින් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය ආරම්භයේදී කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (පසුකාලීනව වයඹ සංවර්ධන බැංකුව වශයෙන්) සහ හැටන් නැෂනල් බැංකුව ණය යෝජනා ක්‍රමයට එක්ව සිටි අතර, 1996 වසරේදී ලංකා බැංකුව සහ මහජන බැංකුව ද සහභාගිවන ණය දෙන ආයතන වශයෙන් ණය යෝජනා ක්‍රමයට එක්වෙමින් ග්‍රාමීය කාන්තාවන් උදෙසා සුළු ණය සැපයීම පිණිස වැඩි අවකාශ සලස්වන්නට විය.

2000 ජූනි මාසයේදී ව්‍යාපෘතිය නිමාවට පත්වන විට සහභාගිවන ණය දෙන ආයතන විසින් කෘෂි ළිං 918 ක් ඉදිකිරීම පිණිස රුපියලේ දශ ලක්ෂ 31 ක් ණය මුදහැර ඇති අතර, කාන්තා ස්වයං රැකියා ව්‍යාපෘතීන් 3,430 ක් උදෙසා රුපියල් දශ ලක්ෂ 81.5 ක් ණය මුදහැර ඇත. 1996 වර්ෂයේදී සක්‍රීය වශයෙන් ආරම්භ වූ උස්සාන වාරිමාර්ග සංරචකය යටතේ ව්‍යාපෘතීන් 148 ක් උදෙසා රුපියල් දශ ලක්ෂ 4.2 ක් ණය ලබාදී ඇත. ව්‍යාපෘතිය අවසාන වන විට සමස්ත වශයෙන් ණය 4,239 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 112 ක් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිමූල්‍ය ලබාදෙමින් සියයට 100 ක ණය භාවිතා කිරීමේ අනුපාතයක් වාර්තාගත කර ඇත.

## නාගරික පරිසර යටිතල සංවර්ධනය සඳහා වන ණය යෝජනා ක්‍රමය

නාගරික පරිසර යටිතල සංවර්ධනය සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 32 ක ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයක් සැපයීමෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 2000 වසරේදී සැළකියයුතු ප්‍රගතියක් වාර්තා කර ඇත. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද ප්‍රචාරක වැඩසටහන මෙම ප්‍රගතියට හේතු වූ ප්‍රධාන සාධකයක් විය. එසේම ජාතික සංවර්ධන බැංකුව හා සණස

සංවර්ධන බැංකුවට අමතරව ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුද (වයඹ, සබරගමුව, කඳුරට, රුහුණ, රජරට හා ඌව) මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන වශයෙන් ඇතුලත් කර ගන්නා ලදී.

නිවාස සහතික ණය අංක 383 එච්.ජී.006 යටතේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකානු නියෝජිත ආයතනයේ ඇප ආවරණයට යටත්ව ඇමෙරිකාවේ පෞද්ගලික අංශය මගින් 1999 දී ශ්‍රී ලංකා රජය ලබා ගන්නා ලද ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 4 ක ණය මුදල යොදවා මෙම නාගරික පරිසර යටිතල පහසුකම් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. දිවයින පුරා ප්‍රධාන වශයෙන්ම නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල, පරිසර සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය පෙළඹවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණකි. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රති ජල සැපයුම් යෝජනා ක්‍රම හා සනීපාරක්ෂක කටයුතු, කැලිකසල එකතු කිරීම, අපවිත්‍ර ජලය පවිත්‍ර කිරීම ආදී පරිසර සංවර්ධන ව්‍යාපෘති ණය පහසුකම් ලබා ගැනීම සුදුසුකම් ලබයි. මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධාන හා තනි පුද්ගල යන උප ණයකරුවන්ට ඉහත දක්වන ලද ව්‍යාපෘති සඳහා, අදළ සහභාගිත්ව ණය දෙන ආයතන මාර්ගයෙන් ණය මුදල් සපයනු ලැබේ. සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ සණස සංවර්ධන බැංකුව රුපියල් දශ ලක්ෂ 30 ක මුදලක් ප්‍රජා සංවර්ධන හා සනීපාරක්ෂක කටයුතු සහ ජල සැපයම් හා කැලිකසල කළමනාකරණ ව්‍යාපෘති සඳහා ණය වශයෙන් ලබා දී ඇති අතර රුහුණ හා සබරගමුව ප්‍රාදේශීය සංවර්ධන බැංකු රුපියල් දශ ලක්ෂ 2 ක ණය මුදලක් ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් ලබා දී තිබුණි.

ණය මුද හැරීම් වේගවත් කිරීමේ අපේක්ෂාවෙන් යුතුව ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකු සහ පළාත්පාලන ආයතන දැනුවත් කිරීමේ වැඩමුළු ගණනාවක්ද පවත්වන ලදී.

## සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන (ඉසුරු) ණය ව්‍යාපෘතිය

කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනයන්හි මූල්‍ය ආධාර යටතේ පුත්තලම, මහනුවර, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියේ කටයුතු 1990 සිට අඛණ්ඩව ක්‍රියාත්මක විය. බැංකු ක්‍රමය විසින් ඉල්ලුම් කරන ඇප සුරකුම් ලබා දීමට අපහසු අඩු ආදයම්ලාභීන් කණ්ඩායම් ක්‍රමය තුළින් ඒකරාශී කොට කණ්ඩායම් සාමාජිකයින්ගේ ඇප මත ණය පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ ණය ලබා දීමේ ක්‍රමවේදයයි. 1997 දෙසැම්බර් මස අවසානයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ලැබුණු විදේශ ආධාර අවසන් වුවද, ණය ගිවිසුමෙහි කොන්දේසිවලට අනුව චක්‍රීය අරමුදල උපයෝගී කර ගනිමින් 1999 වසරේදී මෙන්ම 2000 වසර තුළදීද ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්විතීයන පදනම මත දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාල සඳහා මුද හරින ලද ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් ආපසු ගෙන්වා ගැනීමටත් ව්‍යාපෘතියෙහි ක්ෂේත්‍ර කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අදළ ප්‍රාදේශීය සංවර්ධන බැංකු වලින් ඒ සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කිරීමටත් කටයුතු යොද ඇත.

2000 වසර අවසන් වනවිට දිස්ත්‍රික්ක හතර තුළ ව්‍යාපෘතිය මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ආවරණය කරන ලද ගම්මාන සංඛ්‍යාව 2,450 ක් වන අතර, ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන් සඳහා ආධාර කිරීමේ අරමුණ ඇතිව ගොඩ නගන ලද “ ස්වඋපකාරක කණ්ඩායම් ” සංඛ්‍යාව 10,281 කි. ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 32,000 ක් වුවද, මෙම කණ්ඩායම් තුළින් ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 61,752 ක් විය. මෙහි සුවිශේෂ ලක්ෂණය වන්නේ මුළු ප්‍රතිලාභීන්ගෙන් සියයට 69 ක් වූ 42,867 ක්ම සමන්විත වන්නේ කාන්තා සහභාගිත්වයෙන් වීමයි. 2000 වසර අවසන් වනවිට ප්‍රතිලාභීන්ගේ ආදයම් උත්පාදන ස්වයං රැකියා මූල්‍යනය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 594 ක මුදලක් සුළු ණය වශයෙන් ව්‍යාපෘතිය මගින් ලබා දී ඇත. ණය මුදලක සාමාන්‍යය රුපියල් 10,245 ක් වූ අතර, වසර මුළුල්ලේම පවත්වාගෙන ගිය ණය ආපසු අය කිරීමේ සමුච්චිත අනුපාතය සියයට 97.3 කි. මීට අමතරව ව්‍යාපෘතියෙහි ඉතිරි කිරීම් රාශීකරණ යෝජනා ක්‍රමය යටතේ 2000 වසර අවසානයේදී ප්‍රතිලාභීන්ගේ කණ්ඩායම් ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 78 ක් විය.

2000 වසරේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම සඳහා චක්‍රීය අරමුදලට රැස් කළ ණය ආපසු අය කිරීම් භාවිතා කළ අතර, ව්‍යාපෘතියේ පරිපාලන හා පුහුණු කිරීම් වියදම් සපුරා ගනු ලැබුවේ අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලත් පොලී ආදයමෙනි.

ස්ව උපකාරක කණ්ඩායම් විධිමත් ආයතන වශයෙන් ඒකාබද්ධ වීමට ඉඩ පහසුකම් සලසමින් ඉසුරු සංවර්ධන සමිති පිහිටුවීමේ කටයුතු මහ බැංකුව විසින් තවදුරටත් මෙම වසර තුළදී සිදු කරන ලදී. 1997 වසර අවසන් වනවිට ව්‍යාපෘතියේ ණය ලබා දීමට හා අනෙකුත් උපකාරක සේවා සැපයීම පිණිස පිහිටුවන ලද කුඩා ස්වඋපකාරක කණ්ඩායම් අත්දකීම් සහිතව පරිණතභාවයට පත් වී තිබූ අතර, ව්‍යාපෘති කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රතිලාභීන්ගේ තිරසර බව අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වන පරිදි කණ්ඩායම් ක්‍රමය ආරක්ෂා කර ගනිමින්ම එම කණ්ඩායම් ඒකරාශී කොට සමිති ආඥ පනත යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීම් සහිත ස්වාධීන ආයතන වශයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි වූ “ ඉසුරු සංවර්ධන සමිති ” පිහිටුවන ලදී. සීමිත වගකීම් සහිත සමිති 187 ක් 2000 වසර අවසන් වනවිට ස්ථාපිත කර තිබුණි. සෑම දිස්ත්‍රික්කයකම වූ සමිති ඒකාබද්ධ කරමින් මාතර, ගාල්ල, පුත්තලම හා මහනුවර යන දිස්ත්‍රික්ක හතරෙහි “ දිස්ත්‍රික් ඉසුරු මහා සංගම්” හතරක් පිහිටුවන ලදී. දිස්ත්‍රික් ඉසුරු මහා සංගම්වල ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය කරමින්

ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් සාමාජිකයින්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා විවිධ ක්‍රියාකාරකම් රැසක් මෙම වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ සාමාජිකයින්ගේ නිෂ්පාදන භාණ්ඩ හා ද්‍රව්‍ය සඳහා තරඟකාරී වෙළඳපළක් ලබා ගැනීමේ අරමුණින් වෙළඳ ප්‍රදර්ශන හතරක් දිස්ත්‍රික් ඉසුරු මහා සංගම් විසින් පැවැත්වූ අතර, උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන සාමාජික දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නැංවීම සඳහා ශිෂ්‍යත්ව අරමුදල් දෙකක් මාතර සහ මහනුවර දිස්ත්‍රික් ඉසුරු මහා සංගම් විසින් ස්ථාපනය කරන ලදී.

“ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට් ලිමිටඩ් ” ආයතනයට සහ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා අවශ්‍ය වන දේශීය ආයුර්වේද ඖෂධ අමු ද්‍රව්‍ය සහ පැලෑටි සපයා දීමේ වැඩසටහනක් ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ ඉසුරු ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ඉසුරු සංවර්ධන සමිති වලින් තෝරා ගත් සාමාජිකයින්ට දේශීය ආයුර්වේද ඖෂධ පැලෑටි වගාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය මත ඉහත සඳහන් ආයතන විසින් ලබා දෙන ලදී. වසර තුනකට පෙර පිහිටුවන ලද ඉසුරු සංවර්ධන සමිති විවිධ ක්‍රියාකාරකම් පවත්වාගෙන යමින් සමිතිවල ශක්තිය වර්ධනය කරගෙන ඇත. 2000 වසර අවසානයට මෙම සංවර්ධන සමිතිවල නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනය සහ ඉතිරි කිරීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5.9 ක්, සහ රුපියල් දශ ලක්ෂ 7.0 ක් විය. මෙම සමිති සිය අරමදල් මගින් දෙනු ලැබූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 54 ක් විය.

## දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය (ජපන් මිත්‍රත්ව ඉසුරු ණය ව්‍යාපෘතිය)

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව මගින් මූල්‍යනය කෙරුණු මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු සිදු කරන ලදී.

“ දිළිඳුකම පිටු දැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතියක් ” ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජයත්, “ ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා බැංකුවත්” අතර 1999 අගෝස්තු 04 වෙනි දින ගිවිසුමකට එළඹුණි. දැනට සාර්ථකව ක්‍රියාත්මක කරන ඉසුරු ව්‍යාපෘතියෙහි ණය සහ පහසුකම් සැපයීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් විධිමත් මූල්‍ය ආයතන වලින් මූල්‍ය පහසුකම් ලබාගත නොහැකි, එවැනි පිළි ගැනීමක් නොමැති, ගැමි දිළිඳු ජනතාව සඳහා අවම පිරිවැයකින් සහ වැඩි කාර්යක්ෂමතාවයකින් වඩා ඵලදායී ලෙස ණය පහසුකම් සැපයීමට හැකි ක්‍රමවේදයක් ගොඩ නැගීම මෙහි මූලික පරමාර්ථය වේ. මේ තුළින් දිළිඳු ජනතාවගේ ආර්ථික සහ සමාජයීය තත්ත්වය ඉහළ නැංවීමත්, ඔවුන්ගේ සමාජ සුභසාධනය දියුණු කිරීමත්, එමගින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට ඔවුන් සහභාගී කරවා ගැනීමත් අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බදුල්ල, නුවරඑළිය, මාතලේ, කළුතර, කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තෝරාගෙන ඇත.

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ව්‍යාපෘති පරිපාලන කටයුතු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මධ්‍යම ව්‍යාපෘති කාර්යාලයක් සහ දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාල පිහිටුවා ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගනු ලැබින.

ව්‍යාපෘතියෙහි ණය දීම, තාක්ෂණික සේවා සැපයීම, පුහුණු කටයුතු සහ ව්‍යාපෘති පරිපාලන කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් දශ ලක්ෂ 1,610 කි (රු.ද.ල. 870). ඉන් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව ජපන් යෙන් දශ ලක්ෂ 1,368 ක් සපයන අතර, ඉතිරි ප්‍රමාණය ව්‍යාපෘති වියදම්වල දේශීය වියදම් සංරචකය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතුව ඇත.

## සුරතුර වැඩසටහන - කුඩා ව්‍යවසාය ණය තුළින් ස්වයං රැකියා ප්‍රවර්ධනය

සුරතුර වැඩසටහනට සම්බන්ධ සහභාගිත්ව ණය දෙන ආයතන වන ලංකා බැංකුව, මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව තම අරමුදල් උපයෝගී කර ගනිමින් ප්‍රතිලාභීන් වෙත වාර්ෂිකව සියයට 10 ක පොලී ප්‍රතිශතයකට ණය මුදල් සැපයීමේ කටයුතුවල නිරත වෙමින් සුරතුර යෝජනා ක්‍රමයේ දෙවන අදියරට මෙම වසර පුරා සහභාගි විය. රජය වාර්ෂිකව සියයට 10 ක පොලී සහනාධාරයක් ගෙවීමෙහි තවදුරටත් නියැලුණි.

සහභාගී වන ණය දෙන ආයතන තුළින් සුදුසු ණය ඉල්ලුම්කරුවන් විසින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ආදායම් උත්පාදන ස්වයං රැකියා ව්‍යාපෘති 30,000 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 1,300 ක ණය මුදල් මුදා හැරීමට සුරතුර වැඩසටහන දෙවන අදියර යටතේ ඉලක්ක කරනු ලැබීය. ව්‍යාපෘතිය මගින් විශේෂයෙන්ම රැකියා විරහිත යෞවනයන්ට තමන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීමට සහ නව ව්‍යාපෘති ආරම්භ කර ගැනීමට ණය මුදල් ලබා දෙනු ලැබේ.

2000 වසර අවසන් වනවිට සහභාගී වන ණය දෙන ආයතන විසින් උප ණය ව්‍යාපෘති 23,000 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 997 ක් මුදා හැර තිබුණි. එසේම විමසුමට භාජනය කරන ලද වසර තුළ සහභාගී වන ණය දෙන ආයතන විසින් ව්‍යාපෘති 3,752 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 172 ක් ලබා දී තිබුණි.

1997 වර්ෂයේදී සම්පූර්ණ කරනු ලැබූ සුරතුර වැඩසටහන පළමු අදියර යටතේ ලබා දෙන ලද ණය මුදල්හි ආපසු අය කිරීම් සම්බන්ධ අධීක්ෂණ කටයුතුවල ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් නිරත විය. එම අදියර යටතේ රජය විසින් රුපියල් දශ ලක්ෂ 350 ක මුදලක් වාර්ෂිකව සියයට 4 ක පොලී ප්‍රතිශතයක් යටතේ වසර 5 ක සහන කාලයක්ද ඇතුළුව වසර 7 කින් ආපසු ගෙවීම සඳහා

සහභාගී වන ණය දෙන ආයතන වෙත ලබා දීම සඳහා වෙන් කරනු ලැබීය. සුරතුර පළමු අදියර වැඩසටහන සමස්තයක් වශයෙන් සියයට 65 ක ආපසු අය කර ගැනීමේ ප්‍රතිශතයක් පවත්වා ගැණිනි. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ කරුණු සොයා බැලීමේ සමීක්ෂණය අනුව ණයලාභීන් හඳුනා ගැනීමේදී පැවති දුර්වලතා, ණය ආපසු අය කිරීම්වල අඩු ප්‍රතිශතයක් ඇති කිරීමට හේතු වී ඇති බව පැහැදිලි විය.

### ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීමක් පරිදි ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය 1997 දී ආරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් රජය විසින් විශේෂ අනුමත ණය ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රජය වෙත වෙන් කරන ලද රුපියල් දශ ලක්ෂ 284 ක් රජය විසින් සපයනු ලැබීය. සමූපකාර සමිති, ගොවි සංවිධාන හා සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති හරහා ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරනු ලැබීය. 2000 වසර අවසන් වනවිට ව්‍යාපෘතිය මගින් මූල්‍යකරණය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 25 කි. ණය මුදල් භාවිතා කිරීමේ ඌනතාවයක් පෙන්නුම් කිරීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ණය මුදලේ සුරක්ෂිතතාවය සඳහා බැංකුවලට පිළිගත හැකි සුරැකුම් ඉදිරිපත් කිරීමට සමූපකාර සමිතිවලට හා ගොවි සංවිධානවලට නොහැකි වීමය. ආහාර සැකසුම, කෙසෙල් වගාව, සත්ව පාලනය හා සහල් සැකසීම වැනි ව්‍යාපෘති සඳහා බැංකු ආයතන විසින් අනුමත කර ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 129 කි. කෙසේ වුවත්, දැනට අනුමත කර ඇති ණය මුදල් මුදා හැරීම දක්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

### කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය

කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1995 දී සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඒ යටතේ ලබා දුන් ණය මුදල්වල ආපසු අය කිරීම් යොදා ගනිමින් චක්‍රීය අරමුදලක් ස්ථාපිත කරනු ලැබීය. 1997 දී එහි කටයුතු ආරම්භ විය. මෙම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික්කය තුළ සිටින රැකියා විරහිත උගත් යෞවනයන් හට නව ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමටත්, දැනටමත් ඇති එවැනි ව්‍යාපෘති වර්ධනය කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් සැපයීම මෙම වසර තුළත් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් හඳුනා ගැනීම, ඔවුන් සඳහා අවශ්‍ය ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා ප්‍රතිලාභීන් අදාළ බැංකු ආයතන වෙත යොමු කිරීම යන කටයුතුවලදී ගාස්තුවක් අය කිරීමේ පදනම මත ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් පිරිසක් තම සේවාවන් සපයනු ලැබේ. 2000 වසර අවසන් වනවිට මෙම ව්‍යාපෘතිය මගින් විවිධ උප ණය ව්‍යාපෘති 3,594 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 142.3 ක මුදලක් අරමුදල් ලෙස සපයා තිබිණි. 2000 වසර තුළ ව්‍යාපෘතියට සහභාගී වන ණය දෙන ආයතන වන ලංකා බැංකුව, මහජන බැංකුව හා සබරගමුව සංවර්ධන බැංකුව විසින් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2 ක්, රුපියල් දශ ලක්ෂ 12 ක් හා රුපියල් දශ ලක්ෂ 29 ක් බැගින් ව්‍යාපෘති සඳහා ප්‍රදානය කර තිබිණි. ව්‍යාපෘතිය යටතේ ණය බෙදා හැරීමේ යන්ත්‍රණය ඉතා සාර්ථක මට්ටමකට පත්ව තිබේ. එබැවින් අනාගතයේදී ව්‍යාපෘතියෙහි කටයුතු තවදුරටත් ව්‍යාප්ත වේ යයි අපේක්ෂා කෙරේ.

### නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2000 දෙසැම්බර් මස අනුමත කරන ලදී. ශ්‍රී ලංකා රජය, ආසියානු සංවර්ධන බැංකුව සමග 1999.11.15 දින අත්සන් කළ ගිවිසුමේ විධිවිධානයන්ට අනුව ආසියානු සංවර්ධන බැංකුව විසින් නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය කරනු ලැබේ. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව වි.ගැ.හි. දශ ලක්ෂ 13.7 ක ණය මුදලක් සපයනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2000 මාර්තු මස සිට 2006 අගෝස්තු මස දක්වා අවුරුදු 6 ක කාලයක් තුළ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ඇත.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා පුද්ගලික අංශය අතර සමීප සබඳතාවයක් ඇති කිරීමෙන් හා දක්ෂතා වර්ධනය පදනම් කර ගත් පුහුණු වැඩසටහන් හඳුන්වා දීම මගින් වෘත්තීය පුහුණු ක්‍රමවේදය ප්‍රතිව්‍යුහගත කොට ඉහළ ගුණාත්මක භාවයකින් යුතු ශ්‍රම බලකායක් ගොඩ නංවා ගැනීම පිණිස පවත්නා නිපුණතා සංවර්ධන වැඩසටහන්වල ගුණාත්මක භාවය හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වෙයි. සමස්ථ ව්‍යාපෘතිය, ප්‍රධාන උපාංග සතරකින් සමන්විත වී ඇත. එනම් ; (අ) නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලාවල අදාළත්වය සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, (ආ) ආයතනික වර්ධනය සහ මානව සම්පත් වර්ධනය, (ඇ) සම්පත් ඒකරාශී කිරීම සහ තිරසාර පැවැත්ම සහතික කිරීම සහ (ඈ) නව ආකාරයේ මැදිහත් වීමක් මගින් රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශයේ සහභාගිත්වය තහවුරු කරලීම වේ.

නිපුණතා සංවර්ධන පාඨමාලා සාර්ථකව නිම කළ පුද්ගලයින්ට මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ණය සඳහා සහභාගී වන ණය දෙන ආයතනවලට ප්‍රතිමූල්‍ය සැපයීම මගින් රාජ්‍ය නොවන සංවිධානවල සහ පුද්ගලික අංශයේ සහභාගිත්වය ලබා ගැනීමට සුදුසු නව ආකාරයේ මැදිහත්වීම් සඳහා සහාය වීම ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය භාරය වේ. මේ සඳහා ශ්‍රී ලංකා රජය සමග ගිවිස ගත යුතු " පරිපාලන ගිවිසුම " සහ සහභාගිත්ව ණය දෙන ආයතන සමග අත්සන් කළයුතු " උප ණය ගිවිසුම් " සකස් කිරීමට මූලික පියවර ගන්නා ලදී. නිපුණතා සංවර්ධන වැඩමුළු සාර්ථකව නිම කළ ආර්ථික ඌනතා ඇති අභ්‍යාසලාභීන්ට ස්වයං රැකියා වර්ධනය කර ගැනීම

සඳහා ප්‍රාරම්භක දිරි ගැන්වීම් කෙරෙන නියාමක ක්‍රියාදාමයක් දියත් කිරීමට මෙම ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය තුළින් සුළු පරිමාණ ව්‍යවසායකයින්ට සහ ස්වයං රැකියා අපේක්ෂා කරන්නවුන්ට රු. 50,000/- ක අවමයකට සහ රු. 250,000/- ක උපරිමයකට යටත්ව ණය පහසුකම් සැපයීම සඳහා ඇ.එ.ජ.ඩොලර් 657,000 ප්‍රතිපාදනය කර ඇත.

## මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් යොදා 1999 සිට ක්‍රියාත්මක වූ මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2000 වසරේදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය නියාමක පදනමක් යටතේ මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වෙයි. රජය විසින් මීට පෙර ක්‍රියාත්මක කරන ලද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වලින් මෙම ව්‍යාපෘතිය සංකල්පීය වශයෙන් බොහෝදුරට වෙනස් වෙයි. මෙම නව වැඩසටහන මගින් යටිතල පහසුකම් හා ණය සංරචකයන් සඳහා පෞද්ගලික අංශය සඵල ලෙස සහභාගී විය හැකි අතර දිස්ත්‍රික්කය තුළ තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා එම දිස්ත්‍රික්කය තුළ පවත්නා ව්‍යවසායික හැකියාවන් උපයෝගී කර ගැනීමත් සිදු කරනු ඇත. ණය සංරචකය වෙනුවෙන් මෙහෙයුම් නියෝජිත ආයතන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතියේ අරමුණු සඵල කර ගැනීම වෙනුවෙන් මාතලේ ප්‍රාදේශීය කාර්යාලය සතු සම්පත් උපයෝගී කර ගනු ඇත. ණය සංරචකයේ ප්‍රධාන සහභාගිත්ව ණය දෙන ආයතනය ලෙස කඳුරට සංවර්ධන බැංකුව හඳුනාගෙන ඇත. විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රාමීය ප්‍රදේශයන්හි පවත්නා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අරමුදල් සැපයීම වෙනුවෙන් වි.ගැ.හි. දශ ලක්ෂ 2 ක ණය සංරචකයක් ඇතුළුව වි.ගැ.හි. දශ ලක්ෂ 8.35 ක ණය මුදලක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් රජය වෙත ලබා දී තිබේ. ණය සංරචකයේ කටයුතුවලට අධාර කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයක් මාතලේ පිහිටුවා ඇත. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම යටතේ ණය සංරචකය අධීක්ෂණය සහ පසු විපරම් කිරීම මාතලේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලය මගින් කරනු ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව සමග අතිරේක ණය ගිවිසුමක්ද සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සමග පරිපාලන ගිවිසුමක්ද විමසුමට භාජනය වන මෙම වසර තුළදී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දනට ක්‍රියාත්මක කරමින් පවතින ග්‍රාමීය ණය ව්‍යාපෘතිවල සාරාංශයක් II-13 සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත් කර ඇත.

## මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල

මුදල් මණ්ඩලය විසින් 2000.09.15 දින සිට බලපැවැත්වෙන පරිදි මාතර, අනුරාධපුර සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවට පවරන ලදී.

ප්‍රාදේශීය කාර්යාල විසින් 2000 වසරේදී සංවර්ධන කටයුතු සහ සම්ප්‍රදායික මහ බැංකු කටයුතු තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. සංවර්ධන කටයුතුවලදී ප්‍රාදේශීය කාර්යාල ත්‍රිත්වය ප්‍රමුඛත්වය දෙන ලද්දේ ගොවියාට තමන්ගේ නිෂ්පාදනවල හොඳ මිලක් හා ගැණුම්කරුට කලට වේලාවට ගුණාත්මක නිෂ්පාදනයන්ද ලබා ගැනීමට හැකි වන පරිදි කලින් තීරණය කරන ලද ඉදිරි මිලක් යටතේ කෘෂි ද්‍රව්‍ය අලෙවිය සඳහා ගොවීන් හා ගොවි ද්‍රව්‍ය ගැණුම්කරුවන් අතර ගිවිසුම් ඇති කරලීමට අදාළ වූ ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ප්‍රචලිත කිරීමේ කටයුතුවලටය. ප්‍රාදේශීය කාර්යාල තුන විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුද සහභාගී කරගෙන අදාළ ප්‍රදේශයන්හි මෙම ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමයේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මීට අමතරව ප්‍රාදේශීය කාර්යාල විසින් ව්‍යවහාර මුදල් කටයුතු, (මාතර, අනුරාධපුරය) චෙක්පත් නිෂ්කාශන කටයුතු, දත්ත රැස් කිරීම, ප්‍රතිලාභී පුහුණු වැඩසටහන්, ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලට සහාය දීම සහ ප්‍රාදේශීය සංවර්ධන කටයුතුවල යෙදෙන ආයතන හා සංවිධාන අතර කටයුතු සම්බන්ධීකරණ කිරීමේදීද යෙදුණි.

## මාතර

ප්‍රාදේශීය කාර්යාලය ඉටු කළ සංවර්ධන බැංකු කටයුතු අතර ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වූ ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය, අන්තර්ජාතික සහයෝගීතාවය පිණිස වූ ජපන් බැංකුවේ මූල්‍ය දායකත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කරන දිළිඳුකම පිටු දකීමේ සුළු පරිමාණ ණය ව්‍යාපෘතියේ මූලික කටයුතු, රුහුණු සංවර්ධන බැංකුව සහ අනෙක් බැංකු මාර්ගයෙන් ප්‍රදේශය තුළ ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය හඳුන්වා දීම, අරුනළු ගම් නගා සිටුවීමේ වැඩසටහන සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම කීපයක් සම්බන්ධීකරණය කිරීම ආදිය ඇතුළත් විය.

පර්යේෂණ සහ සංඛ්‍යාන කටයුතු යටතේ මාතර නගරය තුළ සතිපතා දත්ත රැස් කිරීමට සහ මාතර දිස්ත්‍රික්කයේ තෝරා ගත් මධ්‍යස්ථාන 6 කින් දත්ත රැස් කිරීමට තවදුරටත් සහාය වීම, මාතර නාගරික සීමාව තුළ කුඩා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම සහ දිස්ත්‍රික්ක අනුව රැස් කළ දත්ත ප්‍රකාශනය යන කටයුතු කරගෙන යන ලදී. මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් කරගෙන යන ලද සම්ප්‍රදායික මහ බැංකු කටයුතු අතර ව්‍යවහාර මුදල් කටයුතු, වාණිජ බැංකු සඳහා ජංගම ගිණුම් පවත්වාගෙන යාම, ප්‍රාදේශීය නිෂ්කාශන කටයුතු පවත්වාගෙන යාම, ප්‍රාථමික ගැණුම්කරුවන් මගින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමට දිරි ගැන්වීම, මහ බැංකු ප්‍රකාශන

අලෙවි කිරීම, පුහුණු පාඨමාලා පැවැත්වීම, රුහුණ සංවර්ධන බැංකුවේ නිලධාරීන් පුහුණු කිරීම, පාසැල් සිසුන් සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වාණිජ බැංකු සහ අනෙකුත් ආයතනවලට අදාළ සංවර්ධන මූල්‍ය කටයුතු ආදිය කැපී පෙනුණි.

අදාළ කාලය තුළ ප්‍රාදේශීය කාර්යාලය, ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව සහ රුහුණ සංවර්ධන බැංකුව සමග සම්බන්ධ වී ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ප්‍රදේශය තුළ හඳුන්වා දීමට විශාල ප්‍රයත්නයක් දැරීය. මෙහිදී වී වගා කරන ගොවීන් සහ වී මිලදී ගන්නා වෙළඳුන් සඳහා වීරවිල, ලුණුගම්වෙහෙර, අම්බලන්තොට සහ අඟුණකොලපැලැස්ස යන ස්ථානවලදීද, තල වගා කරන ගොවීන් සඳහා සූරියවැව, ලුණුගම්වෙහෙර සහ වීරකැටිය යන ස්ථානයනහිදීද රැස්වීම් මාලාවක් පවත්වන ලදී. මෙම වැඩසටහන ප්‍රාදේශීය කාර්යාල විසින් දක්ෂිණ සංවර්ධන අධිකාරිය යටතේ පිහිටුවා ඇති බැංකු කරුවන්ගේ සංවිධානය තුළින් එම ප්‍රදේශයේ වාණිජ බැංකු නිලධාරීන්ට හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2000 වසර අවසානයේදී වී සහ තල මිලදී ගැනීමට අදාළව රුපියල් දශ ලක්ෂ 48.9 ක් වටිනා ගිවිසුම් 779 ක් අත්සන් කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාලය මගින් මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පරවාහැර සහ අඟුළුමඩුවහිදී අරුණළු ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රුහුණ සංවර්ධන බැංකුවට උපකාර විය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ව්‍යවහාර මුදල් කටයුතු සම්බන්ධයෙන් සංසරණයට නොපැමිණ තිබූ කාසි එකතු කර ගැනීම සඳහා විශේෂ වැඩසටහනක් දියත් කළ අතර එහිදී වාර තුනකදී රුපියල් දශ ලක්ෂ 3.24 ක් වටිනා කාසි මළු 3,775 ක ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ ව්‍යවහාර මුදල් කටයුතු දෙපාර්තමේන්තුව වෙත යවන ලදී. මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ක්‍රියාත්මක වන මුදල් නිෂ්කාශන කටයුතු මගින් ප්‍රදේශයේ වාණිජ බැංකු 7 ක් සඳහා නිෂ්කාශන පහසුකම් සැපයූ අතර ඉන් ප්‍රදේශයේ ජංගම ගිණුම් හිමි ව්‍යාපාරිකයින්ට සිය චෙක් තැන්පතු කඩිනමින් මුදල් කර ගැනීමට ඉඩකඩ ලැබිණි.

## මාතලේ

සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී මාතලේ ප්‍රාදේශීය කාර්යාලය මගින් ඉටු කරන ලද ප්‍රධාන කටයුතු වූයේ කෘෂි නිෂ්පාදන සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ප්‍රචලිත කිරීම, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, උසස් කෘෂි තාක්ෂණික ක්‍රම ගැන ගොවීන් දැනුවත් කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධනය, සුළු ව්‍යාපාර සංවර්ධනය, ගම් නගා සිටුවීමේ වැඩසටහන්, අලෙවි සංවර්ධනය, බැංකු ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ ග්‍රාමීය ණය කටයුතු යනාදියයි. ගොවීන් විසින් මුහුණ පෑ අලෙවිකරණ ගැටළුවලට විසඳුමක් සේ ප්‍රාදේශීය කාර්යාලය ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ප්‍රචලිත කිරීම කෙරෙහි ප්‍රමුඛස්ථානයක් ලබා දුනි. එහි ප්‍රථම වැඩසටහන මොරයායේදී ආරම්භ කළ අතර, ලංකා බැංකුව සහ කඳුරට සංවර්ධන බැංකුව පහසුකම් සපයන්නන් ලෙස එක් වෙමින් වසර 2000 අවසන් වනවිට ඉදිරි වෙළඳ ගිවිසුම් 312 ක් ඇති කර තිබුණි. ප්‍රාදේශීය කාර්යාලය ගොවීන්ට සිය දක්ෂතා ඔප්නංවා ගැනීම පිණිස පුහුණු පහසුකම් ලබා දුන් අතර වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීය. ප්‍රාදේශීය කාර්යාලය මෙම වසර තුළදී ගම් නගා සිටුවීමේ වැඩසටහන් යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ දුල්ලෑව ගම තෝරා ගන්නා ලදී. තවද, මාතලේ ප්‍රාදේශීය කාර්යාලය මගින් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි බැංකු කරුවන්ට සිය ක්ෂේත්‍රයන්හි සුහදතාවයකින් කටයුතු කරගෙන යාම සඳහා උද්ගත වන විවිධ ප්‍රශ්න සාකච්ඡා කර ගැනීමට සංවිධාන දෙකක්ද පිහිටුවන ලදී.

වසර 2000 තුළදී ප්‍රාදේශීය කාර්යාලය, ආහාර හා පෝෂණය නංවාලීමේ ණය ක්‍රමය, කුඩා තේ වතු සංවර්ධනය ව්‍යාපෘති ණය ක්‍රමය, දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘති ණය ක්‍රමය, නාගරික පරිසරික සහ යටිතල සංවර්ධන ව්‍යාපෘතිය, කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (ණය අධීක්ෂණ කමිටු කටයුතු), සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය, දිස්ත්‍රික් ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික ණය සඳහා පොලී සහනාධාර ලබා දීම යන කටයුතු නොකඩවා කරගෙන යන ලදී.

ප්‍රාදේශීය කාර්යාලය වසර 2000 තුළදී මාතලේ සහ මහනුවර නිෂ්කාශන මධ්‍යස්ථාන දෙකෙහි කටයුතුද පවත්වා ගන්නා ලදී. මහනුවර නිෂ්කාශනාගාරය රාජ්‍ය බැංකු දෙක සහ පෞද්ගලික බැංකු 9 ක් නියෝජනය කරමින් රුපියල් බිලියන 23.1 ක් වටිනා චෙක්පත් 811,553 ක් නිෂ්කාශනය කරන ලද අතර මාතලේ නිෂ්කාශනාගාරය විසින් රුපියල් බිලියන 2.1 ක් වටිනා චෙක්පත් 113,433 ක් නිෂ්කාශනය කරන ලදී. තොරතුරු රැස් කිරීමේ මධ්‍යස්ථාන හයකින් ලබා ගන්නා ලද දත්ත මත වසර 2000 සඳහා "කඳුරට පාරිභෝගික මිල දර්ශකය" සකස් කිරීමෙහි කටයුතුවල තවදුරටත් නිරත විය.

## අනුරාධපුර

අනුරාධපුර ප්‍රාදේශීය කාරයාලය ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වූයේ සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, වගා ක්‍රම සංවර්ධනය, ඉදිරි වෙළඳ ගිවිසුම්, ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් පවතින ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලේ අනුග්‍රහයෙන් පවතින ග්‍රාමීය සවර්ධන ව්‍යාපෘතිය යටතේ ණය මුදා හැරීම, අධ්‍යාපන, සම්මන්ත්‍රණ, දත්ත රැස් කිරීම, බැංකු ප්‍රකාශන අලෙවි කිරීම, ව්‍යවහාර මුදල් කටයුතු සහ ප්‍රාදේශීය මුදල් නිෂ්කාශන කටයුතු යනාදියයි.

සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධන කටයුතුවලට අදාළව අනුරාධපුර දිස්ත්‍රික්කයේ තරුණයන් දැනුවත් කිරීම වෙනුවෙන් ආහාරපාන සැකසීම, අමු ද්‍රව්‍ය සපයා ගැනීම, බැංකු සහ මූල්‍ය පහසුකම් ලබා ගැනීම, තත්ත්ව පාලනය වැනි මාතෘකා

යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති ඇරඹීමට ඔවුන්ට උපකාර වන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් තුනක්ද පවත්වන ලදී.

දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම සහ ඔවුන්ගේ දක්ෂතා ඔප් නැංවීම සඳහා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ඉලක්ක කර ගත් කණ්ඩායම් වෙනුවෙන් විවිධ පුහුණු පාඨමාලා සහ වැඩමුළුද පවත්වන ලදී. දියුණු වගා ක්‍රම හඳුන්වා දීමේ වැඩසටහන් මගින් ප්‍රදේශයේ ගොවීන්/වැවිලිකරුවන් නවීන වගා තාක්ෂණය, වාරි ක්‍රම, නාස්තිය අවම කිරීම, උසස් තත්ත්වයෙන් යුතු නිෂ්පාදනයන් පවත්වාගෙන යාම වැනි කරුණු සම්බන්ධව දැනුවත් කිරීම් කරන ලදී.

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් 2000 වසරේදී ප්‍රදේශයේ බැංකුවල සහභාගිත්වයෙන් ප්‍රදේශයේ ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය නංවාලීම සඳහා වැඩපිළිවෙලක් දියත් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් දශ ලක්ෂ 35 ක් වටිනා ඉදිරි වෙළඳ ගිවිසුම් 963 ක් අත්සන් කිරීමට අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය සමත් විය.

මේ කටයුතුවලට අමතරව ප්‍රාදේශීය කාර්යාලය ව්‍යවහාර මුදල් ගණුදෙනු කටයුතු, ප්‍රාදේශීය නිෂ්කාශන කටයතු සහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීමේ කටයුතුවලද යෙදී සිටී.

## මූල්‍ය වෙළඳපොළ

ණය වෙළෙඳපොළ කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය පරිසරයක් ගොඩ නැගීමට ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය වෙළඳපොළ දෙපාර්තමේන්තුව හරහා ආධාර වේ. මූල්‍ය වෙළඳපොළේ කාර්යක්ෂම හා මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන්නාවූ යෝග්‍ය සාතුබල හා ආයතනික ආධාර හඳුනා ගැනීමත්, ක්‍රියාකාරිත්ව හා නියාමක පද්ධතීන් වර්ධනය කිරීමත් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයක් වන්නේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මූල්‍ය වෙළඳපොළ ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීමත්, මූල්‍ය අංශ ප්‍රතිසංස්කරණ කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කිරීමත්ය. ජාත්‍යන්තර මූල්‍ය අංශයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන තාක්ෂණික ආධාර ව්‍යාපෘතිවලට අදාළ කටයුතු කිරීමද දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයක් වේ.

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ දෙපාර්තමේන්තුව කාර්යයන් රැසක් පිළිබඳව කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කාර්යයේ නියුක්ත විය. මෙයින් සමහර වැඩ කටයුතු පහත සඳහන් කර ඇත.

### තැන්පතු රක්ෂණ ක්‍රමය

බැංකු සහ මූල්‍ය සමාගම් ආවරණය වන පරිදි අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ස්ථාපනය කිරීමේ හැකියාව සොයා බැලීම පිණිස මහ බැංකුව විසින් කාර්ය සාධන බලකායක් පත් කරන ලදී. යෝජිත ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නේ, සුළු තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු අතර පවත්නා මෙහෙයුම් කොන්දේසි සම මට්ටමකට ගෙන ඒමයි.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම කාර්ය සාධන බලකායෙන් අපේක්ෂිතය.

(අ) රක්ෂණ ක්‍රමයෙන් කොතෙක්දුරට තැන්පතු රක්ෂණ විය යුතුද හා රක්ෂණය විය යුතු පථය

(ආ) ආයතනික ව්‍යුහය සහ පරිපාලනය

(ඇ) අරමුදල් සැපයීමේ පිරිවැය හා එහි අයිතිය

(ඈ) තැන්පතුකරුවන්ගේ හිමිකම් සලකා බැලීම පිණිස තිබිය යුතු වරණීය අනුපාත සහ ප්‍රතිපත්ති

(ඉ) තැන්පතු රක්ෂණ ක්‍රමය ස්ථාපනය කිරීමට සහ පාලනය කිරීමට අවශ්‍ය නීති මාලාවේ දළ සැලැස්ම යෝජනා කිරීම

### නීති අණ පනත් සම්පාදනය හා යෝජිත පනත්

#### (අ) ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥ පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥ පනත යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා නීති පද්ධතීන්

බලය පාලනය කිරීමේ නව අණපනත් යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වූ ක්‍රියාකාරී සහ අධීක්ෂණ වැඩපිළිවෙලක් 2000 වර්ෂයේ මාර්තු මාසයේදී ගැසට් කරන ලදී. හුදෙක්, භාණ්ඩාගාර සුරැකුම්පත් පමණක් ගණුදෙනු කිරීම පිණිස, ඒ සඳහාම වෙන් කළ ප්‍රාග්ධනය සහිත ඒකකයන් පිහිටුවීමට මෙයින් වෙළඳුන්ට අවසර ලැබිණ. මෙම නව ක්‍රමය යටතේ ප්‍රාථමික වෙළඳුන් 8 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

#### (ආ) රක්ෂණ පනත

වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය සඳහා වූ පනත, එම වර්ෂයේ ජූලි මාසයේදී පාර්ලිමේන්තුවේ සම්මත විය.

මෙම පනත මගින් රක්ෂණ කර්මාන්තය සඳහා නියාමකාත්මක අධිකාරියක් ස්ථාපිත කිරීමට අවකාශ සැලසේ. මෙම රක්ෂණ නියාමකාත්මක ආයතනයට රක්ෂණ සමාගම්, රක්ෂණ බ්‍රෝකර් සමාගම් මෙන්ම ඒජන්තවරුන්ගේ ක්‍රියාකාරී පරිසරය අධීක්ෂණය කිරීමේ වගකීම පැවරෙනු ඇත. මෙම

විශේෂිත පනත මගින් රක්ෂණ සමාගම් සඳහා වන අවම ප්‍රාග්ධන ප්‍රමාණය සහ අවශ්‍ය ප්‍රතිපාදන එනම්, ණය ගෙවිය හැකි මට්ටම් සහ සංචිත වැනි දේ සඳහා සීමාවන් නිර්දේශ කරනු ලැබේ.

මෙම නව පනත මගින් රක්ෂණ සමාගම්, රාජ්‍ය සුරැකුම්වල යෙදිය යුතු ආයෝජන ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට කටයුතු කර ඇත. රක්ෂණ සහ බ්‍රෝකර් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය සහ උසස් නිලධාරීන්ගේ සුදුසුකම්, පනතේ නිර්දේශ කර ඇත. එසේම, එම පනතේ තක්සේරු හා විගණන වාර්තා සඳහා අවශ්‍යතාද සඳහන් කර ඇත. මෙම පනත මගින් 1962 අංක 25 දරන රක්ෂණ සමාගම් පාලනය කිරීමේ පනත අහෝසි වනු ඇත.

### (ඇ) මූල්‍ය කල්බදු පනත

නව මූල්‍ය කල්බදු පනතට වර්ෂ 2000 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තු අනුමැතිය ලැබුණු අතර වර්ෂ 2001 මුල් වකවානුවේ සිට ක්‍රියාත්මක වීමට නියමිතය.

මෙම මූල්‍ය කල්බදු පනත මගින් කල්බදු කර්මාන්තය සඳහා පරිපාලනමය හා අධීක්ෂණ රාමුවක් ලබා දීමත්, මූල්‍ය කල්බදු ගණුදෙනු පිළිබඳ අයිතිවාසිකම් හා වගකීම් නිශ්චය කිරීමත් කරනු ඇත. මූල්‍ය කල්බදු සමාගම්වලට බලපත්‍ර ලබා දීම, ඒවා පරිපාලනය සහ අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ඇත.

## පනත් කෙටුම්පත් සහ විධිවිධාන පිළියෙල කිරීම

වසර තුළදී පනත් හා විධිවිධාන කිහිපයක් කෙටුම්පත් කරනු ලැබූ අතර, ඒවා 2001 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අවසාන කිරීමට නියමිතය. කෙටුම්පත් කරනු ලැබූ පනත් හා විධිවිධාන පහත දැක්වේ.

### (අ) විශ්‍රාම නඩත්තු ව්‍යවස්ථා, කොමිෂන් සභා පනත් කෙටුම්පත

මෙම විශ්‍රාම නඩත්තු ව්‍යවස්ථා කොමිෂන් සභා පනත් කෙටුම්පතට වර්ෂ 2000 මැයි මාසයේදී කැබිනට් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මේ මගින් පෞද්ගලික විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සඳහා ව්‍යවස්ථාපිත අධිකාරියක් ස්ථාපිත කිරීමේ පහසුකම ලබා දී තිබේ.

### (ආ) 1988 අංක 30 දරණ බැංකු පනත සංශෝධනය කිරීම

සංශෝධිත බැංකු පනත වර්ෂ 2000 පෙබරවාරි මාසයේදී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කෙටුම්පත සඳහා වර්ෂ 2000 අප්‍රේල් මාසයේදී කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණි.

මෙම සංශෝධන මගින් මහ බැංකුවට ඇති අධීක්ෂණ හා පාලන බලතල ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. බලපත්‍රලාභී ක්‍රියා මාර්ගයන් හා සම්බන්ධ වීම, බලපත්‍ර අවලංගු කිරීම, බැංකු ඒකාබද්ධ කිරීම, පාඩු ලබන බැංකු වසා දැමීම සහ බැංකු අධ්‍යක්ෂවරු හා උසස් කළමනාකාර තනතුරු සඳහා සුදුසුකම් නියම කිරීම, පත් කිරීම සහ ඉවත් කිරීම යන කටයුතු මේ සංශෝධනවලට අයත් වේ. මුදල් ගණුදෙනුවලට වඩා අනෙකුත් මූල්‍ය ව්‍යාපාරවල යෙදෙන ආයතන එනම්, " ලියාපදිංචි මූල්‍ය ආයතන " සඳහා නියාමකාත්මක අවශ්‍යතා ඇති කිරීමද සංශෝධන මගින් සිදු කෙරේ.

### (ඇ) 1949 අංක 58 දරණ මුදල් නීති පනත සංශෝධනය කිරීම

සංශෝධනය කරනු ලබන මුදල් නීති පනත අරමුණු රාශියක් මත රඳා පවතී.

* මිල ස්ථාවරත්වය ප්‍රධාන අරමුණ වන පරිදි මහ බැංකුවේ අරමුණු රාශියක් ඉටු කර ගැනීමට යාමේදී වන ප්‍රතිපත්තිමය ගැටුම් වලක්වාලීම.
* මුදල් සැපයුම යන්නෙහි අර්ථ දැක්වීම " පුළුල් මුදල් " වශයෙන් වෙනස් කිරීම.
* ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් සඳහා වන උපරිම සහ අවම සීමාවන් ඉවත් කිරීම.
* අවශ්‍ය සංචිතයන් ගණනය කිරීම සඳහා වන පදනම තීරණය කිරීම පිණිස මුදල් මණ්ඩලයට වැඩි නම්‍යතාවයක් ලබා දීම.
* සංචිත මත පොලියක් ගෙවීම
* තැන්පතු වගකීම් හැර අනෙකුත් මූල්‍ය වගකීම් මත සංචිත අවශ්‍යතා නියම කිරීමට හැකියාවක් ලබා දීම.

## ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය සඳහා වූ බදු සහනබල

ශ්‍රී ලංකාවේ කොටස් හා ණය වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ මූල්‍ය උපකරණ වර්ධනය කිරීම සඳහා පසුගිය වර්ෂ කීපය තුළදී බදු සහනබල රාශියක් අනුමත කොට තිබේ.

මූල්‍ය උපකරණ විවිධාංගීකරණය දිරිමත් කිරීමේ නවතම මූල්‍ය ක්‍රම සම්පාදනය කිරීමට හිතකර වාතාවරණයක් ඇති කිරීමේ අරමුණු ඇතිව, උකස් කර හා වත්කම් මගින් ආරක්ෂිත සුරැකුම් මත පැනවූ මුද්දර බද්ද 2000 වසරේදී ඉවත් කරන ලදී.

## ශ්‍රී ලංකා රජය සහ රජය සතු වාණිජ බැංකු අතර ඇති කර ගන්නා ලද ගිවිසුම්

1993 ජූලි මස 16 වැනි දින අත්සන් කරන්නට යෙදුණු රජය සහ ලංකා බැංකුවත්, මහජන බැංකුවත් අතර

ශිල්පීන්ගේ සහය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව ඒවායෙහි ක්‍රියාකාරීත්වය සොයා බලනු ඇත. මෙම ශිල්පීන්ගේ ප්‍රධාන අරමුණ වූයේ අදාළ බැංකුවල කාර්යයන් වාණිජ පදනමක් මත ගෙන යාම හා එම කාර්යයන් තවදුරටත් ශක්තිමත් කර ගැනීම, ඵලදායීතාවය ඉහළ නැංවීම, පිරිවැය අඩු කිරීම, සේවක මට්ටම් හා ශාඛා පද්ධතිය විධිමත් කිරීම, වත්කම් සංරක්ෂණය කිරීම සහ අවදානම් මනා ලෙස කළමනාකරණය කිරීම යනාදී ක්‍රියා මාර්ග තුළින් බැංකුවල ලාභදායිකත්වය, කාර්යක්ෂමතාවය හා මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීමයි.

මෙම අරමුණු වලින් කළමනාකාරීත්වයට පරිපාලනමය ස්වාධීනත්වය ලබා දීම හා වාර්ෂික ප්‍රමාණාත්මක කාර්ය සාධන ඉලක්කයක් නියම කිරීම තුළින් බැංකුවල අභ්‍යන්තර පරිපාලනයත්, මූල්‍ය තත්ත්වය වර්ධනය කිරීමත් අපේක්ෂා කෙරේ.

ලාභදායිකත්වය ඉලක්ක කොට ගත් ප්‍රාග්ධනය මත ඉපැයීම හා වත්කම් මත ඉපැයීමද, කාර්යක්ෂමතාවය සහ මූල්‍ය ස්ථාවරත්වයට අදාළ අක්‍රීය ණය මට්ටම් හා ණය ආපසු අය කර ගැනීමද මෙම ඉලක්කවලට ඇතුළත් වේ.

මෙම අරමුණු උදෙසා ඇති කර ගන්නා ලද ශිල්පීන් මගින් බැංකුවල ක්‍රියාකාරීත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කෙරේ.

## තාක්ෂණික ආධාර ව්‍යාපෘතීන්

පහත සඳහන් තාක්ෂණික ආධාර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය වෙළඳපොළ දෙපාර්තමේන්තුව විවිධ ආයතන සමග සම්බන්ධීකරණය වී කටයුතු කරනු ලැබිණ.

### (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් ක්‍රමය හා රජයේ ණය සුරැකුම්පත් වෙළඳපොළ ස්වයංක්‍රියකරණය

වර්ෂය තුළදී පත්‍ර රහිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ අභ්‍යන්තර තැන්පතු ක්‍රමය වර්ධනය කිරීමට පියවර ගන්නා ලදී. ලෝක බැංකු තාක්ෂණික ආධාර වැඩ සටහන යටතේ යෝජනා කරන ලද " තත්කාලීන දළ නිෂ්කාශණ ක්‍රමය " පිළිබඳ මූලික වැඩ කටයුතු ක්‍රියාත්මක කොට 2001 වසරේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

### (ආ) ප්‍රාථමික වෙළඳුන් අධීක්ෂණය කිරීම

ප්‍රාථමික වෙළඳුන් අධීක්ෂණය කිරීම සඳහා නව නීති රාමුවක් මහ බැංකුව විසින් පිළියෙල කර ඇත. වර්ෂය තුළදී ලෝක බැංකුවෙන් ලද තාක්ෂණික ආධාර උපයෝගී කර ගනිමින් ප්‍රාථමික වෙළඳුන් අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ අත් පොත් හා විස්තර සකස් කිරීම සහ සේවක මණ්ඩල පුහුණු කිරීමද සිදු කරන ලදී. ස්ථානීය පරීක්ෂණ සහ ස්ථානීය නොවන අධීක්ෂණ කටයුතුද වර්ෂය තුළදී ආරම්භ කරන ලදී.

### (ඇ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ හැකියාවන් උසස් කිරීම

දෙපාර්තමේන්තුවේ ස්ථානීය හා ස්ථානීය නොවන අධීක්ෂණ හැකියාව වැඩි දියුණු කිරීමෙන් අවදානම් මත පදනම් වූ බැංකු අධීක්ෂණය සහ පරිගණකගත විගණන වාර්තා පිළිබඳ සොයා බැලීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. මේ සඳහා සීඩා (SIDA) තාක්ෂණික ආධාර යටතේ දෙවන අදියර දැන් ක්‍රියාත්මක වී ඇත.

### (ඈ) විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා සහාය වීම පිණිස උපදේශකවරුන් යොදවා ගැනීමට තාක්ෂණික ආධාර ලබාගෙන ඇත. මෙම ආධාර යටතේ :

* රක්ෂණ කර්මාන්තය සහ පුද්ගලික විශ්‍රාම නඩත්තු අරමුදල් සඳහා නියාමක අධිකාරියක් පිහිටුවීම සහ
* විශ්‍රාමික හා අර්ථසාධක අරමුදල් ක්‍රමය දියුණු කිරීම සඳහා පරිපූර්ණ වූත්, නොකඩවා පවත්වාගෙන යා හැකි වූත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් දියුණු කිරීම සඳහා යෝජනා සකස් කිරීමටද කටයුතු සලසා ඇත.

## පර්යේෂණ කටයුතු

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටද, රජයේ ආර්ථික උපදේශක වශයෙන් මහබැංකුවේ කාර්යභාරය ඉටුකිරීමටද අධිපතිතුමා සහ මුදල් මණ්ඩලයට සහාය විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආර්ථිකයට අදාළව මෙන්ම ලෝක ආර්ථිකයෙහි මෑතකාලීන උපනතීන් සහ වර්ධනයන් පිළිබඳවද දත්ත සහ අනෙකුත් තොරතුරු රැස් කර විශ්ලේෂණය කළ අතර අදාළ විෂයයන් පිළිබඳව තවදුරටත් පර්යේෂණ කටයුතු කරගෙන යනු ලැබිණ. මෙමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානතම වගකීමක් වූ මහජනතාවට ආර්ථික තොරතුරු සැපයීමේ කාර්ය භාරය පුළුල් වූ අතරම වැඩිදියුණුද විය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය කටයුතු පිළිබඳ 'G 24' නම් අන්තර් රාජ්‍ය කණ්ඩායම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවයන් සම්බන්ධීකරණය කිරීමෙහිලා නිරත වූ අතර ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් බහු පාර්ශවීක සහ ද්විපාර්ශික වශයෙන් ආධාර සපයන්නන් සමග මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධීකරණය කිරීමටද සහාය විය. තවද, ඇතැම් ජාත්‍යන්තර සම්බන්ධතා කටයුතු පවත්වා ගැනීමේදී අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළෙඳ කටයුතු හා වාණිජ්‍ය අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයන්ට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමේ කටයුතුවලද නිරත විය. මීට අමතරව, මුදල් අමාත්‍යාංශය විසින් මෙන්ම බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු විසින්ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

වෙත යොමු කරන ලද විවිධ කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තිමය උපදේශ/නිරීක්ෂණ ලබාදීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි.

පශ්චාත් උපාධි හැදෑරීමට අපේක්ෂිත බැංකු නිලධාරීන් පුහුණු කිරීම මෙන්ම ඔවුන්ගේ පර්යේෂණ සඳහා මග පෙන්වීමටද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවාව සපයනු ලැබිණි. තවද, බැංකු අධ්‍යයන කේන්ද්‍රය සහ දේශීය සහ විදේශීය සංවිධාන විසින් පැවැත්වූ පුහුණු වැඩසිළිවෙලවල් යටතේ දේශන පැවැත්වීමට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්පත්දායක නිලධාරීන් වශයෙන් සහාය ලබාදෙන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සතිපතා සහ මාසිකව ආර්ථික දත්ත එක්රැස් කිරීම අඛණ්ඩව සිදු කළ අතර, මෙම තොරතුරු කඩිනමින් අන්තර් ජාලය සහ අනෙකුත් මාධ්‍ය තුළින් මහජනතාව වෙත බෙදා හරින ලදී. වාණිජ බැංකු අතර විවිධ කාල පරිණතීන් සඳහා වූ රුපියල් ගණුදෙනු වෙනුවෙන් ඇති වේ යයි අනුමාන කළහැකි පොලී අනුපාතික සඳහා සංඥාවන් ලබාදීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිය (SLIBOR) ගණනය කරනු ලබයි. මීට පෙරදී පැවති එක් දින, සත් දින සහ මාසික අර්පන අනුපාතිකයන්ට අමතරව ත්‍රෛමාසික, සය මාසික හා වාර්ෂික අර්පණ අනුපාතිකයන්ද ඇතුළත් වන සේ අන්තර් බැංකු අර්පන අනුපාතිකයේ ආවරණය පුළුල් කරනු ලැබින. 2000 වසරේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් පවත්වාගෙන යන පොදු දත්ත බෙදාහැරීමේ ක්‍රමයෙහි (General Data Dissemination system) සාමාජිකත්වය ලබා ගන්නා ලදී. දෙපාර්තමේන්තුව මෙම ක්‍රමයට දායක වීම පිණිස දත්තයන්ගේ ගුණාත්මක භාවය පිළිබිඹු කරන තොරතුරු පිළියෙල කිරීමේ ලා නිරත විය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මහ බැංකුවේ 1999 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේලා දායක වූ අතර අනිකුත් දෙපාර්තමේන්තුවලද සහභාගිත්වය ඇතිව වාර්ෂික වාර්තාවේ කටයුතු සම්බන්ධීකරණය කළේය. මීට අමතරව, රජයේ අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී ප්‍රයෝජනයට ගනු ලබන, මූල්‍ය නීති පනතේ 116 ඡේදය ප්‍රකාර සකස් කරනු ලබන වාර්තාවක් වූ " සැප්තැම්බර් 15 වාර්තාව" පිළියෙල කර ගරු මුදල් ඇමතිතුමිය වෙත ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, දෙපාර්තමේන්තුව විසින් 2000 දී " ශ්‍රී ලංකා ආර්ථිකය - 1999 සහ මැදිකාලීන අපේක්ෂා " සහ " ශ්‍රී ලංකා ආර්ථිකය -2000" යන වාර්තා ප්‍රකාශයට පත් කරනු ලැබිය. තවද, දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනත යටතේ නියම කර ඇති පරිදි විශේෂ ප්‍රතිපත්තිමය වාර්තා කීපයක්ද පිළියෙල කරනු ලැබිණ.

ප්‍රධාන කර්මාන්තශාලා 100 කින් යුත් නියැදි සමීක්ෂණයක් මත ගණනය කරනු ලබන ' පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදනය පිළිබඳ මාසික දර්ශකය ' නොකඩවා ප්‍රකාශයට පත් කෙරිණ. පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන පිළිබඳ සවිස්තරාත්මක අර්ධ වාර්ෂික සහ වාර්ෂික සමීක්ෂණයන්ද නොකඩවා සිදු කරන ලදී. මහ කොළඹ නිවාස අනුමත කිරීම් කාර්තුමය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම 2000 වසරේදී ඇරඹුණි. සමස්ත රාජ්‍ය අංශයෙහි අයවැය කටයුතුවලදී පලාත් පාලන අධිකාරයන්ගේ දයකත්වය විග්‍රහ කිරීමේ අරමුණින් යුතුව පලාත් පාලන අයවැය කටයුතු හා අදළව විශේෂ සමීක්ෂණයක්ද දියත් කෙරිණ.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පර්යේෂණ අධ්‍යයන ගණනාවක් කරගෙන යනු ලැබිණ. ප්‍රතිපත්තිමය කරුණු මත පදනම් වූ පර්යේෂණ අධ්‍යයන මෙන්ම සාර්ව සහ සූක්ෂම ආර්ථික ගැටළු පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ පර්යේෂණද වසර තුළදී දියත් කරනු ලැබිණි. මින් සමහරක් මහ බැංකුවේ මාණ්ඩලික පත්‍රිකා ප්‍රකාශනයන්හි පළ කෙරිණි.

ශ්‍රී ලංකා රජය හා ආධාර දෙන රටවල් අතර ඇති කර ගැනීමට අපේක්ෂිත විවිධ විදේශ ණය ගිවිසුම්වල මූල්‍යමය ප්‍රතිවිපාක සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කරන ලදුව මුදල් මණ්ඩලය වෙත මුදල් මණ්ඩල පත්‍රිකා ගණනාවක් ඉදිරිපත් කරන ලැබින.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ඇතැම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, බැංකුව ඇතුළත සහ බැංකුවෙන් පිටත වැදගත් කමිටු ගණනාවක සේවය කළහ. මෙම කමිටු අතර, සේවා වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුම සඳහා වන අන්තර් අමාත්‍යාංශ උප කමිටුව, නිෂ්පාදන ප්‍රතිප්‍රනාතන (Anti-dumping) සහ ප්‍රතිතෝලන (Countervaling ) ගාස්තු පිළිබඳ වන උප කමිටුව, කාර්මීකරණය සහ ආයෝජන ප්‍රවර්ධන ප්‍රමුඛ සැලැසුම් කමිටුව, ගෙවුම් ශේෂ පිළිබඳ කමිටුව, විනිමය අනුපාතික කමිටුව. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ටෙන්ඩර් කමිටුව, ද්‍රවශීලතා ඇස්තමේන්තු කිරීමේ කමිටුව, විවට වෙළඳපොළ කටයුතු පිළිබඳ කමිටුව සහ දේශීය ණය කළමනාකරණය පිළිබඳ වූ කමිටුව ද විය. වර්තමාන බදු ක්‍රමය සහ රජයේ මැදිකාලීන බදු ක්‍රමෝපාය සඳහා වූ යෝජනාවන් විමසුමට ලක් කෙරෙන මුදල් අමාත්‍යාංශයේ බදු ක්‍රමය පිළිබඳ වූ ප්‍රධාන කමිටුවෙහි මහ බැංකුව නියෝජනය කරන ලද්දේ දෙපාර්තමේන්තු නිලධාරීන් විසිනි.

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඵලදායී ලෙස උපයෝගී කර ගත හැකි සාර්ව ආර්ථික මාදිලියක් ආරම්භ කිරීම පිණිස දෙපාර්තමේන්තුව ස්වීඩනයේ 'රික්ස් බැංකුව ' වෙතින් උපදෙස් ලබා ගත්තේය.

වසර 2000 තුළදී 23 වැනි සියැන්සා මහ බැංකු පුහුණු පාඨමාලාවද, සියැන්සා අධිපති වරුන්ගේ සමුළුවද මහ බැංකුවේ අනුග්‍රහයෙන් පැවැත්විනි. ගිණිකොනදිග ආසියානු රටවලද, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාවෙහිද මධ්‍යම බැංකු එක් වීමෙන් සැදුම් ලත් සියැන්සා සංවිධානය 1950 ගණන්වල ස්ථාපනය කෙරුණ අතර එය කලාපයේ පැරණිතම සංවිධාන වලින් එකකි. වර්තමානයේදී, සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාජිකයන් 20 දෙනෙකුගෙන් මෙම සංවිධානය සමන්විත වේ. ශ්‍රී ලංකාව මෙහි ආරම්භක සාමාජිකයෙකි. සියැන්සා සංවිධානය 1957 සිටම අවුරුදු දෙකකට වරක් මහ බැංකු පුහුණු පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි. 1968 දී මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවෙහි පවත්වනු ලැබින. වසර 2000 දී මෙම පාඨමාලාවට රටවල් 18 කින් සාමාජිකයන් 19 දෙනෙකු

(13 දෙනෙකු සියැන්සා සාමාජික රට වලින් සහ 5 දෙනෙකු සියැන්සා සාමාජික නොවන රට වලින්) සහභාගී විය.

සාමාන්‍යයෙන් මහ බැංකු පුහුණු පාඨමාලාව අවසානයේදී පවත්වන සමුළුවකදී සියැන්සා රටවල බැංකු අධිපතීන් හමු වේ. 2000 අගෝස්තු මස පැවැත්වූ මෙම සමුළුව, ශ්‍රී ලංකා මහ බැංකු ස්වර්ණ ජයන්ති සංවත්සරයෙහි එක් කොටසක් විය. මෙම සමුළුවෙහි තේමාව වූයේ " මහ බැංකු ස්වාධීනත්වය" යි. මෙහි ප්‍රධාන කථිකයා වූයේ එංගලන්ත බැංකුවේ අධිපති ශ්‍රීමත් එඩ්වඩ් ජෝර්ජ් මැතිතුමාය. සියැන්සා සාමාජික මහ බැංකු හා මූල්‍ය අධිකාරීන් 15 ක නියෝජිත පිරිස් මෙම සමුළුවට සහභාගී විය. මෙම සමුළුවෙහි විශේෂ ආරාධිත අමුත්තා වූයේ ලෝකයේ පැරණිතම මහ බැංකුව වූ ස්වීඩනයේ රික්ස් බැංකුවේ නියෝජ්‍ය අධිපති තුමාය.

මෙම දෙපාර්තමේන්තුව තුළ පිහිටුවන ලද දකුණු ආසියානු කලාපීය සහයෝගිතා ඒකකය මගින් එම සංවිධානයේ සාමාජික රටවල මහ බැංකු අධිපතිවරුන්ගේ හා මුදල් ලේකම් වරුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබිණි.

## සංඛ්‍යාන සහ ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව (සං.දෙ.) විසින් (අ) ජාතික ගිණුම්, මිල සහ වැටුප් ශ්‍රම බලකාය, රැකියා වියුක්තිය ඇතුළු සාර්ව ආර්ථික හා සමාජ දත්ත සහ (ආ) කුටුම්භ හා ආයතනික අංශ පිළිබඳ මූලික දත්ත එක් රැස් කිරීම හා ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ කටයුතු සුපුරුදු ලෙස මෙම වසරෙහිද නොකඩවා කරගෙන යන ලදී.

සං.දෙ. ජාතික ගිණුම් ඇස්තමේන්තු ගණනය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම කාර්තුමය හා වාර්ෂිකමය වශයෙන් නොකඩවා සිදු කෙරුණි. ආර්ථික ක්‍රියාවලියේදී සංඛ්‍යාත්මක වශයෙන් දුර්වල ක්ෂේත්‍රයන් හඳුනාගෙන, එකී අදළ තොරතුරුවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම මගින් ජාතික ගිණුම් ගණනය කිරීමට 2000 වසර තුළදී අවධානය යොමු කෙරිණි. වෙළඳපොළ මිල සහ මිල වෙනස් වීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී ප්‍රමුඛ ගණයේ වෙළඳ මධ්‍යස්ථානවල ආහාර ද්‍රව්‍යවල තොග සහ සිල්ලර මිල ගණන් එක්රැස් කිරීම සං.දෙ. නොකඩවා කරගෙන යනු ලැබේ. සමහර වෙළඳ සැල්වල සතියකට වරක් ලබා ගත් සිල්ලර මිල ගණන් දෛනික පදනම මත ලබා ගැනීම සිදු කරන ලදී. භාණ්ඩ මිල ගණන් පුවත්පත් හා විද්‍යුත් මාධ්‍යවලට හා අදළ ආයතනනවලට නිකුත් කිරීම, දෛනිකව සතිපතා හා මාසික පදනමකින් නොකඩවා සිදු කරනු ලැබීය. ඒ සමගම මිල පිළිබඳ වෙළඳපොළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීමද ව්‍යාප්ත කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් 2000 වසර අවසාන භාගයේදී ගෘහස්ත සමීක්ෂණ ගණයට අයත් පරීක්ෂණාත්මක සමීක්ෂණ දෙකක් පවත්වන ලදී. අතිරේක කෘෂි බෝග හා සත්ව පාලනය පිළිබඳ නිෂ්පාදන තොරතුරු ලබා ගැනීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදු කරන ලද සමීක්ෂණය ඉන් පළමුවැන්න වූ අතර අනෙක කොළඹ දිස්ත්‍රික්කය තුළ පැවැත්වූ කුඩා ව්‍යාපාර කටයුතු පිළිබඳ සමීක්ෂණය විය. මෙම සමීක්ෂණ දෙකම සිදු කරන ලද්දේ ඉහත සඳහන් කළ අංශයන්හි නිෂ්පාදන ඇස්තමේන්තුවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම තුළින් පවත්නා ජාතික ගිණුම් තොරතුරු පද්ධතිය වඩාත් ශක්තිමත් කර ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙනය.

තවද, 2001/02 වසරේදී පවත්වනු ලබන අට වැනි පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයේ මූලික සැළසුම් කටයුතුද 2000 වසරේදී සිදු කරනු ලැබීය. හත් වන පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයේ සූක්ෂම දත්තයන් පර්යේෂණාත්මක කටයුතු සඳහාම පමණක් භාවිතා කරන අයට නිකුත් කිරීමටද කටයුතු කරන ලදී.

### සමීක්ෂණ

#### අනුරාධපුර දිස්ත්‍රික්කයේ අතිරේක ආහාර බෝග හා සත්ව පාලනය පිළිබඳ සමීක්ෂණය - 2000 යල

ජාතික ගිණුම් ගණනය කිරීමේදී යොදා ගනු ලබන දත්ත පදනම වඩාත් ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද මුල්ම පරීක්ෂණාත්මක සමීක්ෂණය වූයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2000 යල කන්නයට අදළව පවත්වන ලද අතිරේක ආහාර බෝග හා සත්ව පාලනය පිළිබඳ සමීක්ෂණයයි. ආහාර බෝග හා සත්ව පාලනය පිළිබඳ ජාතික මට්ටමේ නිල තොරතුරු සපයන මූලය වූ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තොරතුරු වැඩි දියුණු කිරීමද මෙම සමීක්ෂණයේ දෙවන අරමුණ විය. ඉහත අරමුණු දෙක කෙරේ කඩිනම් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් එම සමීක්ෂණය පරීක්ෂණාත්මක පදනමකින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිදු කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවට පවරනු ලැබීය.

සමීක්ෂණයට භාජනය වූ තොරතුරු සමන්විත වූයේ අතිරේක ආහාර බෝග නිෂ්පාදන ධාරිතාව, වටිනාකම හා වගා කරන ලද බිම් ප්‍රමාණයද සහ සත්ව පාලනයට හා සත්ව නිෂ්පාදනවලට අදළ ගෘහස්ත මට්ටමින් ලබා ගන්නා ලද තොරතුරුය. සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2000 ඔක්තෝබර් සිට නොවැම්බර් අවසානය දක්වා කාලය තුළදී නිම කරන ලදී. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් තෝරා ගන්නා ලද එම දිස්ත්‍රික්කයේ රැකියා විරහිත උපාධිධාරීන් මගින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මුළු සමීක්ෂණයේම දත්ත පිරිසුම් සහ දත්ත සංස්කරණ කාර්යයන් 2000 දෙසැම්බර් මස අවසානයේදී නිම වූ අතර 2001 මුලදී සමීක්ෂණ වාර්තාව ප්‍රකාශ කිරීමට නියමිතය.

#### සුළු ව්‍යාපාර නියමු සමීක්ෂණය

දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙවන පරීක්ෂණාත්මක සමීක්ෂණය මෙයයි. මෙම සමීක්ෂණය

පැවැත්වීමේ අරමුණ වූයේ ජාතික ගිණුම් ඇස්තමේන්තු සැකසීමේදී මෙම අංශයට අදාළ දත්ත තොරතුරු පදනම වඩාත් ශක්තිමත් කිරීමයි. පිළිගත් වාර්තා කිරීමේ ක්‍රමෝපායන් වර්ධනය කිරීමේ අරමුණ ඇතිව එමගින් නිරතුරුව සැපයෙන තොරතුරු ඉවහල් කරගෙන ජාතික ආර්ථිකයට මෙම අංශයෙන් ලැබෙන දායකත්වය හඳුනා ගැනීම මෙම සමීක්ෂණය පැවැත්වීමට හේතු සාධක විය. සුළු ව්‍යාපාර අංශයට ප්‍රධාන වශයෙන් අයත් වන්නේ ව්‍යාපාර ආයතන වලින් සපයනු ලබන ගෘහස්ත සේවාවන්, සමාජයීය, පුද්ගලික හෝටල්, ආපනශාලා සහ සුළු පරිමාණ නිෂ්පාදන ඒකකයන්ය.

සුළු ව්‍යාපාර නියමු සමීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගත් ග්‍රාම නිලධාරී වසමක පරීක්ෂණාත්මක පදනමකින් සිදු කරන ලදී. තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සුළු ව්‍යාපාර අංශ හඳුනා ගැනීම (ලේඛනගත කිරීම) නියමු සමීක්ෂණයට පෙරාතුව සිදු කරන ලදී. දත්ත රැස් කිරීම සිදු කරනු ලැබුවේ බාහිරව ලබා ගත් ඒ සඳහා දෙපාර්තමේන්තුව විශේෂයෙන් පුහුණු කළ අධීක්ෂණ ගුරුවරුන් හා ශිෂ්‍ය කණ්ඩායමක් විසින්ය. දෙපාර්තමේන්තුව විසින් සමීක්ෂණයේ මූලික දත්ත සැකසීමේ කටයුතු 2000 වසරේදී අවසන් කරන ලදී. එකතු කරන ලද දත්තවල ගුණාත්මක භාවය හා විශ්වසනීයත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව ඉදිරි අනාගතයේදී මෙවැනි ගණයේ සමීක්ෂණ සඳහා ගුරුවරුන් හා සිසුන් යොදවා ගැනීම තුළින් තොරතුරු ලබා ගැනීමේ ශක්‍යතාවයන් විමසුමට භාජනය කෙරේ.

## දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1978 දී ආරම්භ කරන ලද දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ 2000 දී එහි ක්‍රියාකාරිත්වයෙහි විසි දෙවන වසර සම්පූර්ණ කරන ලදී. මෙම වැඩපිළිවෙළ යටතේ, පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන් පිළිබඳ තොරතුරු, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල ගණන් සහ අසංවිධිත අංශයේ වැටුප් පිළිබඳ දත්ත එක් රැස් කිරීම නොකඩවා සිදු කෙරිණි. පාරිභෝගික භාණ්ඩයන්ගේ පරිපාලිත මිල ගණන්වල වෙනස්වීම් තුළින් ඇති වන බලපෑම මැන බැලීම සහ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල කෘෂිකර්මාන්තයේ දායකත්වය මැන බැලීම සඳහාද මෙම වැඩපිළිවෙළ යොදා ගැණුනි. වී, තේ, රබර් සහ පොල් වගා උප අංශයන් සහ සුළු පරිමාණ ඉදි කිරීම් කටයුතුද මෙම වැඩපිළිවෙලෙන් ආවරණය වේ. සමස්ත දිවයින නියෝජනය වන පරිදි තෝරා ගත් පාසල් ගුරු භවතුන් විසින් මෙම දත්ත රැස් කිරීමේදී සංඛ්‍යාන විමර්ශකයින් ලෙස ක්‍රියා කරනු ලබයි. මෙසේ රැස් කරන තොරතුරු මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය වලින් ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු වේ. ප්‍රාදේශීය මිල දර්ශක ගණනය කිරීම වැනි සුවිශේෂ කටයුතු සඳහා මෙම දත්ත භාවිතා කරන නිසා දත්තවල ගුණාත්මක භාවය වර්ධනය කිරීමේ අදහසින් විමර්ශකයින් පුහුණු කිරීම සඳහා 2000 දී කොළඹ, මහනුවර සහ අනුරාධපුරයේදී සම්මන්ත්‍රණ පවත්වන ලදී.

පිටකොටුව තොග වෙළඳපොළ සහ මරදගහමුල සහල් වෙළඳපොළ වැනි අනෙකුත් නිෂ්පාදන මධ්‍යස්ථාන වලින් සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙහි ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්හි සිල්ලර මිල සහ තොග මිල ගණන් දිනපතා එක් රැස් කිරීම දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යයි. ගොවියන්, වෙළඳුන් සහ පාරිභෝගිකයන්ට තොරතුරු බෙදා හැරීමේ අරමුණින් යුතුව මෙම තොරතුරු පුවත්පත් සහ විද්‍යුත් මාධ්‍ය මගින් දිනපතා ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම තොරතුරු රජය සහ පෞද්ගලික අංශයේ ආයතනද පර්යේෂණ හා ආර්ථික කටයුතු තීරණය කිරීමේ අරමුණින්ද විශේෂයෙන් ඉදිරි වෙළඳපොළ ගිවිසුම් කටයුතු සඳහාද භාවිතා කෙරේ.

## පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම

### පාරිභෝගික මිල දර්ශක

පාරිභෝගික මිල දර්ශක ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට (කො.පා.මි.ද.) අතිරේක වශයෙන් දෙපාර්තමේන්තුව විසින් 1998 හඳුන්වා දුන් කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය (කො.දි.පා.මි.ද.) ගණනය කිරීම තවදුරටත් සිදු කෙරේ. මෙම දර්ශකය සඳහා භාවිතා කරන ලද ඉලක්කගත ජනගහණය, ආදායම අනුව පෙළ ගස්වන ලද කොළඹ දිස්ත්‍රික්කයෙහි කුටුම්භවල පහළම සියයට 40 න් සමන්විත වේ. එය කො.පා.මි.ද.ට වඩා ශීර්ෂ ගණනාවකින් හා භූගෝලීය වශයෙන් පුළුල් ආවරණයකින් යුක්තය. දර්ශකය ගණනය කිරීම සඳහා වූ තොරතුරු කොළඹ දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 11 කින් ලබා ගනු ලැබේ. ඒවා නම් දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ ඇති කරනු ලැබූ මධ්‍යස්ථාන පහක් වන පිටකොටුව, හංවැල්ල, හෝමාගම, මොරටුව සහ අවිස්සාවේල්ල සහ 1999 ජනවාරි සිට අළුතෙන් හඳුන්වා දෙනු ලැබූ කොලොන්නාව, නුගේගොඩ, දෙහිවල, පිළියන්දල, මහරගම හා පාදුක්ක යන මධ්‍යස්ථානයි. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පත් කරනු ලැබ ඇති දත්ත විමර්ශන ගුරු භවතුන් විසින් මෙම මධ්‍යස්ථාන වලින් තොරතුරු එකතු කර ගැනේ.

දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණාත්මක පදනමකින් අනුරාධපුර, මාතර හා මාතලේ දිස්ත්‍රික්ක සඳහාද ප්‍රාදේශීය පාරිභෝගික මිල දර්ශක තුනක් ගණනය කරනු ලැබේ. මහ බැංකුව විසින් 1996/97 පවත්වන ලද පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණයෙන් අදාළ දිස්ත්‍රික්ක සඳහා ලබා ගන්නා ලද වියදම් රටාවන්, දර්ශකවලට භාණ්ඩ බර තැබීම සඳහා පදනම් කර ගන්නා ලදී. දර්ශකවල බර තැබීම් සකස් කිරීමට යොදා ගනු ලැබූ ඉලක්ක ජනගහණය ආදායම් අනුව පෙළ ගස්වන ලද දිස්ත්‍රික්කයේ කුටුම්භවල පහළම ආදායම් ලබන සියයට 40 න් සමන්විත විය. මෙම දර්ශක ප්‍රාදේශීය මිල වෙනස්කම් විග්‍රහ කිරීමට ප්‍රයෝජනවත් වේ. තවද ප්‍රාදේශීය මිල වෙනස්වීම් අදාළ වෙළඳපොළ පාර්ශවයන් විසින් කෘෂිකාර්මික භාණ්ඩවල ඉදිරි වෙළඳ ගිවිසුම්වලට පිවිසීමේදී ප්‍රයෝජනයට ගනු ලැබේ.

තවද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අත්හදා බැලීමේ පදනම මත බස්නාහිර පළාත සඳහා කො.දි.පා.මි.දර්ශකයට වඩා පුළුල් නියෝජනයක් සහිත අළුත් දර්ශකයක් ගණනය

කිරීමේ නියුතුව සිටී. මෙය කො.දි.පා.මි. දර්ශකයට වඩා භූගෝලීමය වශයෙන් සහ ආදයම් කාණ්ඩයන් අනුව වඩාත් පුළුල් ආවරණයකින් යුක්තය. දර්ශකයේ ප්‍රධාන නවීනතම ලක්‍ෂණය වනුයේ ඉහළ ආදයම් ලබන ගෘහස්තයන් ආවරණය වීමයි. දර්ශකය මගින් බස්නාහිර පළාත තුළ 1996/97 වර්ෂවල පවත්වන ලද පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්‍ෂණයේ ආදයම් මට්ටම අනුව පෙළ ගස්වන ලැබූ පහළම සියයට 80 අයත් වන කුටුම්භ ආවරණය කෙරෙයි. දර්ශකයේ බර තැබුම් මෙලෙස නියෝජනය වූ ගෘහස්තයන්ගේ වියදම් රටාව මත පදනම් වේ. වෙනස් වන පාරිභෝගික රටාවන් හසු කර ගැනීම සඳහා කො.දි.පා. මිල දර්ශකයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානවලට අමතරව ඉහළ ආදයම් ලබන ගෘහස්තයන්ගේ පරිභෝජන රටාවන් හඳුනා ගැනීම සඳහාද නගරයේ තෝරා ගත් සුපිරි වෙළඳසැල්ද ඇතුළත් වන පරිදි දත්ත එකතු කිරීමේ මධ්‍යස්ථාන පුළුල් කර ඇත.

## තොග මිල දර්ශකය

ප්‍රාථමික වෙළඳපොළ මට්ටමේ මිල වෙනස්වීම් පිළිබිඹු කෙරෙන තොග වෙළඳ මිල දර්ශකය ගණනය කිරීම දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යනු ලබයි. මෙය සිල්ලර වෙළඳපළේ ඉදිරි මිල වෙනස්වීම් පෙන්නුම් කරන්නා වූ ප්‍රයෝජනවත් දර්ශකයක්ද වනු ඇත.

## ජාතික ගිණුම්

ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නියුක්ත විය. ප්‍රාථමික හා ද්වීතියික මට්ටමේ දත්තයන් එක් රැස් කිරීම හා ගිණුම්ගත කිරීම මෙයට ඇතුළත් වේ.

අසංවිධිත හා අළුතින් මතු වන ආර්ථික ක්‍රියාකාරකම් වඩාත් පුළුල් ලෙස ආවරණය වන පරිදි පොදුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාදමය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව 2000 දී වඩාත් උත්සුක විය. ඉහත සඳහන් කළ පරිදි දනට ඇති දත්ත පදනම ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අතිරේක ආහාර බෝග හා සත්ව පාලනය හා සුළු ව්‍යාපාර පිළිබඳව පරීක්‍ෂණාත්මක සමීක්‍ෂණ දෙකක් මෙහෙයවීය.

ජාතික ගිණුම් දත්තයන් පොදු මහජනතාවට වඩාත් දනුවත් කිරීම උදෙසා පුවත්පත් නිවේදන මාර්ගයෙන් සහ පුවත්පත් සාකච්ඡා මගින් ප්‍රචාරය කිරීමෙහි ලා දෙපාර්තමේන්තුව තවදුරටත් පියවර ගන්නා ලදී. දන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා මේ දත්ත ප්‍රචාරයට පත් කරනු ලැබේ. කාර්තුමය පදනමක් මත ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම තුළින් මහජනතාව තුළ ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු වීම දක්නට ලැබිණි.

## පළාත් ජාතික ගිණුම්

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1996 සිට 1998 දක්වා පළාත්බද දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) ගණනය කිරීම පරීක්‍ෂණාත්මක පදනමකින් සිදු කරන ලදී. එම ඇස්තමේන්තු පවත්නා සාධක මිල ගණන් අනුව ගණනය කරන ලදී. මෙම මූලික ඇස්තමේන්තු මගින් පළාත්බද ආර්ථික ක්‍රියාවලියන්හි දත්ත පදනම් පිළිබඳ ඇස්තමේන්තු සපයන අතරම එමගින් ජාතික ආර්ථික සංවර්ධනය කෙරෙහි විවිධ පළාත් වලින් ලැබෙන දයකත්වය මැනිය හැකිය.

## රැකියා තොරතුරු

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, සංස්ථා සහ රාජ්‍ය මණ්ඩලවල සේවා නියුක්ති ප්‍රවනතා හඳුනා ගැනීමේ අරමුණින් වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්‍ෂණය 2000 වසරේදී පවත්වන ලදී.

## දෙපාර්තමේන්තු පරිගණක ජාල පද්ධතිය හා වෙබ් පිටුව නිර්මාණය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ඇති පරිගණක වලින් වැඩි ප්‍රමාණයක් බැංකුවේ සමස්ත පරිගණක ජාලයට (Net Work) සම්බන්ධ කිරීමට 2000 වසරේදී දෙපාර්තමේන්තුවට හැකි විය. එමගින් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහ පරිගණක ජාලය මගින් තොරතුරු ලබා ගැනීම, හුවමාරු කර ගැනීම, කාර්යක්‍ෂමව හා වේගවත්ව කර ගැනීමට හැකි විය. " ස්ටැනෙට් " (STANET) නමැති දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුව (Web Page) මගින් සංඛ්‍යා තොරතුරු හා පුවත්පත් නිවේදනවලට නිකුත් කරනු ලබන දත්තයන්ද, ඊට අමතරව දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයන් පිළිබඳ තොරතුරුද ශ්‍රී ලංකා මහ බැංකු තත් ප්‍රදේශ ජාලය (Local Area Net Work) මගින් අනෙකුත් දෙපාර්තමේන්තුවලට ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත.

## ප්‍රකාශන

### පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්‍ෂණය - 1996/97

1996/97 පවත්වන්නට යෙදුණු සත් වැනි පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්‍ෂණයට අදළ වාර්තාවේ දෙවන කොටස 2000 වසරේදී ප්‍රකාශයට පත් කරන ලදී. 1999 දී ප්‍රකාශයට පත් කරන ලද පළමු කොටසේ වාර්තාව මගින් දත්ත ගැඹුරු විශ්ලේෂණයට ලක් කරන ලද අතර වාර්තාවේ දෙවන කොටස විස්තරාත්මක සංඛ්‍යා සටහන් 514 කින් සමන්විත සංග්‍රහයකි. වාර්තාවේ සඳහන් සංඛ්‍යා තොරතුරු නියැදි දත්තයන් මිස මුළු ජනගහණය සඳහා ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යා නොවේ.

වාර්තාවේ දෙවන කොටස පරිච්ඡේද 6 කින් සමන්විතය. එනම්, (1) ජන විකාශ හා සමාජ ආර්ථික තොරතුරු (2) ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය (3) ආදයම (4) වියදම හා පරිභෝජනය (5)

ණය සහ ආයෝජන (6) පළාත්බද සංඛ්‍යා තොරතුරු වශයෙනි. මෙම ගෘහස්ත මට්ටමේ සූක්ෂම දත්තයන් විශේෂයෙන් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයන්හි තීරණ ගන්නා නිලධාරීන්ට ප්‍රතිපත්ති සම්පාදකයන් හා පර්යේෂණ නිලධාරීන්ට බොහෝ සේ උපකාරී වේ. මෙම වර්ෂය තුළදී සමීක්ෂණ තොරතුරු වඩාත් ප්‍රචලිත කිරීමේ අරමුණින් රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවල ඉල්ලීම පරිදි මෙම සමීක්ෂණයට අදාළව විශේෂයෙන් සකසන ලද සංඛ්‍යා සටහන් ඇතුළත් දත්ත දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. වාර්තාවේ දෙවන කොටසට අමතරව වාර්තාවේ පළමු කොටසේ තොරතුරු හා දෙවැනි කොටසේ ප්‍රකාශිත සංඛ්‍යාන වගු ඇතුළත් කරමින් සංගෘහිත තැටියක් (C.D.Rom) පිළියෙල කිරීමට කටයුතු දෙපාර්තමේන්තුව විසින් අරඹන ලදී.

## අනෙකුත් ප්‍රකාශන

වාර්ෂිකව නිකුත් කරනු ලබන ප්‍රකාශන දෙකක වැඩ කටයුතු මෙම කාලපරිච්ඡේදය තුළදී සිදු කරන ලදී. " ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත - 2000 xxiii වෙනි වෙළුම" 2000 ජුනි මස නිකුත් කරන ලද අතර " ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2000 xxii " වෙනි වෙළුම 2000 වසර අවසානයේදී නිම කෙරුණි.

සමාජ හා ආර්ථික, ජන විකාශ, ශ්‍රම බලකාය හා රැකී රක්ෂා, ජාතික ආදායම හා වියදම, කෘෂිකර්මය, කර්මාන්ත මූල්‍ය සහ විදේශ වෙළඳාම, මිල සහ වැටුප්, මූල්‍ය හා බැංකු, ප්‍රාග්ධන වෙළඳපොළ, රාජ්‍ය මූල්‍ය හා සමාජ ආර්ථික සේවාවන්වල කාල ශ්‍රේණි සහ හරස්කඩ දත්ත මෙම ප්‍රකාශන දෙක තුළින් ඉදිරිපත් කරයි. " ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2000 " ප්‍රකාශනයට පළාත්බද සංඛ්‍යා තොරතුරු වැඩි ආවරණයකින් යුතුව ඉදිරිපත් කිරීම තුළින් තොරතුරු බෙදා හැරීම පුළුල් කරන ලදී. තවද මීට අතිරේකව මෙම වර්ෂය තුළදී බැංකුවේ අනෙකුත් ප්‍රකාශනවලටද දෙපාර්තමේන්තුවේ දායකත්වය දෙන ලදී.

# සේවක අර්ථසාධක අරමුදල

මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු වශයෙන් 2000 වර්ෂය තුළදී ද සිය කටයුතු සාර්ථකව පවත්වාගෙන යන ලද අතර, මෙහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය සමග සමීප සබඳතාවයෙන් කටයුතු කරන ලදී. සේ.අ.අ. පනතේ ප්‍රකාර මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම වනුයේ දායක මුදල්, දඩ මුදල් හා ආයෝජන ආදායම් රැස් කිරීම, ලියාපදිංචිගත සේවා යෝජකයන්ගේ හා අරමුදලේ සාමාජිකයන්ගේ ගිණුම් නිසි ලෙස පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් වඩාත් ඵලදායී මාර්ගවල ආයෝජනය කිරීම හා අරමුදලේ සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවීම යන කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යාමයි.

ආයෝජන ක්‍රියාවලියේ හා සේ.අ.අ. අනෙකුත් මෙහෙයුම් ක්‍රියාවලින්ගේ නවීකරණ කටයුතු මෙම වර්ෂය පුරා තවදුරටත් ක්‍රියාත්මක විණි. මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව, ප්‍රතිලාභ ආපසු ගෙවීම, සාමාජික ගිණුම් ඒකාබද්ධ කිරීම හා නිවාස ණය අයදුම්පත් සැකසුම් කිරීම යන ක්‍රියාවලීන් තවදුරටත් පරිගණකගත කිරීම සඳහා වැඩසටහන් සම්පාදනය කරන ලදී. මේ තුළින් සේවා යෝජකයන් හා සාමාජිකයන් වෙනුවෙන් වඩාත් කාර්යක්ෂම හා විශ්වාසනීය සේවයක් සැපයීමට සේ.අ.අ. හැකියාව ලැබුණි.

## ආයෝජන ක්‍රියාවලිය විධිමත් කිරීම

ලෝක බැංකුවේ මූල්‍ය ආධාර මත සේ.අ.අ. විසින් සංවිධානය කරන ලද පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද අරමුදල් කළමණාකරුවන් 08 දෙනෙකු මෙම වර්ෂයේ අවසාන කාර්තුවේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ පත්වීම් ලදහ. මෙසේ අභ්‍යන්තරව, අරමුදල් කළමනාකරණ හැකියාවන් වර්ධනයක් තුළින් වෙළඳපොළ නැඹුරු ආයෝජන උපකරණ වෙත අරමුදලේ සමස්ථ ආයෝජන කලඹ විවිධාංගීකරණය කිරීමේ ක්‍රියාවලිය වඩාත් පහසු වී ඇත.

## ආයෝජන කටයුතු

වෙළඳපොළ පදනම් වූ ආයෝජන උපකරණ වෙත අරමුදලේ සමස්ථ ආයෝජන කලඹ විවිධාංගීකරණය කිරීම මෙම වර්ෂයේදී තවදුරටත් සිදු කරන ලදී. 1999 වර්ෂයේ අවසානයේදී සමස්ථ ආයෝජන කලඹෙන් 81% ක ප්‍රතිශතයක් වූ රජයේ රුපියල් ණය මත ආයෝජනයන් 2000 වර්ෂය අවසානයේදී 73% ක් විය. මෙම අඩු වීම සමනය වන සේ භාණ්ඩාගාර බැඳුම්කර මත ආයෝජනයන්හි වර්ධනයක් සිදු විය. 1999 දී භාණ්ඩාගාර බැඳුම්කර මත ආයෝජනයන්හී දායකත්වය සමස්ථ ආයෝජන කළඹෙන් 15% වූ අතර එය 2000 වර්ෂය අවසනට 22% ක් දක්වා වර්ධනය විය.

**II - 14 සංඛ්‍යා සටහන**
**1999 සහ 2000 වර්ෂවලදී**
**සේ.අ.අ. කොටස් වෙළඳපොළ ආයෝජනයන්ගේ සාඵල්‍යතාවය**

(රුපියල් දශලක්ෂ)

| අයිතමය | 1999 | 2000 |
|---|---|---|
| කොටස් වෙළෙඳපොළ ආයෝජන කළඹෙහි සාමාන්‍යය | 466 | 1,007 |
| මුළු ලාභාංශ ලැබීම් | 28 | 55 |
| මුළු ප්‍රාග්ධන ඉපයීම් | 15 | 25 |
| ප්‍රසාද කොටස් ලැබීම් (කාලච්ඡේදයේ අවසන් වටිනාකමට අගය කර) | 91 | 294 |
| මුළු ලාභාංශ, ප්‍රාග්ධන ඉපයීම් හා ප්‍රසාද කොටස් | 134 | 374 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

ආයෝජන විවිධාංගීකරණයේ එක්තරා අංශයක් ලෙස, සේ.අ.අ. විසින් කොටස් වෙළඳපොළ ආයෝජන කටයුතු තවදුරටත් පුළුල් කරන ලදී. මෙහිදී පසුගිය වර්ෂයට සාපේක්ෂව විමර්ශණයට ලක් කරනු ලබන වර්ෂය අවසනට කොටස් වෙළඳපොළ ආයෝජනයන්ගේ 115% ක වර්ධනයක්

පෙන්නුම් කරන ලදී. මෙම ආයෝජනයන් විසින් අරමුදලේ සමස්ථ ආයෝජන කලඹට සිදු කළ දයකත්වය පසුගිය වර්ෂයේ වූ 0.3% ප්‍රතිශතයට සාපේක්ෂව මෙම වර්ෂය අවසනදී 0.5% ක ප්‍රතිශතයක් ලෙස වාර්තා විය. විචක්ෂණ විශ්ලේෂණයන් මත පදනම් වී සිදු කෙරුණු මෙම ආයෝජනයන් හේතුවෙන්, දරිය හැකි අවදනම් මට්ටමකදී වඩාත් ඉහළ අපේක්ෂිත ප්‍රතිලාභයක් ලබා දෙන්නාවූ ව්‍යාපාර කොටස් ආයෝජන කලඹක් හිමි කර ගැනීමේ හැකියාව සේ.අ.අ. වෙත ලැබී ඇත. 2000 වර්ෂය තුළදී කොටස් වෙළඳපොළ ආයෝජනයන් වෙතින් ලද ඵලද අනුපාතය 37% ක ප්‍රතිශතයක් වැනි ඉහළ මට්ටමක පැවතුණි.

## ද්විතියික වෙළඳපොළ කටයුතු

2000 වර්ෂය තුළදී ද සේ.අ.අ. විසින් භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ද්විතීය වෙළඳපොළ කටයුතුවල ක්‍රියාකාරී ලෙස නිරත විය. මෙම ද්විතීය වෙළඳපොළ කටයුතු තුළින් ලද ප්‍රාග්ධන ඉපයීම් හේතුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් වෙතින් උපලබ්ධි කරගත හැකිව තිබූ ප්‍රතිලාභ අනුපාතය තවදුරටත් වැඩි කර ගැනීමේ හැකියාව අරමුදලට ලැබුණි. 15 සංඛ්‍යා සටහන මගින් විමර්ෂණයට ලක් කෙරෙන වර්ෂය තුළදී සිදු කෙරුණු අරමුදලේ ද්විතීය වෙළඳපොළ කටයුතු පිළිබඳ තොරතුරු දක්වෙයි.

**II - 15 සංඛ්‍යා සටහන**
**2000 වර්ෂය තුළදී සේ.අ.අ.ආයෝජනයන්හි ද්විතීය වෙළඳපොළ කටයුතු**

(රුපියල් දශලක්ෂ)

| අයිතමය | මිලදී ගැනීම් | විකිණීම් | ප්‍රාග්ධන ලාභ |
|---|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,459.0 | 4,090.0 | 103.8 |
| භාණ්ඩාගාර බිල්පත් | 95.7 | 380.0 | 0.8 |
| ව්‍යාපාර කොටස් | 755.6 | 133.4 | 25.2 |
| එකතුව | 2,310.3 | 4,603.4 | 129.8 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## විනිමය පාලන

2000 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුව (වි.පා.දෙ.) විසින් ප්‍රාග්ධන ගිණුම තවදුරටත් ලිහිල් කිරීම අරමුණු කර ගත් අඛණ්ඩ ක්‍රියාවලියට අනුරූප වන ආකාරයට ප්‍රතිපත්ති කිහිපයක්ම ගනු ලැබිණ. මේ සමගම විනිමය අක්‍රමිකතා හා විදේශ විනිමය අතිසි ලෙස යෙදවීම වැළැක්වීමේ අරමුණින් විදේශ විනිමය ගණුදෙනු මෙහෙයුම් වැඩපිළිවෙල ශක්තිමත් කරන ලදී. තවද විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම, භාණ්ඩ නැව්ගත කරන්නන් ලියාපදිංචි කිරීම, සංචාරක නියෝජිතයන්ට හා මුදල් මාරු කරන්නන්ට බලපත්‍ර ලබා දීම හා ඔවුන්ගේ බලපත්‍ර අළුත් කිරීම යන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

**II - 16 සංඛ්‍යා සටහන**
**සේ.අ.අ. වැදගත් වන තොරතුරු**

| අයිතමය | 1999 | 2000 |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | | |
| ක්‍රියාකාරී සාමාජිකයන් (නොකඩවා දයක මුදල් ගෙවූ) | 1,783,777 | 1,855,900 |
| ක්‍රියාකාරී නොවන සාමාජිකයන් (අදළ වර්ෂයේදී දයක මුදල් නොගෙවූ) | 6,325,168 | 6,520,500 |
| වාර්ෂික දයක මුදල් ලැබීම් (රුපියල් දශ ලක්ෂ) | 13,679 | 16,853 |
| ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රුපියල් දශ ලක්ෂ) | 7,691 | 10,802 |
| ප්‍රතිලාභ ගෙවූ සංඛ්‍යාව | 99,386 | 95,157 |
| අරමුදල සමස්ත ආයෝජන කලඹ පිරිවැයට (රුපියල් බිලියන) | 186 | 215 |
| අරමුදලේ සාමාන්‍ය ආදයම් අනුපාතය(%) | 13.12 | 12.95 |
| සාමාජිකයන්ගේ සමස්ත ශේෂය (රුපියල් බිලියන) | 194 | 223 |
| දළ ආයෝජන ආදයම් (රුපියල් දශලක්ෂ) | 22,847 | 26,313 |
| ආදයම් බදු වගකීම (රුපියල් දශ ලක්ෂ) | 2,271 | 2,616 |
| මුළු පරිපාලන වියදම් (රුපියල් දශ ලක්ෂ) | 186 | 259 |
| මුළු පරිපාලන වියදම් දළ ආයෝජන ආදයම්හි ප්‍රතිශතයක් ලෙස (%) | 0.8 | 0.8 |
| මුදහරින ලද නිවාස ණය ඉල්ලුම්පත් සංඛ්‍යාව | 12,339 | 14,648 |
| සාමාජිකයන්ගේ ගෙවීම් මත ගෙවූ නාමික පොලී අනුපාතය (%) | 11.50 | 11.50 |
| සාමාජිකයන්ගේ ශේෂ මත ගෙවූ සඵලදයී පොලී අනුපාතය (%) | 11.72 | 11.69 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

මේ වසර තුළදී ප්‍රාග්ධන ගිණුම හා සම්බන්ධ ගණුදෙනු ලිහිල් කිරීම සම්බන්ධයෙන් සිදුවූ ප්‍රධාන වෙනසක් වූයේ බැංකු, රක්ෂණ, කොටස් තැරැව්කාර සහ ඒකක භාර යන අංශවල අනේවාසිකයන්ට පනවා තිබූ සීමාවන් ඉහළ දැමීමයි.

මේ වසර තුළදී තවත් කැපී පෙනෙන වෙනසක් වූයේ, අනේවාසිකයන් විසින් පාලනය කරන සමාගම් සඳහා රුපියල් ණය ප්‍රදනය කිරීම හා සම්බන්ධව 1999 දී දෙන ලද අවසරය ආයෝජන මණ්ඩල පනතේ 17 ඡේදය යටතේ ආවරණය වන සමාගම්වලට ද ලැබෙන පරිදි විචක්ෂණ සීමාවන්ට යටත්ව නියම කිරීමයි. මේ වසර තුළදී ජාතික සංවර්ධන බැංකුවට හා සංවර්ධන මූල්‍ය ණය සංස්ථාවට අපනයනකරුවන්ට විදේශ මුදල් ණය ප්‍රදනය සඳහා අවසරය ලබා දුනි. එහෙත් ඒ සඳහා ඔවුන්ගේම විදේශ ණය මූලාශ්‍ර යොද ගත යුතු විය. තවද, බැංකු විසින් දෙනු ලැබූ විදේශ මුදල් ණය පැහැර හැර ඇති අවස්ථාවලදී, ඇපයට තබන ලද වත්කම් විකුණා ඒවා විදේශ මුදල් බවට පරිවර්තනය කිරීමට විනිමය පාලක වෙත අයදුම් කිරීමට ඇති හැකියාව සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී තිබේ.

විද්‍යුත් අරමුදල් සම්ප්‍රේෂණපත් (වි.අ.ස.) ක්ෂේත්‍රයේ අනේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට, නේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට, නේවාසික විජාතික විදේශ මුදල් ගිණුම් හිමියන්ට හා විදේශ මුදල් බැංකු ඒකකවල ගිණුම් හිමියන්ට ඔවුන්ගේ නේවාසික තත්ත්වය නොසලකා කාඩ්පත් නිකුත් කිරීමට අවසර දෙනු ලැබීය. වි.අ.ස. කාඩ්පත් පදනම් කරගෙන විදේශ මුදල් ලබා ගැනීම සම්බන්ධ කටයුතු මෙහෙයුම් කිරීම සඳහා වැඩ පිළිවෙලක් 1999 දී හඳුන්වා

දුන් නමුත් එය ආරම්භ වූයේ 2000 ජූලි මසදීය. මීට හේතු වූයේ විනිමය පාලක විසින් ඉල්ලා සිටින තොරතුරු සැපයීම සඳහා අදාළ බැංකුවට සිය පරිගණක පද්ධතිය සකස් කිරීමට සිදු වූ බැවිනි.

## (I) ප්‍රාග්ධන ගණුදෙනු

### (අ) ශ්‍රී ලංකාවේ අනේවාසික ආයෝජන :

2000 මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු, රක්ෂණ සහ කොටස් තැරැව්කාර කර්මාන්ත යන අංශවල අනේවාසික ආයෝජන සඳහා පැනවූ සීමාවන් ලිහිල් කරන ලදී. මේ අනුව බැංකු ආයතනවල අනේවාසික ආයෝජකයින් සතු කොටස් සඳහා කලින් නියමව පැවති සීමාව 49% සිට 60% දක්වා ඉහළ දැමිණ. රක්ෂණ ව්‍යාපාරය හා සම්බන්ධ සමාගම්වලට අදළ සීමාව 90% ක් ලෙස නියම කෙරුණු අතර කොටස් තැරැව්කාර සමාගම්වලට මේ සීමාව 49% ලෙස තීරණය වුවත් සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවේ අවසරය ලද විටක මෙම සීමාව 100% දක්වා ඉඩ හළේය. අනෙකුත් මූල්‍ය අංශ සේවා සඳහා අදළ සීමාව 49% ක් ලෙස නියම විය. තවද, අනේවාසිකයින්ට සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වූ ඒකක භාරවල ආයෝජනයට ඉඩ දෙන ලදී. එහෙත් මේ සඳහා ඒකක භාරය නිර්මාණය කරන භාරක ඔප්පුවල සහ එවැනි ඒකක භාරයන්හි කළමනාකරණ සමාගම සහ භාරකරුවන් අතර පවතින ගිවිසුම්හි දේපල තැන්පතුවෙන් 20% ක් නොඉක්මවන පරිදි රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු බවට සීමා කොන්දේසියක් අඩංගු විය යුතුය. මෙම වෙනස්වීම් 2000 මාර්තු 7 වන දින ප්‍රකාශයට පත් කළ අංක 1122/12 දරණ රජයේ ගැසට් පත්‍රයෙන් හඳුන්වා දෙනු ලැබිණි. මෙම වෙනස්වීම්වලට යටත්ව දේශීය සමාගම්වල අනේවාසිකයන් විසින් සිදු කරන ආයෝජන මත පනවා ඇති කොන්දේසි පෙර ලෙස නොවෙනස්ව පැවතුණි.

### (ආ) අනේවාසිකයන් විසින් පාලනය කරන සමාගම් සඳහා රුපියල් ණය :

1999 සිට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන ඡේදය යටතේ අනුමත සමාගම් හැරුණුවිට අනේවාසිකයන්ට බහුතර කොටස් හිමි ශ්‍රී ලාංකික සමාගම් සඳහා ණය හා අත්තිකාරම් ඇතුළු පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීමට බැංකු පනත යටතේ බලය ලත් සියළුම වාණිජ බැංකුවලට පොදු අවසරයක් ප්‍රදනය කරන ලදී. 2000 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන ඡේදය යටතේ අනුමත අනේවාසිකයන් විසින් පාලනය කරන සමාගම් සඳහාද ණය දීමට බැංකුවලට අවසර ලබා දුන් අතර, මෙම අවසරය විචක්ෂණ ණය සීමාවනට යටත්ව සිදු කෙරිණ. එය සෑම බැංකුවක් විසින්ම පෞද්ගලික අංශයට ලබා දෙන සමස්ත ණය වලින් ප්‍රතිශතයක් ලෙස නියම විය.

මෙසේ බැංකුවලට පැනවූ සීමාවන් පහත පරිදිය :-

| | | |
|---|---|---|
| විදේශ බැංකු | - | සීමාවක් නැත |
| රාජ්‍ය බැංකු | - | පෞද්ගලික අංශයට ලබා දෙන ණය වලින් 2% ක් |
| දේශීය පෞද්ගලික-බැංකු | | පෞද්ගලික අංශයට ලබා දෙන ණය වලින් 3% ක් |
| අවසර ලත් විශේෂිත බැංකු | - | පෞද්ගලික අංශයට ලබා දෙන ණය වලින් 5% ක් |

මෙම පහසුකම වැඩි වශයෙන් ලබා දී ඇත්තේ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතීන් හා සම්බන්ධ වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් සමාගම් සඳහා වන පහසුකමක් වශයෙනි. කෙසේ වෙතත් විචක්ෂණ ණය සීමාවන් පනවා ඇත්තේ දේශීය සමාගම් ණය ලබා ගැනීම් සඳහා සම්පත් භාවිතයට ගැනීම වැළැක්වීම සඳහාය.

### (ඇ) නේවාසිකයන්ගේ විදේශ මුදල් ණය ගැනීම් :

2000 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි අපනයන කරුවන්ට විදේශ මුදල් ණය සැපයීමට ජාතික සංවර්ධන බැංකුවට හා ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවට අවසරය ලබා දෙන ලදී. එහෙත්, ඒ සඳහා ඔවුන්ගේම විදේශ මුදල් ණය මූලාශ්‍ර තිබිය යුතු විය. විදේශ මුදල් ණය පැහැර හැර ඇති අවස්ථාවලදී එම ණය සඳහා ඇපයට තබා ඇති දේශීය වත්කම් විකුණා එම ආදයම් විදේශ විනිමයට පරිවර්තනය කිරීමට විනිමය පාලකවරයා වෙත අයදුම් කිරීමට අවසරය ලබා දී ඇති බව සියළුම බලය ලත් වෙළඳුන් වෙත දන්වන ලදී. කෙසේ වෙතත් මෙබඳු අයදුම්පත් සලකා බලා එබඳු ඇපයට තබන ලද වත්කම් විකුණා විදේශ විනිමය බවට පරිවර්තනය සඳහා ඉඩ සලසා දෙනු ලබන්නේ එම ණය විදේශ මුදලින් පියවා ගැනීම සඳහා අවශ්‍ය සියලු ප්‍රයත්නයන් දරනු ලැබ, ඒවා අසාර්ථක වී ඇති බවට විනිමය පාලකවරයා සෑහීමකට පත් වන අවස්ථාවලදීය.

අක්වෙරළ ඒකකයන් විසින් සෘජු හා වක්‍ර භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට ලබා දෙන විදේශ මුදල් ණය පහසුකම් ද ඇතුලත් වන ආකාරයට අක්වෙරළ බැංකු කටයුතු නියෝගය සංශෝධනය කිරීමද මේ වසර තුළදී සිදු විය.

**(ඈ) නේවාසික සමාගම් විසින් කරනු ලබන විදේශ ණය ගැනීම් :**

විනිමය පාලන පනතේ විධි විධාන වලින් මුළුමනින්ම නිදහස් වන ආයෝජන මණ්ඩල පනතේ 17 වන ඡේදය යටතේ සඳහන් වන සමාගම් හැර අනෙකුත් සමාගම් වලින් විදේශ මුදල් ණය ලබා ගැනීම සඳහා ලැබෙන අයදුම්පත් සලකා බැලීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් දිගටම සිදු කරන ලදී. මේ වසර තුළදී අයදුම්පත් කිහිපයක් පමණක් අනුමත විය. සමස්ත ණයවල වටිනාකම ඇ.එ.ජ.ඩොලර් මිලියන 3.2 ක් විය.

**(ඉ) ශ්‍රී ලාංකික විගාමිකයන් සහ විදේශිකයන් සතු ඇහුරුම් අරමුදල් :**

ශ්‍රී ලාංකික විගාමිකයන් සහ විදේශිකයන් සතු ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද අරමුදල් ඇහුරුම් ගිණුම්වල තවදුරටත් රඳවා ගනු ලැබූ අතර බදු වගකීම් ඇත්නම් ඒවා පියවීමෙන් අනතුරුව මෙම ආවෘත ගිණුම්වල පොලී ඉපයීම් ප්‍රේෂණය කිරීම අඛණ්ඩව සිදු කෙරිණ. පසුගිය වසරවල සිදු කළ පරිදි, කෙනෙකුට රු. 750,000 ක් වශයෙන් සහ පවුලකට රුපියල් දශ ලක්ෂ 1 ක උපරිමයකට යටත්ව එම අරමුදල් වාණිජ බැංකු මගින් මුදා හැරීම සඳහා අවසර දෙන ලදී. මෙම වසර තුළදී විගාමිකයන්ගේ අයදුම්පත් 126 ක් මගින් කරනු ලැබූ ඉල්ලීම් මත රුපියල් දශ ලක්ෂ 30 ක් ඇහුරුම් අරමුදල් ප්‍රේෂණය සඳහා අනුමැතිය දෙන ලදී. මෙසේ මිය ගිය පුද්ගලයින්ගේ විදේශවල ජීවත් වන ප්‍රතිලාභීන් සඳහා රු. 753,765 ක මුදල් ප්‍රමාණයක්ද ප්‍රේෂණයට ඉඩ හරින ලදී. තවද මේ වසර තුළ ශ්‍රී ලාංකික විගාමිකයන්ට අයත් නිශ්චල දේපල විකිණීමෙන් ලද අරමුදල් වලින් රුපියල් දශ ලක්ෂ 4 ක් දක්වා ප්‍රමාණයක් විදේශයන්ට ප්‍රේෂණය කිරීමද සිදු විය.

**(02) භාණ්ඩ තැව්ගත කිරීම සඳහා පහසුකම් සපයන්නන් ලියාපදිංචි කිරීම හා විදේශ විනිමය ගණුදෙනු සඳහා බලපත්‍ර නිකුත් කිරීම :-**

භාණ්ඩ තැව්ගත කිරීම සඳහා පහසුකම් සපයන්නන් ලියාපදිංචි කිරීම, විදේශ මුදල් මාරු කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම/අළුත් කිරීම, විදේශ සංචාරකයින් සඳහා සපයනු ලබන සේවාවන් සඳහා විදේශ මුදල් ගෙවීම් භාර ගැනීම සඳහා හෝටල්, බදු රහිත සාප්පු, සංචාරක නියෝජිතයන් ආදී ආයතනයන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීමද විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් දිගටම ක්‍රියාත්මක කරන ලදී.

**(අ) භාණ්ඩ තැව්ගත කරන්නන් සඳහා පහසුකම් සපයන්නන් ලියාපදිංචි කිරීම :**

2000 වසර තුළදී භාණ්ඩ තැව්ගත කරන්නන් සඳහා පහසුකම් සපයන්නන් 05 දෙනෙකු අළුතින් ලියාපදිංචි කිරීමත් සමගම වසර අවසානය වනවිට ලියාපදිංචි මුළු නැව් භාණ්ඩ තැව්ගත කරන්නන්ගේ මුළු ගණන 93 දක්වා ඉහළ ගියේය. විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් එහි ලියාපදිංචි පහසුකම් සපයන්නන්ගේ කටයුතු අඛන්ඩව පරීක්ෂාවට ලක් කරනු ලැබිණ.

**(ආ) සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා සංචාරක නියෝජිතයන් වෙත බලය පැවරීම :**

විදේශ ගමන්වල යෙදෙන ශ්‍රී ලාංකිකයන්ට සංචාරක චෙක්පත් නිකුත් කිරීම සඳහා මේ වසර තුළදී එක් සමාගමකට අවසර දෙනු ලැබිණ.

ඒ අනුව සංචාරක චෙක්පත් නිකුත් කිරීමට අවසර ලත් සංචාරක නියෝජිතයන්ගේ මුළු සංඛ්‍යාව 7 දක්වා ඉහළ ගියේය.

**(ඇ) මුදල් මාරු කරන්නන් පත් කිරීම :**

මේ වසර තුළදී මුදල් මාරු කරන්නන් 30 දෙනාට අදළ මෙහෙයුම් කටයුතු ඉතා සමීප ලෙස සිදු කළේය. සාර්ථකව එම කාර්යය ඉටු කළ නොහැකි වූ අයගේ බලපත්‍ර දෙකක් නැවත අළුත් කිරීමට අවසර නොදෙන ලදී. එසේම නව බලපත්‍ර දෙකක් අළුතින් නිකුත් කළ අතර ඒ හේතුවෙන් මුදල් මාරු කරන්නන්ගේ වලංගු බලපත්‍ර සංඛ්‍යාව 2000 අවසානය වනවිට 30 ක් ලෙස නොවෙනස්ව පැවතිණ.

**(03) මෙහෙයුම්**

විනිමය පාලනය ලිහිල් කිරීමත් සමගම ජංගම ගණුදෙනු සඳහා විනිමය මුදා හැරීමේදී ඉල්ලුම් කළ කාර්යය පිළිබඳ ඇති නිර්ව්‍යාජත්වය සලකා බැලීමෙන් සෑහීමකට පත්වීමෙන් අනතුරුව කිසිම බාධාවකින් තොරව විනිමය මුදා හැරීම සඳහා බලය ලත් වෙළෙඳුන්ට හා අනුමත සංචාරක නියෝජිතයින් වෙත බලය පවරන ලදී.

මුද්‍ර හරිනු ලබන සියළුම විදේශ විනිමය පිළිබඳ තොරතුරු බලය ලත් වෙළඳුන් හා අනුමත සංචාරක නියෝජිතයින් විසින් එම ගණුදෙනුවල මෙහෙයුම් කටයුතු සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු විය. 1999 වසරේ සිට, සියළුම බලය ලත් වෙළඳුන් විසින් විද්‍යුත් අරමුදල් සම්ප්‍රේෂණ කාඩ්පත් (වි.අ.ස.) මත මුද්‍ර හරින විදේශ විනිමය පිළිබඳ වාර්තාවක් සැපයිය යුතු විය. විශේෂයෙන්ම, මසක් තුළ ඇ.එ.ජ.ඩො. 5000 ඉක්මවන සෑම වි.අ.ස. කාඩ්පත් මගින් කරනු ලබන ගණුදෙනුවක් පිළිබඳවම මාසික වාර්තාවක් සැපයිය යුතු විය. කෙසේ වෙතත්, බැංකු සිය පරිගණක පද්ධතියට සුදුසු පරිදි සැකසිය යුතුව තිබූ බැවින් වාර්තා සැපයීමේ අවශ්‍යතාවය පූර්ණ ලෙස ක්‍රියාත්මක වූයේ 2000 ජූලි මස සිටය. ඒ දක්වා සියළුම බලය ලත් වෙළඳුන් විසින් ඇ.එ.ජ.ඩො. 3000 ඉක්මවන ගණුදෙනු පමණක් වාර්තා කළයුතු විය. විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂය තුළ මෙම ගණුදෙනුවල මෙහෙයුම් කටයුතුවල යෙදුනේ මූලිකවම වි.අ.ස කාඩ්පත් මගින් අවසර දී නොමැති ප්‍රාග්ධන පැවරුම් හා වාණිජ්‍ය පරිමාණයෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා එම කාඩ්පත් යොදගෙන ඇත්ද යන්න සොයා බැලීමටය.

අපනයනය සඳහා කලින් කරන ලද විනිමය ගෙවීම්වලට අදළ භාණ්ඩ හා සේවා ලැබුණේද යන්න තහවුරු කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධ අත්තිකාරම් ගෙවීම් පිළිබඳ මෙහෙයුම් කටයුතු විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. විදේශීය ප්‍රධානීන් වෙනුවෙන් නැව් හා ගුවන් සේවා නියෝජිතයින් මෙන්ම භාණ්ඩ නැව්ගත කරන්නන් සඳහා ඉඩ පහසුකම් වෙන් කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන ජංගම රුපියල් ගිණුම්වල හර කිරීම් හා බැර කිරීම්හි මෙහෙයුම් කටයුතු කරගෙන යනු ලැබීය. කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් තුළින් කරන ලද ප්‍රාග්ධන සංක්‍රාමයන්ද විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයුමට ලක් කරන ලදී.

### (04) විමර්ශනය

විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් විනිමය පාලන පනත උල්ලංඝනය කිරීම් සම්බන්ධව විමර්ශන කටයුතු නොකඩවා සිදු කළේය. ඇතැම් විමර්ශනයන් 2000 වර්ෂය තුළදී අවසන් කළ අතර වරදකරුවන්ට දඩ මුදල් නියම කෙරුණි. 1999 හා 2000 වර්ෂ තුළදී ගෙවූ සමුච්චිත දඩ මුදල්වල වටිනාකම රුපියල් මිලියන 25 ක් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගිණුම වෙත මේ වසරේදී මාරු කරන ලදී.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාණ්ඩුවේ දේශීය රාජ්‍ය ණය නිකුත් කිරීම, කළමනාකරණය, සේවාකරණය සහ විදේශීය ණය සේවාකරණය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් මෙම කටයුතු කරනු ලැබේ. මෙලෙස පැවරී ඇති වගකීම් ඉටු කරනු වස් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රුපියල් ණය, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දේශීය ණය උපකරණ නිකුත් කිරීම 2000 වර්ෂයේදීද අඛණ්ඩව සිදු කරනු ලැබිණි. මීට අමතරව, විදේශීය රාජ්‍ය ණය සේවාකරණය හා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා සේවාකරණය පිළිබඳ කටයුතුද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. කෙසේ වුවද 2000 වර්ෂය තුළදී මහ බැංකු සුරැකුම්පත් නිකුත් නොකෙරුණි. බදු සංචිත සහතික පත්වලට අදළ සේවාකරණ කටයුතු සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ණයකර නිකුත් කිරීමට අදළ කටයුතුද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මෙයට අමතරව රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධන කටයුතු හා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා එතැන් පරීක්ෂණ (on-site examination) හා දුරස්ථ අවේක්ෂණ (off-site surveillance) සිදු කිරීමේ වගකීමද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### සංවර්ධන කටයුතු

2000 වර්ෂය තුළදී දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ තවදුරටත් දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පියවර කීපයක් ගන්නා ලදී. රාජ්‍ය ණය සුරැකුම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින්, යෝජිත ලේඛන රහිත වූ සුරැකුම්පත් ක්‍රමය හඳුන්වා දීම පිළිබඳ කටයුතුවල රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව අඛන්ඩව යෙදුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මේ සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පිළියෙල කිරීමේ කටයුතුවල නියැළිණි. මෙම යෝජිත ක්‍රමය තුළින් ප්‍රාථමික අලෙවිකරුවන් අතර සුරැකුම්පත් විකිණීම හා මිලදී ගැනීම, ප්‍රති මිලදී ගැනීම් හා ප්‍රතිවර්තිත මිලදී ගැනීම් පිළිබඳ ගණුදෙනු පහසු කිරීම බලාපොරොත්තු වේ.

ප්‍රාථමික අලෙවි නියෝජිත ක්‍රමය ශක්තිමත් කිරීමේ අරමුණින් ප්‍රාථමික අලෙවි කටයුතු සඳහාම කැප වූ රුපියල් දශ ලක්ෂ 150 ක ප්‍රාග්ධනයක් සහිත පොදු සීමිත වගකීම් සහිත සමාගම් 8 ක් 2000 මාර්තු 01 දින සිට පත් කෙරිණි. ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතේ දක්වා ඇති ප්‍රතිපාදන යටතේ පනවන ලද නීතිරීතිවලට අනුකූලව ගරු මුදල් අමාත්‍යතුමියට පැවරී ඇති බලතල අනුව නව ප්‍රාථමික අලෙවි නියෝජිතයන් පත් කරන ලදී. මෙම සමාගම් රාජ්‍ය ණය සුරැකුම් වෙළඳ කටයුතු මූලික කොට ගත් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කටයුතුවල පමණක්ම නිරත විය යුතු

වේ. ඉහත දක්වන ලද නීති රීති බලපැවැත්වීමත් සමග එතෙක් පැවති ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරිත්වය අහෝසි විය. අනෙකුත් කටයුතුවලට අමතරව, මෙම නීති රීති මගින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කටයුතු කාර්යක්ෂමව, ආරක්ෂාකාරීව හා ක්‍රමවත් ආකාරයෙන් සිදු වන්නේද යන්න සුපරීක්ෂණය හා අධීක්ෂණය කිරීමට මහ බැංකුවට ඉඩ සැලසීන.

ප්‍රාථමික අලෙවිකරුවන් අවේක්ෂණය කිරීම සඳහා සැලැස්මක් හා ක්‍රමයක් සකස් කිරීම පිණිස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව උපදේශක සේවාවක් ලබා ගන්නා ලදී. මෙම උපදේශකවරුන් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරීත්වයට අදළ එතෙක් පැවැති නීති රීති රාමුව හා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධාන නිරීක්ෂණය කරන ලදී. එමෙන්ම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරීත්වය සඳහා පැවති රෙගුලාසි සහ උපදෙස් නවීකරණය කිරීමට හා අළුතින් එකතු කළයුතු ද පිළිබඳව මෙම උපදේශකයන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඔවුන් ඉදිරිපත් කරන ලද මූලික නිර්දේශයන් අතර භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය හඳුන්වා දීම තුළින් ගෝලීය ප්‍රති මිලදී ගැනීම් ගිවිසුමක් (Global Master Repurchase Agreement) පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පැහැදිලි හා විනිවිද සුළු භාවය වර්ධනය කිරීමත්, ප්‍රාථමික අලෙවිකරුවන් වෙත බලපත්‍ර නිකුත් කිරීම සඳහා වඩා දැඩි වූ ක්‍රියාවලියක් හඳුන්වා දීමත් ඇතුළත් විය.

මෙම උපදේශකවරුන් විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ක්‍රියාකාරී අත්පොත් 2 ක් පිළියෙල කරන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සඳහා වන අත්පොතෙහි විවිධ අවදානම් අවස්ථාවන්හිදී යෙදිය හැකි විවිධ ක්‍රියාකාරකම් ආවරණය වන ආකාරයෙන් එතැන් පරීක්ෂණ (On-site Examination) සඳහා ප්‍රශ්නාවලියක්ද අඩංගු වේ. එමෙන්ම එතැන් පරීක්ෂණයන් පැවැත්වීම සඳහා වන සිව් වැදගත් ප්‍රවිශ්ඨයන්ට අදළ විස්තර හඳුන්වා දී ඇත. මෙම උපදේශකවරුන් සුපරීක්ෂණය සඳහා අවදානම මූලික කොටගත් ප්‍රවිශ්ඨයක් යොදා ගන්නා ලදී. මෙහිදී ඵලදායී, කාර්යක්ෂම හා කාලීන පදනමකින් යුතුව අවදානම නියමිත පරිදි හඳුනා ගැනීමට කළමනාකරණය කිරීමට හා පාලනය කිරීමට ප්‍රාථමික අලෙවිකරුවන්ට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කෙරේ. මේ අනුව එකිනෙක ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අවදානම් සංයුතිය ක්‍රමානුකූලව හඳුනා ගැනීම අධීක්ෂණයට අයත් වේ. තවද, ක්‍රියාවන්හී අන්තර්ගත අවදානම් පාලනය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය කළමනාකාරිත්ව, සංවිධානමය හා විධිවිධානවල ප්‍රමාණවත් භාවය අගය කිරීමත් අධීක්ෂණයේ සමස්ත අරමුණ වේ.

ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන අත්පොතෙහි දුරස්ථ අධීක්ෂණයේ කොටසක් ලෙස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන සියළුම වාර්තා හා එම වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ සවිස්තර උපදෙස් මාලාවක්ද අඩංගු වේ. වඩා ආරක්ෂාකාරී හා ක්‍රමවත් වූ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ජාලයක් පිහිටුවීම අරමුණු කොට ගත් රාජ්‍ය ණය සුරැකුම්පත් අලෙවිය, සමස්ත රාජ්‍ය ණය කළමනාකරණය, සංවිධානය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ අන්තර් ජාතික ප්‍රශස්ථීන් ප්‍රාථමික අලෙවිකරුවන්ට හඳුනා ගැනීමට මග පෙන්වීමද මෙම අත්පොත මගින් සිදු කෙරේ. එමෙන්ම මෙම අත්පොත මගින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට එතැන් පරීක්ෂණ හා දුරස්ථ අධීක්ෂණ පිළිබඳව මග පෙන්වීම් කර ඇත. මෙම අත්පොතෙහි සඳහන් මූලධර්මයන් හා ප්‍රශස්තීන් කොතෙක් දුරට අනුගමනය කරනනේද යන්න පදනම් කරගෙන එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් පිළිබඳ අගැයීම කරනු ලැබේ.

2000 වර්ෂයේදී වසර 2 කින් කල්පිරෙන කැඳවිය හැකි භාණ්ඩාගාර බැඳුම්කර මුල්වරට නිකුත් කරන ලදී. මෙම නව ණය උපකරණය අනාගතයේ පහත වැටෙන පොලී අනුපාතිකයන්ගේ වාසිය රජයට ලැබෙන පරිදි, රජයේ අභිමතය අනුව, නිකුත් කර වසරක් අවසානයේදී හෝ කල් පිරීමට පෙර යම් දිනයෙකදී මුදල් ගෙවා නිදහස් කළ හැකිය. මෙම ණය උපකරණයෙහි මුළු නිකුතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 650 ක් විය.

## මෙහෙයුම් කටයුතු

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2000 වසර අවසන් වන විට සේවාකරණය කරනු ලැබූ නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,147,968 ක් විය. මෙය 1999 වර්ෂය හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 138,750 ක් හෙවත් සියයට 13.7 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 603,026 ක් (සියයට 52.5) දේශීය රාජ්‍ය ණය වූ අතර, රුපියල් දශ ලක්ෂ 544,942 ක් (සියයට 47.5) විදේශ ණය වලින් සමන්විත විය. 1999 වසර හා සසඳ බලන කළ 2000 වසරේදී දේශීය රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 111,089 (සියයට 22.6) කින් වර්ධනය වූ අතර, විදේශ ණය රුපියල් දශ ලක්ෂ 27,661 (සියයට 5.3) කින් වර්ධනය විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සේවාකරණය කරනු ලැබූ රාජ්‍ය ණයෙහි සංයුතිය II-17 වන සංඛ්‍යා සටහනින් දක්වේ.

**II - 17 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය ණය සංයුතිය**

| වර්ගය | 1999 අවසානයට | | 2000 අවසානයට | |
|---|---|---|---|---|
| | (රු.ද.ල.) | % | (රු.ද.ල.) | % |
| දේශීය රාජ්‍ය ණය | 491,937 | 48.7 | 603,026 | 52.5 |
| භාණ්ඩාගාර බිල්පත් | 124,996 | | 134,996 | |
| රුපියල් සුරැකුම්පත් | 262,056 | | 263,888 | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 104,867 | | 204,124 | |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 11 | | 11 | |
| බදු සංචිත සහතිකපත් | 7 | | 7 | |
| විදේශීය ණය | 517,281 | 51.3 | 544,942* | 47.5 |
| එකතුව | 1,009,218 | 100.0 | 1,147,968 | 100.0 |

* තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## දේශීය ණය

### ප්‍රාථමික වෙළඳපොළ

#### භාණ්ඩාගාර බිල්පත්

1999 වර්ෂය අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 124,996 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල නොපියවන ලද මුළු වගකීම් ප්‍රමාණය 2000 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 134,996 ක් විය. මෙම වැඩි වීම රුපියල් දශ ලක්ෂ 10,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ශුද්ධ නව නිකුතුන්වල ප්‍රතිඵලයකි (භාණ්ඩාගාර බිල්පත් නව නිකුතුන් රුපියල් දශ ලක්ෂ 13,000 ක් වූ අතර, විශ්‍රාම ගැන්වීම් රුපියල් දශ ලක්ෂ 3,000 ක් විය). භාණ්ඩාගාර බිල්පත්වල අනුදත් සීමාව 2000 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 125,000 සිට රුපියල් දශ ලක්ෂ 135,000 ක් දක්වා ඉහළ නැංවිණ.

වර්ෂය තුළදී නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 182,044 සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 248,244 ක් විය. මෙම භාණ්ඩාගාර බිල්පත් වලින් රුපියල් දශ ලක්ෂ 118,292 ක් හෝ සියයට 65.0 ක් ප්‍රාථමික අලෙවිකරුවන් විසින් මිලදී ගන්නා ලදී. බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතය යටතේ මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් මගින් වර්ෂය තුළදී මිලදී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය මුළු ලංසු ප්‍රමාණයෙන් සියයට 5.7 ක් විය. 2000 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගන්නා ලද මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 53,429 ක් හෙවත් සියයට 29.3 ක් විය. 2000 වර්ෂයේදී පිළි ගන්නා ලද ලංසු මූලාශ්‍ර අනුව බෙදී ගිය ආකාරය II-18 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ.

**II - 19 සංඛ්‍යා සටහන**
**භාණ්ඩාගාර බිල්පත්හි වාර්ෂිකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතික පරිණත කාලය අනුව**

(වාර්ෂික ප්‍රතිශතය)

| වර්ෂය | පරිණත කාලය(මාස) * | | | සමස්ත සාමාන්‍ය |
|---|---|---|---|---|
| | 3 | 6 | 12 | |
| 1996 | 16.04 | 16.46 | 17.17 | 16.46 |
| 1997 | 11.03 | 11.95 | 12.29 | 11.60 |
| 1998 | 11.77 | 12.13 | 12.20 | 11.98 |
| 1999 | 11.69 | 12.03 | 12.55 | 12.06 |
| 2000 | 12.78 | 12.97 | 14.23 | 13.68 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* පරිණත කාලසීමාව මාස 3, මාස 6 සහ මාස 12 වෙනුවට පිළිවෙලින් දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම 1999 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ විය.

2000 වර්ෂයේදීද රුපියල් ණය වෙනුවෙන් ප්‍රධාන දයකයන් වූ අතර, මෙම ආයතනික ආයෝජකයින් දෙදෙනාගෙන් ලැබුණු මුළු දයකවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 41,190 ක් හෙවත් සියයට 97.6 ක් විය.

වර්ෂය තුළදී නිකුත් කළ රුපියල් ණය පරිණත කාලසීමා වර්ෂ 5/6, 1 සහ 8/10 වශයෙන් වූ අතර මේවා සඳහා වාර්ෂික පොලී අනුපාතික පිළිවෙලින් සියයට 11.00, සියයට 11.90 සහ සියයට 12.00 විය. මෙම ණය වලින් එකක් වර්ෂ 01 ක ස්ථිර පරිණත කාලසීමාවක් සහිතව නිකුත් කළ අතර, ඉතිරි ණය වලින් ණය 4 ක් වර්ෂ 5/6 කින්ද, අනෙකුත් ණය 10 වර්ෂ 8/10 කින්ද යුතු වූ වෛකල්පික කාලසීමාවන් සහිතව නිකුත් කළ ඒවා විය. නිකුත් කරන ලද හා ගෙවා නිම කරන ලද රුපියල් ණය පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව II-20 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**II - 18 සංඛ්‍යා සටහන**
**පරිණත කාලය අනුව භාණ්ඩාගාර බිල්පත් විකුණුම් සහ ලබාගත් මූලාශ්‍ර - 2000**

රුපියල් දශලක්ෂ

| මූලාශ්‍රය | පරිණත කාලය (දින) | | | | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| | 91 | 182 | 364 | වෙනත් | | |
| 1. ප්‍රාථමික අලෙවිකරුවන් | 31,785 | 13,389 | 73,118 | - | 118,292 | 65.0 |
| 2. ශ්‍රී ලංකා මහ බැංකුව | - | - | - | 53,429 | 53,429 | 29.3 |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය වන අරමුදල් | 3,782 | 1,971 | 4,570 | - | 10,323 | 5.7 |
| එකතුව | 35,567 | 15,360 | 77,688 | 53,429 | 182,044 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාලසීමාව අනුව වාර්ෂිකකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාත II-19 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

#### රුපියල් ණය :

2000 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 42,211 ක් වටිනාකම ඇති රුපියල් ණය 15 ක් නිකුත් කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව

2000 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 40,378 ක් වටිනා රුපියල් ණය 12 ක් ආපසු ගෙවන ලදී. රුපියල් දශ ලක්ෂ 1,832 ක රුපියල් ණය සඳහා වූ ශුද්ධ දයකවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් නොපියවූ රුපියල් ණය වගකීම් ප්‍රමාණය 1999 අවසානයේ පැවති රුපියල් දශ ලක්ෂ 262,056 සිට 2000 අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 263,888 දක්වා වැඩි විය. නොපියවූ රුපියල් ණය වගකීම්වල පරිණත කාල රටාව II-21 වන සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

2000 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 33,902 ක් වූ රුපියල් ණය සඳහා වූ පොලී ගෙවීම් ප්‍රමාණය, ඊට පෙර

### II -20 වන සංඛ්‍යා සටහන
### රුපියල් ණය නිකුත් කිරීම සහ ආපසු ගෙවීම - 2000

| වාර්ෂික පොලී අනුපාතිකය සියයට | පරිණත කාල (වර්ෂ) | ණය සංඛ්‍යාව | නිකුත් කළ ප්‍රමාණය රු. දශ ලක්ෂ |
|---|---|---|---|
| නිකුත් කිරීම් | | | |
| 11.00 | 5/6 | 4 | 11,000 |
| 11.90 | 1 | 1 | 8,000 |
| 12.00 | 8/10 | 10 | 23,211 |
| එකතුව | | 15 | 42,211 |
| ආපසු ගෙවීම් | | | |
| 13.50 | 3 | 1 | 5,000 |
| 14.00 | 5/6 | 4 | 14,878 |
| 14.00 | 6 | 1 | 1,500 |
| 14.50 | 3 | 2 | 10,000 |
| 14.50 | 6 | 1 | 4,000 |
| 14.75 | 6/7 | 2 | 3,000 |
| 15.75 | 6/7 | 1 | 2,000 |
| එකතුව | | 12 | 40,378 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 32,803 සමහ සසඳන විට රුපියල් දශ ලක්ෂ 1,099 ක (සියයට 3.4 ක) වැඩිවීමක් පෙන්නුම් කරයි. 2000 වසර තුළදී පොලී බලපත් 769 කට අදළ පොලී ප්‍රමාණයන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ගෙවා දමන ලදී.

### II - 21 සංඛ්‍යා සටහන
### 2000 අවසානයේදී රුපියල් ණයවල පරිණත කාල රටාව

| පරිණත කාලසීමාව (වර්ෂ) | වටිනාකම (රු.ද.ල.) | ප්‍රතිශතය |
|---|---|---|
| 1 | 8,000.00 | 3.03 |
| 2 | 7,485.58 | 2.84 |
| 4 | 5,000.00 | 1.89 |
| 5 | 10,000.00 | 3.79 |
| 10 | 5,979.86 | 2.27 |
| 30 | 24,088.00 | 9.13 |
| 4/5 | 5,500.00 | 2.08 |
| 4/6 | 10,316.68 | 3.91 |
| 4/8 | 3,500.00 | 1.33 |
| 5/6 | 17,000.00 | 6.44 |
| 5/7 | 53,715.01 | 20.36 |
| 6/7 | 38,800.00 | 12.81 |
| 6/8 | 1,000.00 | 0.38 |
| 7/8 | 26,400.00 | 10.00 |
| 8/10 | 24,210.59 | 9.17 |
| 9/10 | 8,500.00 | 3.22 |
| 1/10 | 19,392.62 | 7.35 |
| එකතුව | 263,888.34 | 100.00 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**භාණ්ඩාගාර බැඳුම්කර :**

2000 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 125,322 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. මෙම බැඳුම්කර අවරුදු 2 - 6 කල්පිරීමේ කාලසීමා වලින් යුක්ත විය. 2000 වර්ෂයේදී ප්‍රථම වරට රුපියල් දශ ලක්ෂ 650 ක් වටිනා වසර 2 කින් කල්පිරෙන කැඳවිය හැකි භාණ්ඩාගාර බැඳුම්කර (Collable Treasury Bonds) නිකුත් කරන ලදී. වසර තුළදී වෙන්දේසි 74 ක් පවත්වන ලද අතර, මෙම වෙන්දේසි වසර 2 කින් කල්පිරෙන නිකුතු 30 කින්ද, වසර 3 කින් කල්පිරෙන නිකුතු 19 කින්ද, වසර 4 කින් කල්පිරෙන නිකුතු 8 කින්ද, වසර 5 කින් කල්පිරෙන නිකුතු 9 කින්ද. වසර 6 කින් කල්පිරෙන නිකුතු 8 කින්ද සමන්විත විය. නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීමේ කාලසීමාව අනුව II-22 වන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

### II - 22 සංඛ්‍යා සටහන
### භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාල රටාව අනුව

| කල් පිරීමේ කාලසීමාව වර්ෂ | ප්‍රමාණය රු.ද.ල. | ප්‍රතිශතය |
|---|---|---|
| 2 | 58,321 | 46.54 |
| 3 | 27,951 | 22.30 |
| 4 | 10,000 | 7.98 |
| 5 | 14,550 | 11.61 |
| 6 | 14,500 | 11.57 |
| එකතුව | 125,322 | 100.00 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කල්පිරීමේ කාලසීමාව වසර 2 - 6 දක්වා වූ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ වාර්ෂික කූපන් අනුපාත සියයට 10.75 සිට 11.75 දක්වා වූ පරාසයක වූ අතර, පරිණත කාලය වැඩිවන සෑම වසරක් සඳහාම ප්‍රතිශතාංක 25 ක් එකතු කෙරින. 2000 වර්ෂය තුළදී පවත්වනු ලැබූ සියළුම භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා අධි දයකත්වයක් ලැබුණ අතර, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 275,537 ක් විය. 2000 වර්ෂය තුළ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික නිකුතු පිළිබඳ තෝරාගත් තොරතුරු II-23 වන සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

බැඳුම්කර දරන්නන් විසින් ප්‍රාථමික අලෙවිකරුවන් මගින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද කූපන්පත්වලට අර්ධ වාර්ෂිකව පොලී ගෙවනු ලැබිණි. කලින් වසරේදී ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 7,487 සමහ සසඳන විට 2000 වසර තුළදී ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15,015 ක් විය. මෙම වර්ෂය තුළදී ආපසු ගෙවීම සඳහා කල්පිරුණ භාණ්ඩාගාර බැඳුම්කර සහතිකපත් 3,821 ක් ලැබුණ අතර, ඒ සඳහා ගෙවන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 26,065 ක් විය. අර්ධ වාර්ෂික පොලී ගෙවීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ලැබුණ කූපන් ප්‍රමාණය 24,575 ක් විය.

වර්ෂය තුළදී නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහතික පත් ප්‍රමාණය 12,253 ක් විය. ඉන් 7,764 ක් වසර 2 කින්ද, 2,889 ක් වසර 3 කින්ද, 620 ක් වසර 4 කින්ද, 567 ක් වසර 5 කින්ද, 413 ක් වසර 6 කින්ද කල් පිරෙන ඒවා විය.

**II -23 සංඛ්‍යා සටහන**
**භාණ්ඩාගාර බැඳුම්කරවල තෝරා ගත් තොරතුරු-2000**

| කාණ්ඩය | | | කල් පිරීමේ කාලසීමාව (අවුරුදු) | ලැබුණු ලංසු ප්‍රමාණය (රු.දශ.ල.) | පිළිගත් ලංසු ප්‍රමාණය (රු.දශ.ල.) | බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය (වර්ෂයකට සියයට) | කූපන් අනුපාතිකය (වර්ෂයකට සියයට) |
|---|---|---|---|---|---|---|---|
| 10.75% | 2002 | ඒ | 2 | 5,926 | 1,000 | 12.49 | 10.75 |
| 10.75% | 2002 | බී | 2 | 3,985 | 2,000 | 12.34 | 10.75 |
| 10.75% | 2002 | සී | 2 | 1,000 | 1,000 | 12.00 | 10.75 |
| 10.75% | 2002 | ඩී | 2 | 3,025 | 2,000 | 13.11 | 10.75 |
| 10.75% | 2002 | ඊ | 2 | 12,000 | 12,000 | 13.11 | 10.75 |
| 10.75% | 2002 | එෆ් | 2 | 14,685 | 4,000 | 13.58-13.69 | 10.75 |
| 10.75% | 2002 | ජී | 2 | 10,033 | 4,660 | 13.86-15.38 | 10.75 |
| 10.75% | 2002 | එච් | 2 | 2,895 | 2,500 | 15.71 | 10.75 |
| 10.75% | 2002 | ජේ | 2 | 5,777 | 4,511 | 16.40-16.89 | 10.75 |
| 10.75% | 2002 | කේ | 2 | 10,593 | 6,300 | 17.52-21.81 | 10.75 |
| 10.75% | 2002 | එල් | 2 | 18,655 | 5,450 | 21.80-22.19 | 10.75 |
| 10.75% | 2002 | එම් | 2 | 4,427 | 650 | 20.62-22.00 | 10.75 |
| 10.75% | 2002 | එන් | 2 | 30,976 | 9,500 | 20.09-21.30 | 10.75 |
| 10.75% | 2002 | ඕ | 2 | 10,788 | 2,750 | 18.97 | 11.00 |
| 11.00% | 2003 | ඒ | 3 | 3,060 | 955 | 12.51 | 11.00 |
| 11.00% | 2003 | බී | 3 | 9,842 | 4,000 | 12.27-12.38 | 11.00 |
| 11.00% | 2003 | සී | 3 | 2,000 | 2,000 | 12.02 | 11.00 |
| 11.00% | 2003 | ඩී | 3 | 6,909 | 4,000 | 13.93-14.81 | 11.00 |
| 11.00% | 2003 | ඊ | 3 | 7,141 | 3,500 | 14.81-15.53 | 11.00 |
| 11.00% | 2003 | එෆ් | 3 | 12,358 | 3,500 | 15.65-15.92 | 11.00 |
| 11.00% | 2003 | ජී | 3 | 3,712 | 2,500 | 16.00 | 11.00 |
| 11.00% | 2003 | එච් | 3 | 5,820 | 4,496 | 16.44-16.93 | 11.00 |
| 11.00% | 2003 | ජේ | 3 | 4,313 | 3,000 | 17.30-18.71 | 11.00 |
| 11.25% | 2004 | ඒ | 4 | 10,245 | 4,000 | 12.40-12.53 | 11.25 |
| 11.25% | 2004 | බී | 4 | 8,175 | 3,000 | 12.39-13.01 | 11.25 |
| 11.25% | 2004 | සී | 4 | 3,540 | 3,000 | 12.17-13.05 | 11.25 |
| 11.50% | 2005 | ඒ | 5 | 13,495 | 7,000 | 12.87-13.02 | 11.50 |
| 11.50% | 2005 | බී | 5 | 8,898 | 2,400 | 12.71-12.77 | 11.50 |
| 11.50% | 2005 | සී | 5 | 6,318 | 2,150 | 12.71-12.94 | 11.50 |
| 11.50% | 2005 | ඩී | 5 | 3,000 | 3,000 | 12.46 | 11.50 |
| 11.75% | 2006 | ඒ | 6 | 17,015 | 7,000 | 12.90-13.21 | 11.75 |
| 11.75% | 2006 | බී | 6 | 5,616 | 2,000 | 12.73 | 11.75 |
| 11.75% | 2006 | සී | 6 | 5,315 | 1,500 | 12.78-12.95 | 11.75 |
| 11.75% | 2006 | ඩී | 6 | 4,000 | 4,000 | 12.53 | 11.75 |
| එකතුව | | | | 275,537 | 125,322 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### භාණ්ඩාගාර තැන්පතු සහතික :

2000 වර්ෂය තුළදී භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත් කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු නොවීය. රුපියල් දශ ලක්ෂ 10.6 ක් වූ භාණ්ඩාගාර තැන්පතු සහතික ආපසු ගෙවිය යුතු ප්‍රමාණය 2000 වර්ෂය තුළදීද නොවෙනස්ව පැවතුණි.

### අනෙකුත් දේශීය ණය උපකරණ :

2000 වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනයන්හි ණයකර නිකුත් කිරීම් හෝ ඒ සඳහා ආපසු ගෙවීම් සිදු නොවුණි. වර්ෂය අවසානයේදී මෙම ණයකරවල නොපියවූ ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 500, රුපියල් දශ ලක්ෂ 109 සහ රුපියල් දශ ලක්ෂ 83 ක් විය.

වර්ෂය තුළදී බදු සංචිත සහතිකපත්වල ආපසු ගෙවීමක් හෝ පොලී ගෙවීමක් සිදු නොවූ අතර, මෙම සහතිකපත්වල නොපියවූ ශේෂය 1999 වසර අවසානයේදී පැවති ශේෂය වූ රුපියල් දශ ලක්ෂ 7.2 ක් ලෙසම 2000 වසර අවසානයේදීත් නොවෙනස්ව පැවතිනි.

### ප්‍රාථමික අලෙවි නියෝජිතයින්ගේ ද්විතියික වෙළෙඳපොළ කටයුතු :

භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළඳපොළ 2000 වර්ෂය තුළදී සැලකියයුතු ලෙස පුළුල් විය. ප්‍රාථමික අලෙවිකරුවන්, වාණිජ බැංකු හා ගණුදෙනුකරුවන් අතර, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර අයිතිය පැවරීමේ, මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු මෙන්ම ප්‍රති මිලදී ගැනීම් හා ප්‍රතිවර්තික මිලදී ගැනීම් කටයුතු ද සැලකියයුතු ලෙස සිදු කෙරුණි. 2000 වර්ෂය තුළදී අයිතිය පැවරීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ද්විතීයික වෙළඳපොලේ කරන ලද මුළු විකුණුම් හා මිලදී ගැනීම් ප්‍රමාණය භාණ්ඩාගාර බිල්පත් සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 111 ක් සහ රුපියල් බිලියන 34 ක් වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 128 ක් සහ රුපියල් බිලියන 74 ක් විය. එමෙන්ම ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවර්තික මිලදී ගැනීම් භාණ්ඩාගාර බිල්පත් සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 134 ක් හා රුපියල් බිලියන 104 ක් වූ අතර භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 756 ක් හා රුපියල් බිලියන 327 ක් විය.

2000 වර්ෂය අවසානයේදී ප්‍රාථමික වෙළඳුන් සතුව පැවති භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 3 ක් හෙවත් නොපියවන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 2.2 ක් වූ අතර ඔවුන් සතුව පැවති භාණ්ඩාගාර බැඳුම්කරවල මුළු වටිනාකම රුපියල් බිලියන 10 ක් හෙවත් නොපියවන ලද මුළු භාණ්ඩාගාර බැඳුම්කරවලින් සියයට 4.9 ක් විය.

### විදේශ ණය :

2000 අවසානයේදී නොපියවූ මුළු විදේශීය රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 544,942 ක් වූ අතර, 1999 අවසානය හා සසඳන කල එය රුපියල් දශ ලක්ෂ 27,661 (සියයට 5.3) ක වර්ධනයක් පෙන්වීය. වසර අවසානයේදී නොපියවූ මුළු ණයෙන් ද්විපාර්ශ්වීය ණය ප්‍රමාණය සහ බහු පාර්ශ්වීය ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 277,258 (සියයට 51) හා රුපියල් දශ ලක්ෂ 249,777 (සියයට 46) ක් වූ අතර, වාණිජ ණය හා අපනයන ණය රුපියල් දශ ලක්ෂ 17,907 ක් (සියයට 3 ක්) විය. ප්‍රධාන ද්විපාර්ශ්වීය ණය හිමියන් වූයේ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජර්මනියයි. මුළු ද්විපාර්ශ්වීය ණය ප්‍රමාණයෙන් මෙකී මූලාශ්‍රයන්ගේ දායකත්වය රුපියල් දශ ලක්ෂ 258,124 ක් හෙවත් සියයට 93 ක් විය. බහුපාර්ශ්වීය අංශයේ විශාලතම ණය හිමියා වූ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුළු බහු පාර්ශ්වීය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 129,144 කට හෙවත් සියයට 52 කට හිමිකම් පෑවේය.

ණය මුදල් උපයෝජනය අනුව වර්ග කිරීමේදී ව්‍යාපෘති ණය, වැඩසටහන් ණය සහ භාණ්ඩ ණය රජයේ මුළු විදේශ ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 427,415 (සියයට 78) රුපියල් දශ ලක්ෂ 49,529 (සියයට 9) හා රුපියල් දශ ලක්ෂ 30,627 (සියයට 6) විය. ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය කරන ලද ආකාරය අනුව 2000 අවසානයේදී රජයේ විදේශීය ණය සංයුතිය II-24 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**II -24 සංඛ්‍යා සටහන**
**2000 අවසානයේදී නොපියවූ දළ විදේශීය ණය**

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | % |
|---|---|---|
| (1) ණය දෙන්නන් අනුව | 544,942 | 100 |
| ද්වි පාර්ශවීය | 277,258 | 51 |
| බහු පාර්ශවීය | 249,777 | 46 |
| වාණිජමය | 11,096 | 2 |
| අපනයන ණය | 6,811 | 1 |
| (2) ණය මුදල් උපයෝජනය අනුව | 544,942 | 100 |
| මුදල් | 4,750 | 1 |
| භාණ්ඩ | 30,627 | 6 |
| ආහාර | 32,447 | 6 |
| වැඩසටහන් | 49,529 | 9 |
| ව්‍යාපෘති | 427,415 | 78 |
| තාක්ෂණික ආධාර | 174 | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2000 වසර තුළදී විදේශීය රාජ්‍ය ණය මුල් මුදල් ආපසු ගෙවීම් හා පොලී සහ අනෙකුත් ගාස්තු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 20,464 ක් සහ රුපියල් දශ ලක්ෂ 10,236 ක් විය. වසරේ මුළු උපලබ්ධි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 26,966 ක් වූ අතර, එය ද්විපාර්ශ්වීය මූලයන්ගෙන් ලැබුණු රුපියල් දශ ලක්ෂ 16,804 (සියයට 62) කින්ද, බහුපාර්ශ්වීය මූලයන්ගෙන් ලැබුණු රුපියල් දශ ලක්ෂ 9,490 (සියයට 35)

**II - 25 සංඛ්‍යා සටහන**
**විදේශ ණය උපලබ්ධීන්**

| වර්ගය | 1999 ප්‍රමාණය රු.ද.ල. | 1999 % | 2000 ප්‍රමාණය රු.ද.ල. | 2000 % |
|---|---|---|---|---|
| 1. ණය දෙන්නන් අනුව | 24,889 | 100 | 26,966 | 100 |
| ද්වි පාර්ශවීය | 12,823 | 51 | 16,804 | 62 |
| බහු පාර්ශවීය | 10,880 | 44 | 9,490 | 35 |
| වාණිජමය | - | - | - | - |
| අපනයන ණය | 1,186 | 5 | 672 | 3 |
| 2. ණය උපයෝජනය අනුව | 24,889 | 100 | 26,966 | 100 |
| මුදල් | - | - | - | - |
| භාණ්ඩ | 28 | - | 6 | - |
| ආහාර | - | - | 385 | 1 |
| වැඩසටහන් | - | - | - | - |
| ව්‍යාපෘති | 24,860 | 100 | 26,575 | 99 |
| තාක්ෂණික ආධාර | 1 | - | - | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කින්ද, වාණිජ බැංකුවලින් හා අපනයන ණය ලෙසින් ලැබුණු රුපියල් දශ ලක්ෂ 672 (සියයට 3) කින්ද සමන්විත විය. පසුගිය වර්ෂයේ මුළු උපලබ්ධි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 24,889 ක් වූ අතර, එය සමන්විත වූයේ පිළිවෙලින් ද්විපාර්ශ්වීය, බහු පාර්ශ්වීය සහ වාණිජමය මූලයන් වෙතින් ලැබුණ රුපියල් දශ ලක්ෂ 12,823 (සියයට 51), රුපියල් දශ ලක්ෂ 10,880 (සියයට 44) සහ රුපියල් දශ ලක්ෂ 1,186 (සියයට 5) කිනි. 2000 වසරේ ලැබුණ උපලබ්ධීන්ගෙන් සියයට 99 ක් ම ලැබුණේ ව්‍යාපෘති ණය යටතේය.

II-25 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙන්නේ ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය අනුව 1999 සහ 2000 වර්ෂවල උපලබ්ධි ප්‍රමාණයන්ය.

2000 දී නව විදේශ ණය 19 ක් ගිවිසුම්ගත කරන ලද අතර, වසර අවසානයේදී ක්‍රියාත්මක වූ මුළු ණය සංඛ්‍යාව 535 දක්වා වර්ධනය විය. මෙම ණය අවුරුදු 1 සිට 17 දක්වා වූ සහන කාලයකින් යුක්ත වූ අතර, ආපසු ගෙවීමේ කාලය අවුරුදු 2 සිට 40 අතර විය. වාර්ෂික පොලී අනුපාතිකය සියයට 0 සිට සියයට 10.85 අතර විය. ණය තුළ අන්තර්ගත ප්‍රදාන ප්‍රතිශතය සියයට 2 සිට සියයට 91 දක්වා වූ පරාසයක විය. ණය දෙන්නන් අනුව 2000 අවසානයේදී රජයේ විදේශීය ණය සහන කාල, පරිණත කාල, පොලී අනුපාතික හා ප්‍රදාන ප්‍රතිශතය පිළිබඳ පරාසයන් II-26 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**II - 26 සංඛ්‍යා සටහන**
**විදේශ ණයවල පරිණත කාල, පොලී අනුපාතික හා ප්‍රදාන ප්‍රතිශත**

| වර්ගය | පරිණත කාලය (අවුරුදු): පරිණත කාලය (අවුරුදු) | පරිණත කාලය (අවුරුදු): ආපසු ගෙවීම් කාලය | පොලී අනුපාතිකය සේවා ගාස්තු (වාර්ෂික %) | ප්‍රදාන ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ද්වි පාර්ශවීය | 1-17 | 7-40 | 0.00-7.39 | 5-91 |
| බහු පාර්ශවීය | 3-11 | 9-40 | 0.75-8.25 | 5-88 |
| වාණිජමය | 1-10 | 2-30 | 4.00-10.85 | 2-61 |
| අපනයන ණය | 1-10 | 7-13 | 3.50-9.58 | 4-55 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය

මූල්‍ය අංශයෙහි තාක්ෂණික ප්‍රගතිය හා නවෝත්පාදන තුළින් ඇති කරන අභියෝගයන්ට සරිලන නිපුනතාවයක් බැංකු කටයුතු හා මූල්‍ය අංශයේ සේවකයින්ට ලබා දීම සඳහා බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය පුහුණු පාඨමාලාවන් මෙහෙයවනු ලැබීය. 2000 වසරේදී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය පුහුණු ලාභීන් 2,265 ක් සඳහා පුහුණු පැය 2,969 ක් ආවරණය වූ පුහුණු පාඨමාලා 90 ක් පවත්වන ලදී. මෙම පුහුණුලාභීන්ගෙන් සියයට 49 ක් ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් විය. 2000 වර්ෂයේ පුහුණු පාඨමාලා දින දර්ශණයේ දක්වූ පුහුණු වැඩසටහන් 76 ක් සඳහා සහභාගී

වූවන්ගෙන් සියයට 43 ක් මහ බැංකුවෙන් වූ අතර, සියයට 39 ක් වාණිජ බැංකු වලින් විය. සෙසු අය ප්‍රාදේශීය සංවර්ධන බැංකු, මූල්‍ය සමාගම්, අමාත්‍යාංශ සහ විශේෂිත බැංකු ඇතුලත් අනිකුත් මූල්‍ය අංශයේ ආයතන විය. අදළ කාලය තුළදී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ විශේෂ පුහුණු වැඩසටහන් 14 ක් පැවැත්වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙහෙයවූ අන්තර් ජාතික පුහුණු වැඩසටහන් දෙකක් සඳහාද අවශ්‍ය පහසුකම් හා සේවාවන් ලබා දී ඇත. මෙම පුහුණු වැඩසටහන් දෙක වූයේ 2000 වසරේ මැයි මස 22 සිට 24 දක්වා පැවැත්වුණු ණය අවදානම් කළමණාකරණය හා වත්කම් ගුණාංග පිළිබඳ සියැන්සා පුහුණු වැඩසටහන සහ අගෝස්තු මස 12 - 26 දින දක්වා පැවැත්වුණු 23 වැනි සියැන්සා මහ බැංකු පුහුණු වැඩසටහනයි.

2000 වසරේදී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය 413 දෙනෙකු සහභාගී වූ වැඩසටහන් 31 ක් මෙහෙයවමින් තොරතුරු තාක්ෂණය හා පරිගණක පුහුණු වැඩසටහන් සඳහා බැංකු සේවකයින්ට විශේෂ අවස්ථාවන් ලබා දුන් අතර, එයට සහභාගී වූවන්ගෙන් සියයට 81 ක් ම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් විය. පරිගණක මෘදුකාංග භාවිත පිළිබඳව වූ පැය 144 ක් ආවරණය කෙරුණු පුහුණු පාඨමාලා තුනක් ම බැංකුවට අළුතින් බඳවා ගනු ලැබූ මාණ්ඩලික නිලධාරීන් සඳහා විය. බොහොමයක පුහුණු කාලය පැය 60 කි.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ මගින් වාණිජ බැංකු කටයුතු, බැංකු කටයුතු අධීක්ෂණ හා පාලනය, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපළ, ග්‍රාමීය බැංකු කටයුතු හා නිපුණතා වැඩි දියුණු කිරීම යන විෂයයන් ආවරණය විය. වාණිජ බැංකු කටයුතුවලට සම්බන්ධ විෂයයන් ආවරණය කෙරෙන පරිදි පුහුණුලාභීන් 357 ක් සහභාගී වූ පාඨමාලා 14 ක් පැවැත්විය. ඒ අතරින් වඩාත් ජනප්‍රිය අංශයන් වූයේ කුළී පිට මිලදී ගැණුම් හා කල් බදු, සුරැකුම් හා අදළ ලියකියවිලි පිළිබඳ නීති, සුරැකුම් හා බැඳුනු නීතිමය ක්‍රියාපටිපාටිය, සක්‍රීය ණය පාලනය, මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා බැංකු ශේෂ පත්‍රය අවබෝධ කර ගැනීම යන විෂයයන්ය. බැංකු අධීක්ෂණය හා පරිපාලනය යන විෂයය යටතේ පැවැත්වුණු සම්මන්ත්‍රණ සඳහා විශේෂයෙන්ම වාණිජ බැංකු වලින් 199 දෙනෙකු සහභාගී විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු මූල්‍ය වංචා වැළැක්වීම, පරිගණක වංචා මැඩලීම, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, මුදල් විශුද්ධිකරණය, බැංකුවල තොරතුරු කළමනාකරණය හා අභ්‍යන්තර පරිපාලන ක්‍රම, ණය අවදනම් කළමනාකරණය හා බැංකු ක්ෂේත්‍රයේ දුර්වලතා යන සම්මන්ත්‍රණවලට සහභාගී විය. මීට අමතරව මහ බැංකු උපදේශකයන් විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 06 ක් බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ පැවැත්විය. වත්කම් කළමනාකරණය, රාජ්‍ය ණය සුරැකුම් වෙළඳපොළ, කොළඹ කොටස් වෙළඳපළ, පොළී අනුපාත ව්‍යුහයෙහි සාධකයන්හි ප්‍රවණතා හා අපේක්ෂාවන් යන සම්මන්ත්‍රණ වාණිජ බැංකු පුහුණුලාභීන් අතර වඩාත් ජනප්‍රිය වූ පාඨමාලා විය.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් තෙවන වරටත් වාණිජ බැංකු කටයුතු හා මහ බැංකු කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලැබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණු පාඨමාලා මහ බැංකු සේවකයින්ට පමණක් සීමා විය. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය වාර්තා ලිවීම, කාර්යාල කළමනාකරණය හා ක්‍රියා පටිපාටිය යන නිපුනතා සංවර්ධන වැඩසටහන් හා අනිකුත් මූලික පදනම් පාඨමාලාවන්ද පවත්වනු ලැබූ අතර, මේවායින් සමහර පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් මහ බැංකු සේවකයින් සඳහා විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකු සඳහා විශේෂයෙන් සැළසුම් කළ පුහුණු වැඩසටහන් 3 ක් පැවැත්වූ අතර, ඒ සඳහා නිලධාරීන් 50 දෙනෙකු සහභාගී විය.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය පළමු වරට ප්‍රාග්ධන ගිණුම් නිදහස් කිරීම : වර්තමාන ප්‍රවනතා රාජ්‍ය පාලනය අවබෝධ කර ගැනීම, ශ්‍රී ලංකාවේ සංගමික ණයකර සුරැකුම්පත් වෙළඳපළ සහ නව ජාත්‍යන්තර වෙළඳ වාතාවරණය තුළ අපනයන මූල්‍යකරණය යන මාතෘකා යටතේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ වැඩසටහන් මාලාවක් මෙහෙයවනු ලැබිණි. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මෙහෙයවන ලද අනෙකුත් පුහුණු වැඩසටහන් කිහිපයකි. මහ බැංකු නිලධාරීන් 270 දෙනෙකු සහභාගී වූ අන්තර්ජාල විද්‍යුත් තැපැල් පුහුණු වැඩසටහන, මහ බැංකුවට අළුතින් බඳවා ගන්නා ලද මාණ්ඩලික නිලධාරීන් 60 කට කරන ලද සමාරම්භක වැඩසටහන, දෙවන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරීන් 54 දෙනෙකු සහභාගී වූ විශේෂ පුහුණු වැඩසටහන, ප්‍රාථමික තරඟකරුවන් විසින් සංවිධානය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳ අවබෝධයක් ලබා දීමේ වැඩසටහන, විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද බලය ලත් තැරැව්කරුවන් විසින් විදේශ විනිමය විකිණීම හා මිලදී ගැනීම පිළිබඳ පුහුණු සටහන සහ නීතිය හා කාර්යාල කටයුතු පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් සමාරම්භක වැඩසටහන යන පුහුණු වැඩසටහන් ඒ අතර විය.

නව අදහස් ප්‍රචලිත කිරීමට හා ආර්ථික හා මූල්‍ය අංශයන්හි ඇති වන වෙනස්කම් පිළිබඳ අදළ අංශයන්හි නිපුනතා ඇති අයට හා වෘත්තිකයනට අදහස් හුවමාරු කර ගැනීමට දෙදහස වර්ෂයේදී සමරු දේශන හතරක් පවත්වනු ලැබිණ. ඒවා නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආර්.ඒ.ජයතිස්ස මහතා විසින් 2000 අයවැය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන බලාපොරොත්තු යන මැයෙන් කරන ලද නිදහස් සමරු දේශනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ජ්‍යෙෂ්ඨ නේවාසික නියෝජිත ආචාර්ය නදීම් උල් හක් මහතා සංවර්ධනය වන ආර්ථිකයන්හි මූල්‍ය වෙළඳපළ සංවර්ධනය යන මැයෙන් පවත්වන ලද ජනරජ සමරු දේශණය, වොෂිංටනයේ ජාත්‍යන්තර ආර්ථික කටයුතු පිළිබඳ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජික හා ලෝක බැංකුවේ ආසියාතු කලාපයේ හිටපු ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥ ආචාර්ය ජෝන් විලියම්සන් මහතා මූල්‍ය අර්බුද වැළැක්වීම හා කළමනාකරණයේදී ලෝක බැංකුව යන මැයෙන් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ 50 වන සමරු දේශනය, ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිසමෙහි අධ්‍යක්ෂ ජනරාල් වරයා වන ආචාර්ය ඩී.සී.ජයසූරිය මහතා විසින් " මුදල් විශුද්ධිකරණය විධිමත්

කිරීම ලෝක ගැටළුවකට නව අභියෝගයක් " යන මැයෙන් කරන ලද බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ 19 වන සමරු දේශනය විය.

වර්තන ආර්ථික ප්‍රතිපත්ති හා ප්‍රවනතා පිළිබඳ මහජන අවබෝධය ඇති කිරීම සඳහා දෙදහස වර්ෂයේදී ප්‍රසිද්ධ දේශන 6 ක් පවත්වනු ලැබිණ. ඒ ඒ දේශනයන්හි මාතෘකා හා දේශකයන් පහත දක්වේ.

1. ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳ ලන්ඩන් සරසවියේ ආර්ථික විද්‍යා පිළිබඳ මහාචාර්ය වරයා හා ලෝක කටයුතු පිළිබඳ අධ්‍යයන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල් වරයා වූ ලෝර්ඩ් දේශායි මහතා විසින් පවත්වන ලද දකුණු ආසියාවේ ආර්ථික ගැටළු පිළිබඳ දේශනය.

2. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්‍ෂ මහාචාර්ය සමන් කැලේගම මහතා විසින් පවත්වන ලද " ලෝක වෙළඳ සංවිධානය හා ජාත්‍යන්තර වෙළඳාමේදී මතු වන ගැටළු" පිළිබඳ දේශනය

3. එක්සත් රාජධානියේ බාත් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය අනිල් මාර්කන්ඩියා විසින් කරන ලද "දරිද්‍රතාවයට හේතු හා පරිසරය" පිළිබඳ දේශනය

4. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥ ආචාර්ය එච්.එම්.තේනුවර මහතා විසින් කරන ලද " ශ්‍රී ලංකාවේ විනිමය අනුපාත විචලතා" පිළිබඳ දේශනය

5. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ඒ.ජී.ඩබ්.නානායක්කාර මහතා " ශ්‍රී ලංකාවේ ජීවන වියදම මනින්නේ කෙසේද" මැයෙන් කරන ලද දේශනය

6. ඩෆ් හා පෙල්ප්ස් ණය රේටින් ලංකා ආයතනයේ කළමනාකාර අධ්‍යක්‍ෂ රවි අබේසූරිය මහතා විසින් කරන ලද " ඔබේ ඉතුරුම් ඔබට වැඩදයක ලෙස යොදා ගන්නේ කෙසේද" මැයෙන් කරන ලද දේශනය

**II - 27 සංඛ්‍යා සටහන**

**බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් 1999 සහ 2000 වර්ෂවල සපයන ලද පුහුණු පාඨමාලාවන්**

| පුහුණු පාඨමාලා වර්ග | 2000 | | | | | 1999 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාඨමාලා ගණන | ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු ලාභීන් | අනිකුත් පුහුණු ලාභීන් | පුහුණු ලාභීන්ගේ මුළු ගණන | පුහුණු පැය ගණන | පාඨමාලා ගණන | ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු ලාභීන් | අනිකුත් පුහුණු ලාභීන් | පුහුණු ලාභීන්ගේ මුළු ගණන | පුහුණු පැය ගණන |
| 1. තොරතුරු තාක්ෂණ හා පරිගණක පුහුණු පාඨමාලා | 31 | 333 | 80 | 413 | 1,524 | 16 | 186 | 39 | 225 | 1,164 |
| 2. වාණිජ බැංකු කටයුතු | 14 | 57 | 300 | 357 | 444 | 12 | 37 | 279 | 316 | 381 |
| 3. වණික් හා ආයෝජන බැංකු කටයුතු | - | - | - | - | - | 1 | 5 | 22 | 27 | 18 |
| 4. මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපොළ | 3 | 19 | 68 | 87 | 48 | 3 | 22 | 43 | 65 | 60 |
| 5. මහ බැංකු කටයුතු | 4 | 20 | 61 | 81 | 114 | 4 | 18 | 87 | 105 | 105 |
| 6. බැංකු අධීක්ෂණය හා පරිපාලනය | 7 | 39 | 160 | 199 | 90 | 8 | 105 | 130 | 235 | 138 |
| 7. මූල්‍ය අංශය : කුසලතා සංවර්ධනය | 8 | 115 | 24 | 139 | 270 | 15 | 411 | 5 | 416 | 204 |
| 7.1 ප්‍රාථමික අදියර | 3 | 37 | 7 | 44 | 42 | 10 | 307 | 2 | 309 | 126 |
| 7.2 මධ්‍යම අදියර | 5 | 78 | 17 | 95 | 228 | 4 | 59 | 3 | 62 | 66 |
| 7.3 ඉහළ අදියර | - | - | - | - | - | 1 | 45 | - | 45 | 12 |
| 8. දින දර්ශණයේ සඳහන් වෙනත් පුහුණු මාඨමාලාවන් | 9 | 47 | 150 | 197 | 180 | - | - | - | - | - |
| 8.1 ග්‍රාමීය බැංකු කටයුතු | 3 | 0 | 50 | 50 | 120 | - | - | - | - | - |
| 8.2 ඉහළ කළමනාකරණය | 4 | 22 | 85 | 107 | 36 | - | - | - | - | - |
| 8.3 වෙනත් | 2 | 25 | 15 | 40 | 24 | - | - | - | - | - |
| 9. විශේෂ පාඨමාලා සහ වෙනත් පාඨමාලා | 14 | 474 | 318 | 792 | 298 | 16 | 140 | 313 | 453 | 321 |
| 9.1 උපදේශකයන් විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා පැවැත්වුණු පාඨමාලාව | 6 | 73 | 0 | 73 | 138 | 7 | 68 | - | 68 | 171 |
| 9.2 ජාත්‍යන්තර පාඨමාලා | 2 | 16 | 30 | 46 | 42 | 1 | 5 | 14 | 19 | 18 |
| 9.3 වෙනත් | 6 | 385 | 288 | 673 | 118 | 8 | 67 | 299 | 366 | 132 |
| **එකතුව** | **90** | **1,104** | **1,161** | **2,265** | **2968** | **75** | **924** | **918** | **1,842** | **2,391** |
| 10. ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ/සැමරුම් දේශන | 10 | | | 2,000 | 15 | 9 | | | 1,800 | 13.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන 27 මගින් 1999 හා 2000 වර්ෂයෙහි බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ වර්ගීකරණයන් දක්වෙයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින් 72 ක් තම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුනතාවය වැඩි කර ගැනීම සඳහා ඉංග්‍රීසි පිළිබඳ ස්වයං අධ්‍යයන මධ්‍යස්ථානය භාවිතා කරනු ලැබිණ. ඒ සඳහා මධ්‍යස්ථානයේ ඇති පහසුකම්වලට අමතරව අදහස් හුවමාරුව හා වාර්තා ලිවීම පිළිබඳ පංති පවත්වනු ලැබිණ.

## ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව මගින් බැංකුවේ වැඩ කටයුතු පහසු කිරීම පිණිස මුල්‍ය, සැපයුම්, අභ්‍යන්තර හා විදේශ ගමන් සහ අනෙකුත් විවිධ සේවාවන්. සැපයීම නොකඩවා ක්‍රියාත්මක කෙරිණ.

2000 වසර තුල ලේකම් දෙපාර්තමේන්තුව විසින් වියදම් පරිපාලනය පිළිබඳ අදල නිසි උපදෙස් නිකුත් කිරීම මගින්, දෙපාර්තමේන්තු වල වියදම් පිළිබඳ ස්වයං පාලනයක් පවත්වාගෙන යාමේ ක්‍රමය නව දුරටත් ශක්තිමත් කරන ලදී. මේවා හඳුන්වා දෙනු ලැබුවේ බැංකුවේ විස්තෘත ආයතනික සැලසුම් රාමුව ඇතුලත දැඩි මුල්‍ය පාලනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන අයවැය සැලසුමට අනුපූරක වශයෙනි.

2000 වසර තුල බැංකුවේ සේව්‍ය සේවක සුහදතාවයේ කැපී පෙනෙන වර්ධනයක් ඇති විය. බැංකුවේ වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සැළකිය යුතු ප්‍රමාණයකින් සේවක වැටුප් සහ ප්‍රතිලාභ වැඩි කර ගැනීමට අවස්ථාව ලැබු අතර, බැංකුව සහ සියළු වෘත්තීය සමිති අතර වසර 2000 ජනවාරි 1 වැනි දින සිට 2002 අවසානය දක්වා වූ කාලය සඳහා සාමූහික ගිවිසුමකට එළැඹීමට ද හැකි විය.

## නීති

බැංකුවේ නීති කාර්යයන්හිදී උපදෙස් දීම, උසාවියේදී හා වෙනත් නීති කෘත්‍යයන්හිදී බැංකුව නියෝජනය කිරීම සහ බැංකු හා මූල්‍ය අංශයේ නීති සංවර්ධනය සඳහා දයක වීම යනුවෙන් නීති දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල්ව වර්ග කළහැක.

පෙර වර්ෂවලදී මෙන්ම නීති දෙපාර්තමේන්තුව බැංකුවේ අනිකුත් දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් සපයන ලද අතර, මුදල් මණ්ඩලය සහ එහි නිලධාරීන් පාර්ශවකරුවන් වන නීති කෘත්‍යවලදී නීති උපදේශකයන්ට අවශ්‍ය උපදෙස් සැපයීම කරනු ලැබිය. 1949 අංක 58 දරණ මුදල් නීති පනත, 1988 අංක 30 දරණ බැංකු පනත හා මූල්‍ය ආයතන වලින් ණය ආපසු අය කර ගැනීම සම්බන්ධ නීති සඳහා වූ යෝජිත සංශෝධන 2000 වසරේදී කරන ලද වැදගත් නීති ප්‍රතිසංස්කරණ කටයුතු ලෙස දක්විය හැක.

## පරිශ්‍ර

කුලියට ගෙන තිබූ සහ මහ බැංකුවට අයත් අනිකුත් පරිශ්‍රයන්හි මූලික නඩත්තු කටයුතු සහ ඒවා පවත්වාගෙන යාමේ කටයුතුවල පරිශ්‍ර දෙපාර්තමේන්තුව 2000 වර්ෂය තුළදී තවදුරටත් නිරත විය. මීට අමතරව, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අවශ්‍ය ප්‍රවාහන සහ පණිවුඩ හුවමාරු පහසුකම් වැනි උපකාරක සේවා සැපයීමද දෙපාර්තමේන්තුව විසින් දිගටම කරගෙන යන ලදී.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ උපදෙස් යටතේ වැතම් වීදියේ පිහිටි ප්‍රදීපාගාර ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂය තුළදී අවසන් කරන ලදී. නවීන තාක්‍ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ තාක්‍ෂණික සහාය ඇතිව, දන්නෝ බුදුන්ගේ නැමැති ප්‍රසිද්ධ ගීතය අනුව වේලාව දක්වෙන නාද ක්‍රමයක් ඔරලෝසු කණුවට සවි කරන ලදී.

## නව ගොඩනැගිලි

මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිල්ල ඉදි කිරීම හා ආපදවට පත් වූ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ගැන කටයුතු සොයා බැලීම හා අධීක්‍ෂණය කිරීම යන ද්විත්ව කාර්යයන් කිරීම සඳහා 1997 නොවැම්බර් මස 18 වැනි දින නව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

### මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිල්ල

1999 වර්ෂය අවසාන වනවිට ව්‍යාප්ත ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු නිම කරන ලදී. වාම් උත්සවයකින් පසු නව ගොඩනැගිල්ලට පිවිසීමේ කටයුතු අදියරෙන් අදියරට සිදු විය. 2000 වර්ෂයේ අගෝස්තු 27 දිනට යෙදුන මහ බැංකුවේ ස්වර්ණ ජයන්ති උළෙලේදී ශ්‍රී ලංකා ජනාධිපතිනි හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය අති ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසින් එය නිල වශයෙන් විවෘත කරන ලදී.

වර්ෂය තුළදී, මහ බැංකු සේවකයන් හට වඩා ආරක්ෂිත සහ ප්‍රසන්න රාජකාරී පසුබිමක් සකසා දීම සඳහා, දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. එම කායභීයන් අතර බැංකු පරිශ්‍රයේ ස්වභාවික පරිසරයක් ඇති කිරීම, ආරක්ෂක වැටක් ඉදි කිරීම හා කාර්යාලයන්ට අවශ්‍ය අනෙකුත් අංගෝපාංග සැපයීම යනාදී කටයුතු සිදු විය.

දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටද, අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටද වෙනත් සමහර නිලධාරීන්ටද නව ගෘහ භාණ්ඩ සපයන ලදී. එසේම බැංකු කටයුතු, ආර්ථික පර්යේෂණ හා තොරතුරු තාක්‍ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ භාවිතය සඳහා ප්‍රමිතිකරණ ලද කොටස් වශයෙන් වූ ගෘහ භාණ්ඩ

ඇණවුම් කරන ලදී. අනෙකුත් දෙපාර්තමේන්තුවලට මේ හා සමාන ගෘහ භාණ්ඩ ලබා දෙනු ඇත.

කාර්යක්ෂමව හා අඛණ්ඩව ගොඩනැගිල්ලේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා ජර්මනියේ සඩ් එට්නාවර්ක් ජී.එම්.බී.එච්. සමාගම සමග යාන්ත්‍රික සේවාවන්හි නඩත්තු කටයුතු කිරීමට 2000 ඔක්තෝබර් මස සිට අවුරුද්දක කාලයක් සඳහා වලංගු ගිවිසුමක් අත්සන් කරන ලදී.

## ආපදාවට පත් වූ මහ බැංකු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම

1997 දෙසැම්බර් මස ආරම්භ කරන ලද ආපදාවට පත් වූ මහ බැංකු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු වසර තුළදී තවදුරටත් කරගෙන යන ලදී. වසර 2000 මැද භාගයේදී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණද අනපේක්ෂිත තත්ත්වයන් නිසා ඉදි කිරීම් කටයුතු පමා කිරීමට සිදු වූ අතර 2001 මැද භාගයේදී මෙම ව්‍යාපාතිය නිම කිරීමට අපේක්ෂා කෙරේ.

අංග සම්පූර්ණ පහසුකම් සහිත වූ සම්මන්ත්‍රණ ශාලාවක් ගොඩ නැගීමට අදාළ අමතර වැඩ කටයුතු සහ සැළසුම් වෙනස් කිරීමද ගොඩනැගිල්ලේ කටයුතු ප්‍රමාද වීමට හේතු විය.

## මෝටර් රථ ගාලක් ඉදි කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් පර්චස් 140 ක් වූ බිම් ප්‍රමාණයක් රුපියල් දශ ලක්ෂ 113 කට 99 අවුරුදු බද්දකට කල්බදු ක්‍රමයට ලබා ගන්නා ලදී. 2000.10.27 දින භුක්තිය පවරා ගැනීමෙන් පසුව, ව්‍යාපෘතියෙහි ප්‍රථම අදියර ලෙස, ඉඩම පිරිසිදු කොට ගාල් කිරීම සඳහා බිම සකස් කරන ලදී. මහල් සහිත මෝටර් රථ ගාලක් සැලසුම් කිරීමේ කාර්‍යයෙහි සහ එය ගොඩ නැගීමට අවශ්‍ය නීතිමය හා අනෙකුත් අවසරයන් ලබා ගැනීමේ කාර්‍යයන් පිළිබඳව දෙපාර්තමේන්තුව දැනට කටයුතු කරමින් සිටී.

## ආරක්ෂක සේවා

2000 වර්ෂයේ ආරම්භයත් සමග ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ස්ථානගත කර තිබුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම දෙපාර්තමේන්තු, ජනාධිපති මාවතේ ඉදි කළ නව ගොඩනැගිල්ල වෙත ගෙන එන ලදී.

මෙම නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ආරක්ෂක පද්ධතීන් ක්‍රියාත්මක කරවීම සඳහා ආරක්ෂක නිලධාරීන් පුහුණු කරවීමට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමත් විය.

මීට අමතරව සියළුම ආරක්ෂක නිලධාරීන් ගිනි නිවීම් හා ගිනි අවි පරිහරණය සඳහා පුහුණු කරවනු ලැබීය. වර්ෂය තුළදී ජීව උණ්ඩ වෙඩි තැබීම් අභ්‍යාසද පවත්වනු ලැබීය.

සැළකිල්ලට ගනු ලබන කාලයන් තුළදී බැංකුවේ සියළුම පරිශ්‍රයන්ට ආරක්ෂාව සපයන ලදී. ප්‍රාදේශීය කාර්යාලයන්ට හා අනෙකුත් ස්ථානවලට මුදල් ප්‍රවාහන කටයුතු හා ඉදි කිරීම් වැඩ බිම්වලට ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදීද ආරක්ෂාව සපයන ලදී.

රජයේ ආරක්ෂක ආයතන හා බුද්ධි අංශය සමග ඉතා ආසන්නව කටයුතු කරමින් බැංකුවේ ආරක්ෂාව සඳහා අවශ්‍ය ආරක්ෂක පියවරයන් ගන්නා ලදී.

## ප්‍රවෘත්ති

තොරතුරු එක් රැස් කරන සහ බැංකු කාර්ය මණ්ඩලය අතර හා මහජනතාව අතර විවිධ මාධ්‍ය ඔස්සේ තොරතුරු බෙද හරින මධ්‍යම තොරතුරු ඒකකය ලෙස දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් අඛණ්ඩව සිය කටයුතු කරගෙන යන ලදී.

බැංකුව තුළ කළමනාකරණ හා සාමාන්‍ය තොරතුරු බෙද හැරීම සඳහා වසර පුරා අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශය නිකුත් කර ඇත.

එමෙන්ම බාහිර ලෝකය වෙත තොරතුරු බෙද හරින්නෙකු ලෙස දෛනික විනිමය අනුපාත, ආර්ථික දර්ශක (සතිපතා හා මාසිකව), පාරිභෝගික මිල දර්ශක, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා රුපියල් ණය පිළිබඳව තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වෙත නිකුත් කරන ලදී. මේවාට අමතරව නිල පුවත් පත් නිවේදන සහ බැංකුවේ විවිධ කටයුතු ප්‍රචාරණයද දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

පසුගිය වසරෙහි මෙන්ම බැංකුව වෙනුවෙන් වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා ආර්ථිකය, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, මාසික විවරණිකා, Economic and Social Statistics of Sri Lanka ප්‍රකාශයට පත් කෙරිනි. එමෙන්ම මාණ්ඩලික පත්‍රිකා 2 ක් (25-26 වෙළුම සහ 27-28 වෙළුම) ද Consumer Finance and Socio Economic Survey 1996/97 (Part II) සහ Sri Lanka Economy - 1999 and Medium Term Prospects යන ප්‍රකාශනද නිකුත් කර ඇත.

සටහන මාසිකය සහ News Survey ද්වි මාසිකය ද දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අනෙක් ප්‍රකාශන වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි 50 වන සංවත්සරය සනිටුහන් කරමින් History of Coins and Currency of Sri Lanka නැමැති පොතක් ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකුවෙහි කටයුතු අළලා " පහන් තරුව " නමින් අධ්‍යාපනික වාර්තා චිත්‍රපටයක් වැඩසටහනක්ද නිපදවන ලදී.

බැංකුවෙහි මුද්‍රණ අවශ්‍යතාවන්ගෙන් වැඩි කොටසක් සපුරාලීම තවදුරටත් බැංකු මුද්‍රාණාලය මගින් සිදු කර ඇත.

ඉහත සඳහන් කරන ලද ප්‍රකාශන මුද්‍රණය හැරුණුවිට මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් Trends in Public Finance ප්‍රකාශනයද මුද්‍රණය කරන ලදී. වසර තුළ බැංකුව වෙනුවෙන් ඡායාරූප සහ චිත්‍ර ශිල්ප සේවා සැපයීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

### පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය

තොරතුරු බෙදා හැරීමේ ලා වගකීම් දරන බැංකු පුස්තකාලය, පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය ලෙස නැවත නම් කරනු ලැබිනි. ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලය නැවත ගොඩ නැංවීම සඳහා අරමුදල් සැපයූ ලෝක බැංකු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ වූ ජාත්‍යන්තර සංවර්ධන අරමුදල් ව්‍යාපෘතිය, පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයෙහි කටයුතු ස්වයංකෘත බවට පත් කරමින් වසර තුළ සමාප්තියට පත් විය. මෙම ව්‍යාපෘතිය යටතේ " ජගත් ව්‍යාපාර වාර ප්‍රකාශණ" පිළිබඳ පර්‍යන මාත්‍රා මතක දත්ත ඇතුළත් සුසංහිත ඩිස්කයක් (CD - ROM) ද ප්‍රකාශන ගොනුවට එක් වූ අතර පුස්තකාල කාර්ය මණ්ඩලයට වෙනත් රටවල මහ බැංකු පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයන්හි වර්තමාන ප්‍රගතීන් පිළිබඳ පුහුණුවක්ද ලබා දෙන ලදී.

වසර තුළ පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් කාලීන ලිපි තොරතුරු, වෙබ් අඩවි පිරික්සුම, නව පරිග්‍රහන ලැයිස්තු, කාලීන පටුන පිටු, ජාත්‍යන්තර සමත බැංකු විවරණය, වෙබ් අඩවි නාමාවලිය සහ ලොව පුරා මහ බැංකු කටයුතු පිළිබඳ තොරතුරු යන සැකසුම් අව පැතුරුම් ජාලය හරහා නිකුත් කිරීමද සිදු කරන ලදී. එමෙන්ම මහ බැංකු අව පැතුරුම් ජාලය (Online Public Access Catalogue) තුළ පුස්තකාල සම්භාරය පරිග්‍රහනය කිරීම සඳහා සුචි පහසුකම්ද සපයන ලදී.

පුස්තකාල හා තොරතුරු හුවමාරු මධ්‍යස්ථානය පොත් 9,040 කින්ද, වාර ප්‍රකාශන 494 කින්ද, CD - ROMs 680 කින්ද සමන්විත විය.

## තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, බැංකුව සතුව තිබෙන පරිගණක පද්ධතීන් කළමනාකරණය, මෙහෙයවීම හා සංවර්ධනය කිරීමට සම්බන්ධ වී සිටී. රට තුළ හා රටින් පිටත තොරතුරු තාක්ෂණයේ සිදු වන වර්ධනය ප්‍රතිචාර දක්වමින්, කාර්යක්ෂමතාවය වර්ධනය වන ආකාරයට හා ආයතනය පවත්වාගෙන යාමේ වියදම් අඩු වන අන්දමට මහ බැංකුවේ සේවක බලකායේ වැඩි පිරිසකට පරිගණක පසුබිමක් යටතේ කටයුතු කිරීමට හැකි වෙන පරිදි තොරතුරු තාක්ෂණ පහසුකම් පුළුල් කරන ලදී. වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු වී තිබුණේ මහ බැංකුවේ දීර්ඝකාලීන අපේක්ෂාවන් සැලකිල්ලට ගනිමින් නව තාක්ෂණය හඳුන්වා දීමට, පවතින පරිගණක පද්ධතිය නැවත සකස් කිරීමට හා කාර්ය මණ්ඩලය තොරතුරු තාක්ෂණයේ නිපුණත්වයෙන් උසස් මට්ටමකට ගෙන ඒමටය.

වසර තුළදී බැංකුව සතුව තිබුණ ඒඑස්/400 වර්ගයේ පරිගණක පද්ධතීන් ඉහළ මට්ටමට වැඩි දියුණු කරන ලදී. සැකසුම් හැකියාව අනුව ධාරිතාවය වැඩි කරන ලදී. ඉදිරි වසර 3 - 4 කාලය තුළදී අළුතින් හඳුන්වා දීමට අපේක්ෂා කරන නව පරිගණක යෙදවුම් දරීමට මෙන්ම දැනට තිබෙන පරිගණක යෙදවුම් පුළුල් කිරීමටද සරිලන පරිදි ප්‍රධාන දත්ත ගබඩාව හා ද්විතීය දත්ත ගබඩාව වැඩි දියුණු කර ඇත.

නව මහ බැංකු ගොඩනැගිල්ලේ ස්ථාපිත දෙපාර්තමේන්තු සතුව තිබෙන කුඩා පරිමාණ පරිගණක 250 ක් සම්බන්ධ කරමින් අව පැතුරුම් ජාලයක් සකස් කරන ලදී. උපරිම ක්‍රියාකාරිත්වය පිළිබඳ විශ්වාසදායකත්වය ඇති කිරීම සඳහා අන්තර් දෙපාර්තමේන්තු සම්බන්ධතාවය දෘශ්‍ය තන්තු රැහැන් මගින් සපයා දෙන ලදී. එකම දෙය කිහිප පලක කිරීමේ කාර්යය අඩු කරමින් දෙපාර්තමේන්තු අතර වඩා හොඳ තොරතුරු සැපයීමක් හා දත්ත හුවමාරු කර ගැනීමක් සඳහා දැන් අවපැතුරුම් ජාලය භාවිතා කරනු ලැබේ. අවපැතුරුම් ජාලයේ අතික් වාසිදායක ලක්ෂණයන් නම් ඒ මගින් (අ) වැදගත්කමින් වැඩි මෘදුකාංග හා ප්‍රත්‍යන්ත උපකරණ පාවිච්චි කරන්නන් විශාල ප්‍රමාණයකට පොදුවේ පාවිච්චි කිරීමට හැකි වීම (ආ) ඊමේල් මගින් පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීම වඩා විධිමත් වීම (ඇ) තොරතුරු ගොනු පසු පිටපත් තැබීම වඩා කාර්යක්ෂම වීම ආදිය වේ. අවපැතුරුම් ජාලය ස්ථාපනය කිරීමෙන් පසු " ලිබ්සිස් " ක්‍රමය වඩා ඵලදායී ලෙස පාවිච්චි කිරීම පහසු කරමින් විමර්ශනයට හා රැගෙන යාමට උවමනා පොත්පත් සෘජු සම්බන්ධතාව මගින් වෙන් කරවා ගැනීමට හැකි වී තිබේ. බැංකුව ඇතුළත මෙන්ම පිටස්තර ආයතන සමගද ඉක්මන් පහසු හා ලාභදායී තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාව ඇති කිරීම සඳහා නිලධාරීන්ට ඊමේල් පහසුකම් සපයනු ලබන අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ලැබෙන ලෙස අන්තර්ජාල පහසුකම් දීර්ඝ කරන ලදී.

වසර තුළදී සියළු වාණිජ බැංකු ප්‍රධාන කාර්යාල හා ප්‍රාථමික වෙළඳුන් ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධ කෙරෙන පුළුල් පැතුරුම් ජාලයක් ස්ථාපනය කර ක්‍රියාත්මක කරන ලදී. මෙම පුළුල් පැතුරුම් ජාලය නිසා බැංකුවලට හා ප්‍රාථමික වෙළඳුන්ට එකවිටම මහ බැංකුවේ ඒඑස්/400 පරිගණකය සමග තොරතුරු හුවමාරු කර ගැනීමට හැකි වී තිබේ. මේ අනුව විශාල වටිනාකමින් යුත් ගණුදෙනු, ආරක්ෂා සහිතව සෘජු සම්බන්ධතාවයෙන් ගණුදෙනු කරන හා ගණුදෙනු සිදු වන මොහොතේම මහ බැංකු පොත්වල එම ගණුදෙනු පියවීම තථ්‍ය කාලයේදීම සටහන් වෙන, නවීන ගෙවුම් ක්‍රමයක් වෙත යාමට අවශ්‍ය භෞතික යටිතල පහසුකම් සූදානම් වී තිබේ.

පුළුල් පැතුරුම් ජාලය දැන් පහත සඳහන් කටයුතු සඳහා යොදා ගැනෙනු ඇත.

* බැංකුවට ද්‍රවශීලතා කළමනාකරණයට අවශ්‍ය තොරතුරු මහ බැංකුව වෙත සැපයීම සඳහා.
* විවට වෙළඳ කටයුතු පවත්වාගෙන යාම සඳහා.

* රජයේ ණය සුරැකුම් නිකුත් කිරීම සඳහා කෙරෙන ප්‍රාථමික වෙන්දේසිය පවත්වාගෙන යාම සඳහා.

* වාණිජ බැංකුවල විදේශීය විනිමය ගණුදෙනුවලදී ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් අතර ද්විමාර්ග මිල නියම කිරීම සඳහා.

දෙපාර්තමේන්තුවේ, ඒඑස්/400 හා පෞද්ගලික පරිගණක සඳහා යෙදවුම් ගණනක් සකස් කිරීම දිගටම කරගෙන යන ලදී. ප්‍රාථමික වෙළඳුන් අතර සිදු කෙරෙන රජයේ ණය සුරැකුම්පත් වෙළඳම හා පියවීම සඳහා යොද ගන්නා මාර්ගගත පරිගණක යෙදවුමක් සකස් කර ඔවුන්ගේ භාණ්ඩාගාර කාර්යාලවල එය ස්ථාපිත කරන ලදී. ගණුදෙනුවකට සම්බන්ධ ප්‍රතිවිරුද්ධ පාක්ෂිකයන් සතුව සුරැකුම්පත් හා අරමුදල් තිබෙන අවස්ථාවේදී පමණක් ගණුදෙනු පියවීම සිදු වෙන, හාර දීමට එරෙහිව පියවීමේ ක්‍රියාදාමය, මේ ක්‍රමය මගින් පහසු කෙරෙනු ඇත. මෙම ක්‍රමය පුළුල් ලෙස පරීක්ෂණයට භාජනය කර තිබෙන අතර සමාන්තර ක්‍රියාත්මක කිරීම වර්ෂ 2001 අප්‍රේල් මාසයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

වඩා හොඳ ආරක්ෂාකාරී ලක්ෂණ හඳුන්වා දෙමින් හා මානව සහභාගිත්වය අඩු කිරීම සඳහා ක්‍රියාදාමයන් විධිමත් කරමින් නවීකරණය කිරීමේ අරමුණ ඇතිව, සේවක ගෙවීම් මොඩියුල පරීක්ෂා කරන ලදී. 2001 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා සේවක සුභසාධක ණය සැපයීම සඳහා නව ක්‍රමයක් සකස් කරන ලදී. ක්‍රියාත්මක කිරීම, කාර්යක්ෂමතාවය උසස් කිරීම සඳහා මෙන්ම අවශ්‍ය ආරක්ෂිත තත්ත්වයන්ට ගැලපෙන අන්දමට වැන්දඹු අනත්දරු ක්‍රමය පුළුල් ලෙස නවීකරණය කරන ලදී. සැලසුම් සමීක්ෂණය කිරීමෙන් පසු සේවක වැටුප් ගෙවීමේ නව ක්‍රමයක් සකස් කිරීමේ කටයුතු වර්ෂයේ සිව් වෙනි කාර්තුවේදී ආරම්භ කරන ලදී.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ "සුමක" ණය ක්‍රමය පරිගණකගත කරන ලදී. සේවක පැමිණීම්, නිවාඩු ලබා ගැනීම් හා ඒ හා සමාන වෙනත් තොරතුරු සකස් කිරීම සඳහා ඒඑස්/400 පසුබිම යටතේ මධ්‍යගත ක්‍රමයක් සංවර්ධනය කරන ලදී. මේ ක්‍රමය මගින් සේවක පැමිණීම් හා පිටවීම් සටහන් නිවාඩු, කෙටි නිවාඩු වාර්තා, අතිකාල හා සේවා මුර තොරතුරු වාර්තා කිරීම සඳහා මධ්‍යගත දත්ත සමුදයක් පවත්වාගෙන යනු ඇත. පරිපාලන කටයුතු සඳහා තම දෙපාර්තමේන්තුවලට සම්බන්ධ සේවකයින්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා ඒ ඒ දෙපාර්තමේන්තු මෙම මධ්‍යම දත්ත සමුදයට ප්‍රවේශ වෙනු ඇත. එක් එක් දෙපාර්තමේන්තු දනට මෙම කටයුතු පවත්වාගෙන යාම සඳහා අතින් සිදු කෙරෙන කාර්ය ප්‍රමාණය මෙම ක්‍රමය නිසා සැළකිය යුතු ලෙස අඩු වෙනු ඇත. මේ ක්‍රමයේ සමාන්තර ක්‍රියාත්මක කිරීම දන් සිදු වෙමින් පවතී.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ පරිගණක යෙදවුම් පද්ධතිය පවත්වාගෙන යාම දිගටම සිදු කළ අතර විමසුමට ලක් වූ වසර තුළදී තවදුරටත් සේ.අ.අ. කටයුතු ස්වයංකරණය කිරීමට භාර ගන්නා ලදී. ප්‍රතිලාභ ගෙවීමෙන් පසු සාමාජිකයන් වෙනුවෙන් ඉතිරි වෙන මුදල් ආපසු ගෙවීම්, ප්‍රතිලාභ ගෙවීම් ආපසු හරවා යැවීම්, බැංකු සැසඳුම් ක්‍රමය, දයක ගිණුම් ඒකාබද්ධ කිරීම, නිවාස ණය සහතික පත්‍ර මුද්‍රණය කිරීම හා ණය අයදුම්පත් මෙහෙයවීම, කාර්යාලය තුළ වාර්තා සංචලනය කිරීම වැනි කටයුතු පරිගණකගත කිරීම සඳහා පරිගණකගත කිරීමේ ව්‍යාපෘති ගණනාවක් දියත් කර, සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී. සේ.අ.අ. ආයෝජන කටයුතු පරිගණකගත කිරීමේ ක්‍රමයක් සකස් කිරීමට භාර ගන්නා ලද අතර මූලික පියවර ලෙස භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිළදී ගැනීම පරිගණකගත කරන ලදී. මෙය සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කර තිබෙන පරිගණක පද්ධතිය මුළුමණින් නඩත්තු කිරීමේ කටයුතුවලට අතිරේකව සිදු කරන ලද කාර්යයන් වේ.

ශ්‍රී ලංකා චෙක්පත් නිෂ්කාෂණාගාරය සම්ප්‍රදායානුකූලව අන්තර් බැංකු චෙක්පත් හුවමාරුව හා නිෂ්කාශණය දිගටම කරගෙන යන ලදී. 2000 වර්ෂය තුළදී නිෂ්කාශණය කරන ලද චෙක්පත් ප්‍රමාණය සියයට 5.8 කින් වැඩි වී එම සංඛ්‍යාව 34,561,846 ට ළඟා විය. මේ අතර එම වර්ෂය තුළදී නිෂ්කාශණය කරන ලද මුළු වටිනාකම රුපියල් බිලියන 9.23 ක් විය. ප්‍රධාන පරිගණකයේ ක්‍රියාකාරිත්වය හදිසි බිඳ වැටීමකදී හෝ විනාශයකදී ක්‍රියාත්මක වීම සඳහා fall back විභවයක් වශයෙන් දුරස්ථ ස්ථානයක උපස්ථ පරිගණයක් ක්‍රියාත්මක කිරීම ඇතුළු චෙක්පත් නිෂ්කාශණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වයේ විශ්වාසදායී භාවය වඩා ශක්තිමත් කිරීමේ තොරතුරු තාක්ෂණ උපක්‍රම තවදුරටත් ශක්තිමත් කරන ලදී.

මෑත වර්ෂවලදී ඇති වූ බලපෑම් අනුගමනය කරමින් වර්ෂය තුළදී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවුම් ක්‍රමය වේගයෙන් වැඩි වෙමින් සියයට 29.7 ක වර්ධනයක් වාර්තා කළේය. 1999 වර්ෂයේදී සිදු කළ රුපියල් බිලියන 43.9 ක ගණුදෙනු හා සසඳන කළ මෙම වර්ෂයේදී සිදු වූ අන්තර් බැංකු ගණුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 51.9 ක් විය. මෙම ගණුදෙනුවල සිදු වූ ශීඝ්‍ර වර්ධනය ගැන සැළකිල්ල යොමු කර ඒවා ක්‍රියාත්මක කිරීමට ගත වන කාලය අඩු කර ගැනීම සඳහා අන්තර් බැංකු ගණුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා යොද ගන්නා පරිගණක මෘදුකාංග නවීකරණය කිරීමට සිදු විය. මෙම මෘදුකාංග වර්ධනය කිරීමේ කටයුතු පුද්ගලික සමාගමක් වෙත පවරන ලදී. සමාගම් කිහිපයක් මගින් සන්නිවේදන සේවා සැපයීමෙන් හා බැංකු, තම බිල්පත් ක්‍රෙඩිට්කාඩ් ගෙවීම් ලබා ගැනීමට සම්බන්ධ වීමෙන්, දීර්ඝ කාලයක් තුළ බොහෝදුරට අක්‍රීය වී පැවති ඍජු හර හුවමාරු ක්‍රමයෙහි යම් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

## කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව (ක.වි.දෙ.) 2000 වසර සඳහා මුදල් මණ්ඩලය මගින් අනුමත කරන ලද වාර්ෂික විගණන වැඩසටහන සහ විගණන සැලැස්මට අනුකූලව වර්ෂය තුළදී මහ බැංකු කටයුතුවල

කාර්යක්ෂමතාවය, සැකසුරුවම සහ ඵලදායී බව වැඩි දියුණු කිරීමේ අරමුණින් යුතුව අභ්‍යන්තර විගණන සහ කළමනාකාරිත්ව සේවා කටයුතු ඉටු කරන ලදී.

මහ බැංකුවේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමට අදල සියළු ගෙවීම්, මහ බැංකු සේවකයින්ට කරන ලද සියළු ගෙවීම්, මහ බැංකු විශ්‍රාම වැටුප් අරමුදල, අර්ථසාධක අරමුදල, වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල් සහ මහ බැංකුවේ අනෙකුත් සුභසාධන යෝජනා ක්‍රමවලට අදළව ලේකම් හා සුභසාධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා සහ සේවය අවසන් කිරීම් සහ විශ්‍රාම යෑම් සම්බන්ධ මුදල් ආපසු ගෙවීම් පූර්ව විගණනයට භාජනය කරන ලදී. 2000.12.31 දිනට මහ බැංකු ශේෂ පත්‍රය, මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ සහ ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශනාගාරයේ ආදයම් වියදම් වාර්තා, කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමට පෙර විගණනයට ලක් කෙරිණි.

රියදුරන් වෙත කරන ලද අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් හා තාක්ෂණ ශ්‍රේණීන්හි සුළු සේවකයින්ගේ කාර්ය ඵලදායීතාව පිළිබඳව සිදු කළ විශේෂ අධ්‍යයනයන්ද ඇතුළුව කළමනාකාරිත්ව සේවා අංශය මගින් අධ්‍යයනයන් කිහිපයක් සිදු කරනු ලැබිණි.

## පුහුණු වැඩ කටයුතු

මූල්‍ය නීති පනතෙහි අංක 27 වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව එහි සේවකයන් සඳහා බැංකුවේ කටයුතුවලට අදළ විෂයයන් පිළිබඳව ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හිද පුහුණු කටයුතු දිරිමත් කිරීමත්, ඒ සඳහා මූල්‍ය පහසුකම් සැලසීමත් කරනු ලබයි. මානව සම්පත් සංවර්ධනයට අදළ කාර්යයන්හි නිරත වන ප්‍රධාන දෙපාර්තමේන්තු වලින් එකක් වන පුහුණු කටයුතු දෙපාර්තමේන්තුව විසින් වසර 2000 තුළදීද විවිධ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමත්, එම වැඩසටහන් තවදුරටත් ඉදිරියට ගෙන යාමත් සිදු කෙරින.

ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් සළකන කල ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හිද පිළිගත් විශ්ව විද්‍යාලයන්හි ආර්ථික විද්‍යාව සහ අනෙකුත් අදළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා කටයුතු සම්පාදනය කිරීම පුහුණු කටයුතුවලට අදළ වේ. විමසුමට භාජනය වන වසර තුළ ආර්ථික විද්‍යාව සහ මූල්‍ය කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අධ්‍යයනයන් සඳහා නිලධාරීන් දෙදෙනෙක් විදේශගත වූහ. මීට අමතරව නිලධාරීන් තිදෙනෙක් දේශීය හා විදේශීය විශ්ව විද්‍යාලයන්හි ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හැදෑරූහ. නිලධාරීන් දෙදෙනෙකු කොළඹ විශ්ව විද්‍යාලයයේ පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හදරන ලදී. මීට අමතරව, තවත් නිලධාරියෙක් කල්කටා ජාත්‍යන්තර සංඛ්‍යාන අධ්‍යයන කේන්ද්‍රයේ සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ඉන්දියාව බලා පිටත්ව ගියේය.

**II - 28 සංඛ්‍යා සටහන**
**නිලධාරීන් පුහුණු කිරීම් : පශ්චාත් උපාධි අධ්‍යයන**
**1999/2000**

| වර්ෂය | පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පිටත් වූ සංඛ්‍යාව | පශ්චාත් උපාධි අධ්‍යයනයෙන් පසු පැමිණි සංඛ්‍යාව | 1999 දෙසැ. 31 දිනට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියුක්තව සිටි සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | ආචාර්ය උපාධි | ශාස්ත්‍රපති/පශ්චාත් උපාධි ඩිප්ලෝමා |
| 1999 | 7 | 8 | 3 | 6/1 |
| 2000 | 6 | 7 | 3 | 10/4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2000 දෙසැම්බර් මස අවසානය වනවිට විදේශ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් ගණන දස දෙනෙකි. මෙම වසර තුළ නිලධාරීන් පස් දෙනෙක් විදේශ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස නිම කොට බැංකු සේවයට වාර්තා කළහ. 1999 සහ 2000 වර්ෂයන්හි පශ්චාත් උපාධි අධ්‍යයනයෙහි නිරත නිලධාරීන්ට අදළ තොරතුරු සංඛ්‍යා සටහන් අංක II-28 හි දක්වේ.

**II - 29 සංඛ්‍යා සටහන**
**නිලධාරීන් පුහුණු කිරීම්**
**කෙටිකාලීන පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ**
**1999/2000**

| දෙපාර්තමේන්තුව | පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | විදේශීය | | දේශීය (බැ.අ.කේ.මගින් පවත්වන ලද) | |
| | 1999 | 2000 | 1999 | 2000 |
| 1. බැංකු කටයුතු | 21 | 10 | 28 | 44 |
| 2. ආර්ථික පර්යේෂණ | 21 | 16 | 29 | 45 |
| 3. බැංකු අධීක්ෂණ | 20 | 14 | 104 | 87 |
| 4. තොරතුරු තාක්ෂණ | 15 | 04 | 12 | 46 |
| 5. ලේකම් | - | - | 32 | 54 |
| 6. සේවක අර්ථ සාධක අරමුදල් | 05 | 02 | 11 | 43 |
| 7. රාජ්‍ය ණය | 08 | 04 | 23 | 41 |
| 8. බැංකු සංවර්ධන(අ)* | 06 | 03 | 23 | 36 |
| 9. ග්‍රාමීය ණය | 06 | 07 | 24 | 25 |
| 10. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය | 02 | 04 | 06 | 12 |
| 11. ව්‍යවහාර මුදල් | 03 | 04 | 132 | 15 |
| 12. සංවර්ධන මුදල් | 02 | 01 | 10 | 19 |
| 13. ආයතන | 02 | - | 12 | 16 |
| 14. විනිමය පාලන | 03 | 06 | 08 | 19 |
| 15. මූල්‍ය වෙළඳපොළ | 01 | 01 | 02 | 03 |
| 16. කළමනාකාරිත්ව විගණන | 02 | 01 | 08 | 17 |
| 17. පරිග්‍ර | 01 | - | 08 | 09 |
| 18. සංඛ්‍යාන | 05 | 05 | 20 | 35 |
| 19. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 03 | 03 | 37 | 60 |
| 20. සුභසාධන | 01 | - | 11 | 18 |
| 21. පුහුණු වැඩකටයුතු | - | 01 | 04 | 05 |
| 22. ආරක්ෂක සේවා | - | - | 07 | 08 |
| 23. නව ගොඩනැගිලි | - | - | 02 | 11 |
| 24. නීති | - | 01 | 02 | 13 |
| 25. ප්‍රවෘත්ති (පුස්තකාලය ඇතුළුව) | - | 13 | 18 | 47 |
| එකතුව | 127 | 100 | 573 | 728 |
| පුහුණු කටයුතු සඳහා පිරිවැය (රු.දශලක්ෂ) | 24.1 | 12.7 | 2.8 | 3.9 |

*(අ) ප්‍රාදේශීය කාර්යාලද ඇතුළත්ව 2000 සැප්තැම්බර් මස සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුබද්ධ කරන ලදී.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සළකා බලන වසර තුළදී දේශීය මෙන්ම විදේශයන්හි කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා මහ බැංකු නිලධාරීහු රැසක් සහභාගී වූහ. මහ බැංකුවේ කටයුතුවලට අදළ ක්ෂේත්‍රයන්හි කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු මෙම පුහුණු වැඩසටහන්වලට ඇතුළත්ය. 2000 වසර තුළ විදේශයන්හි කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා සහභාගී වූ මුළු නිලධාරීන් ගණන 100 ක් වූ අතර මහ බැංකුවේ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් සංවිධානය කළ දේශීය පුහුණු පාඨමාලා 76 ක් සඳහා නිලධාරීන් 728 ක් සහභාගී වී ඇත. මෙම පුහුණු වැඩසටහන්වලට 2000 වසර තුළ සහභාගී වූ සේවක සංඛ්‍යාව 1999 වසරේ සංසන්දනාත්මක දත්තයන්ද සහිතව සංඛ්‍යා සටහන අංක II-29 හි දක්වේ.

පසුගිය වසර තුළදී නිලධාරීන් 54 දෙනෙක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එංගලන්ත බැංකුව, ෆෙඩරල් රිසර්ව් බැංකුව, ලෝක බැංකුව, ස්විස් ජාතික බැංකුව සහ සියැසන් කේන්ද්‍රය යනාදිය ඇතුළුව ප්‍රවීන දැනුමක් සහ පුළුල් අත්දැකීම් ලබා දෙන ජාත්‍යන්තර ආයතනවල පුහුණුව ලැබූහ.

## සුභසාධන

සුභසාධන දෙපාර්තමේන්තුව මගින් බැංකු කාර්ය මණ්ඩල සුභසාධන කටයුතුවල නියැලේ.

සුභසාධන දෙපාර්තමේන්තුව තවදුරටත් සේවකයන් සඳහා සහනදායී පොලී අනුපාතික යටතේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ අතර සේවකයන්ට මෙන්ම විශ්‍රාමිකයින් සඳහාද වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කෙරුණි.

නිවාස ණය පහසුකම් වැඩි කිරීමත් සමග බොහෝ සේවකයින් මෙම වසර තුළ නිවාස විස්තීරණ කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා තමන්ට වැඩි කළ පහසුකම් වලින් ප්‍රයෝජන ලබා ගන්නා ලදී.

සේවකයන් වෙනුවෙන් වෛද්‍ය උපදෙස් ලබා දීම සඳහා පූර්ණකාලීන වෛද්‍යවරයකු හා බෙහෙත් ද්‍රව්‍ය ලබා දීමට ගෘහස්ථ බෙහෙත් ශාලාවක් ඇතුළු මහ බැංකු වෛද්‍ය සායනය මගින් කාර්යාල වේලාවන් තුළදී සේවකයින්ට වෛද්‍ය පහසුකම් සපයන ලදී. ඊසීජී හා ව්‍යාධිවේදී වැනි පරීක්ෂණයන් සිදු කර ගැනීමට සේවකයින්ට හැකි වන පරිදි කාර්ය මණ්ඩලය හා අවශ්‍ය උපකරණ මෙම සායනය සතුව ඇත.

## කාර්ය මණ්ඩල පුවත්

ආයතන දෙපාර්තමේන්තුව සිය දර්ශනය සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගෙන තම කාර්ය භාරයන් සහ වගකීම් පැහැදිලිව අවබෝධ කර ගනිමින් ඒවා කාර්යක්ෂමව හා ඵලදායී අන්දමින් ඉටු කිරීමටත්, මතු විය හැකි අවශ්‍යතාවයන්ට හා අභියෝගයන්ට නොපැකිලව මුහුණ දීමටත් හැකි, සිය හැකියාවන් නියමාකාරයෙන් වර්ධනය කර ගන්නා දක්ෂ හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සඳහා 2000 වර්ෂය තුළදීත් සිය කාර්යයන් වන බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්වලට අදළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

2000 වසරේදී මාණ්ඩලික පංතිය සඳහා පිටතින් නිලධාරීන් 40 දෙනෙකු බඳවා ගත් අතර, බැංකු සේවාවේ සිටි මාණ්ඩලික සහකාර වරුන් 20 දෙනෙකු මාණ්ඩලික පංතියට උසස් කරන ලදී.

මහ බැංකු අධිපති ඒ.එස්.ජයවර්ධන මහතා 2000 වර්ෂය තුළදී පහත දක්වෙන රැස්වීම්වලට සහභාගී විය.

1. 2000 ජනවාරි 27 සිට 29 දක්වා මැලේසියාවේ ක්වාලාලම්පූර් නගරයේ පැවති 35 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු (සියැසන්) අධිපති වරුන්ගේ සමුළුව.
2. 2000 දී අප්‍රියෙල් 9 සිට 23 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නගරයේ පවත්වන ලද ජා.මු.අා. වසන්ත රැස්වීම (2000) සහ චිකාගෝ වෙළඳ මණ්ඩලය වෙත වූ නිල ගමන.
3. 2000 සැප්තැම්බර් 19 සිට 21 දක්වා මෝල්ටාවේ පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමති වරුන්ගේ රැස්වීම.
4. 2000 දෙසැම්බර් 17 සිට 19 දක්වා පැරිස් නුවර පැවති සංවර්ධන සමුළුව (ආධාර දෙන කණ්ඩායමේ රැස්වීම).

### බැංකු සංවර්ධන දෙපාර්තමේන්තු වැඩ කටයුතු නිමා කිරීම

මහ බැංකුවේ වැඩ කටයුතු තවදුරටත් විධිමත් කරලීමේ ක්‍රියාවලියේ පියවරක් වශයෙන් ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු හැර බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ රාජකාරී කටයුතු සියල්ල බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා දෙනු ලැබින. ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලදී. මේ අනුව, 2000 ජූලි මස 24 වැනි දින සිට බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු නිමාවට පත් විය.

### පත් කිරීම්

1. ආයතන අධ්‍යක්ෂ, බී.බෝයගොඩ මහතා 2000 මැයි මස 09 වැනි දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කර අධිපතිගේ සහකාර වශයෙන් නිල නම් කරන ලදී.

2. ප්‍රධාන ගණකාධිකාරී, එම්.බී.දිසානායක මහතා 2000 මැයි මස 09 වැනි දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කර අධිපතිගේ සහකාර වශයෙන් තිල නම් කරන ලදී.

3. ග්‍රාමීය ණය අධ්‍යක්ෂ හා වැඩ බලන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී ඩබ්.ඒ. විජේවර්ධන මහතා 2000 මැයි මස 09 වැනි දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කර අධිපතිගේ සහකාර වශයෙන් තිල නම් කරන ලදී. අනතුරුව 2000 ජූනි මස 20 වැනි දින සිට නියෝජ්‍ය අධිපති තනතුරට පත් කරන ලදී.

4. ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආර්.ඒ.ජයතිස්ස මහතා 2000 ජූනි මස 20 වැනි දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කර අධිපතිගේ සහකාර වශයෙන් තිල නම් කරන ලදී.

5. පහත සඳහන් නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කර ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වශයෙන් 2000 මැයි මස 09 වැනි දින සිට තිල නම් කරන ලදී.

   i) ආචාර්ය එන්.එල්.සිරිසේන, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍ර අධ්‍යක්ෂ

   ii) එම්.අයි.එෆ්.හමීඩ් මහතා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ

   iii) ටී.එස්.එන්.ප්‍රනාන්දු මහතා, ලේඛකාධිකාරී හා රාජ්‍ය ණය අධිකාරී

   iv) පී.ටී.සිරිසේන මහතා, මූල්‍ය වෙළඳපොළ අධ්‍යක්ෂ

   v) එම්.ආර්.ප්‍රනාන්දු මහතා, ව්‍යවහාර මුදල් අධිකාරී

   vi) ආචාර්ය එස්.එස්.කොළඹගේ, සංඛ්‍යාන අධ්‍යක්ෂ

   vii) කේ.සී.එම්.ගුණසේකර මහතා, පුහුණු වැඩ කටුයුතු අධ්‍යක්ෂ

6. අතිරේක සංඛ්‍යාන අධ්‍යක්ෂ පී.ඩී.ජේ.ප්‍රනාන්දු මහතා 2000 ජනවාරි මස 26 වැනි දින සිට තම රාජකාරිවලට අමතරව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. පසුව ඔහු 2000 මැයි මස 01 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ වශයෙන් පත් කරන ලදී.

7. 2000 මැයි මස 10 වැනි දින සිට පහත සඳහන් පත් කිරීම් සිදු කරන ලදී.

   i) එස්.රූපසිංහ මහතා, ආයතන අධ්‍යක්ෂ වශයෙන්,

   ii) එම්.එස්.සිරිපාල මහතා, කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ වශයෙන්,

   iii) වයි.එම්.ඩබ්.බී.වීරසේකර මහතා ප්‍රධාන ගණකාධිකාරී වශයෙන්,

   iv) සී.කේ.නානායක්කාර මිය., ග්‍රාමීය ණය අධ්‍යක්ෂ වශයෙන්,

   v) ඩබ්.එස්.එල්.ප්‍රනාන්දු මහතා, ලේකම් වශයෙන්,

   vi) පී.ටී.පෙරේරා මිය., සුභසාධන අධ්‍යක්ෂ වශයෙන්.

   vii) එම්.ඩී.ඩී.ගුණතිලක මහතා සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන්.

   viii) ආචාර්ය ඩී.එස්.විජේසිංහ අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්.

8. එන්.ජේ.පෙරේරා මයා., 2000 මැයි 10 වැනි දින සිට අතිරේක සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන් පත් කරන ලද අතර, ඉන් අනතුරුව, 2000 ජූලි මස 10 වැනි දින සිට වැඩ බලන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන්ද, 2000 අගෝස්තු මස 29 දින සිට සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී වශයෙන්ද පත් කරන ලදී.

9. ආචාර්ය අනිලා ඩී.බණ්ඩාරනායක මහත්මිය 2000 ජූනි 08 වැනි දින සිට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද අතර ඉන් අනතුරුව, 2000 අගෝස්තු 08 වැනි දින සිට අතිරේක සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන්ද, 2000 සැප්තැම්බර් මස 14 වැනි දින සිට වැඩ බලන සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන්ද, 2000 දෙසැම්බර් 14 වැනි දින සිට සංඛ්‍යාන අධ්‍යක්ෂ වශයෙන්ද පත් කරන ලදී.

10. පී.ටී.සිරිසේන මහතා 2000 අගෝස්තු 08 වැනි දින සිට තම රාජකාරී කටයුතුවලට අමතරව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

11. එල්.කේ.ගුණතිලක මහත්මිය සැප්තැම්බර් මස 20 වැනි දින සිට අතිරේක බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද අතර අනතුරුව, 2000 ඔක්තෝබර් 16 වැනි දින සිට වැඩ බලන බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

12. ආචාර්ය ඒ.ජී.කරුණාසේන 2000 නොවැම්බර් මස 10 වැනි දින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

## විශ්‍රාම ගැනීම්

1. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ එස්.එන්.ප්‍රනාන්දු මහත්මිය 2000 මැයි 01 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

2. වැඩ බලන අතිරේක ලේකම් ජේ.එල්.ටී.පීරිස් මහතා 2000 ජූනි 01 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

3. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සී.අයි.ප්‍රනාන්දු මිය. 2000 ජූනි 02 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

4. නියෝජ්‍ය අධිපති පී.අමරසිංහ මහතා 2000 ජූනි 14 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

5. නව ගොඩනැගිලි අධ්‍යක්ෂ ඒ.ආර්.ඒ. මිහිඳුකුලසූරිය මහතා 2000 ජූනි 28 වැනි දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී. 2000 ජූලි මස 03 වැනි දින සිට කොන්ත්‍රාත් පදනම මත ඔහු එම තනතුරට නැවත පත් කරන ලදී.

6. සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී, එම්.ඩී.ඩී.ගුණතිලක මහතා 2000 අගෝස්තු 29 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

7. සංඛ්‍යාන අධ්‍යක්ෂ, ආචාර්ය එස්.එස්.කොලඹගේ 2000 දෙසැම්බර් 14 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

8. අතිරේක බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ, එම්.ජී.සේනානායක මහතා 2000 දෙසැම්බර් 30 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

## මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

1. ආචාර්ය රාණි ජයමහ මහත්මිය ලන්ඩනයේ පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත,

2. එම්.ඒ.ආර්.සී.කුරේ මිය. රාජ්‍ය මූල්‍ය, ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත,

3. ආර්.ඒ.ජයතිස්ස මහතා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන්,

4. ආචාර්ය යූ.විදානපතිරණ, අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) වශයෙන් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත,

5. එම්.ජේ.එස්.අබේසිංහ මහතා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත,

6. ඒ.අබේරත්න මහතා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත,

7. පී.ජී.ජයතුංග මහතා, විදුලි හා බලශක්ති අමාත්‍යාංශය වෙත.

8. ආර්.අකුරුගොඩගමගේ මහතා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.